ශ්‍රී ලංකා

# ඉන්ටර්නැෂනල් ඇලර්ට් සංවිධානයේ ශ්‍රී ලාංකේය වැඩ සටහන ප්‍රතිපත්ති සටහන අංක: 1

ශ්‍රී ලංකා

මෙම ප්‍රකාශනයේ ඇතුළත් විශ්ලේෂණය හා අදහස්වලින් මතු සඳහන් ව්‍යාපෘතියේ සම්පත් දායකයන්ගේ මත හා ප්‍රතිපත්ති අනිවාර්යයෙන්ම පිළිබිඹු නොවේ, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් රාජධානියේ දෙපාර්තමේන්තුව: ආර්ථික සහයෝගය හා සංවර්ධනය සඳහා වූ ජර්මන් ෆෙඩරල් අමාත්‍යාංශය Gesellschaft für Technische Zusammenarbeit; එක්සත් ජනපද ආණ්ඩුවේ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ඒජන්සිය හා ඔස්ට්‍රේලියානු රජයේ ආධාර සංවිධානය. (AusAID)

**© ඉන්ටර්නැෂනල් ඇලර්ට් 2006**

පළමු පළකිරීම : ඉන්ටර්නැෂනල් ඇලර්ට් මගින්

සහයෝගය : සාමය සඳහා ව්‍යාපාර සන්ධානය
පළමුව ශ්‍රී ලංකා

ISBN : **955-8085-01-4**

සැලැස්ම හා සැකසුම : ජේ ඇන්ඩ් ජේ ඇඩ්වර්ටයිසිං (පුද්ගලික) සමාගම

මුද්‍රණය : ෆාස්ට් ප්‍රින්ට් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්

මෙය පළකිරීම සඳහා මුද්‍රණය සහයෝගය

**Australian Government**
**AusAID**

# ශ්‍රී ලංකාව: ව්‍යාපාරික අංශය සාමය සඳහා නියමුවෙක් වශයෙන්

# පටුන

සංඥාපනය

ඉන්ටර්නැෂනල් ඇලර්ට් 77

පළමුව ශ්‍රී ලංකා 79

සාමය සඳහා ව්‍යාපාර සන්ධානය 81

**හැඳින්වීම: සාමය ගොඩනැඟීම සඳහා ව්‍යාපාරික භූමිකාව 83**

**ශ්‍රී ලංකාව: ව්‍යාපාරික අංශය සාමය සඳහා නියමුවෙක් වශයෙන් 95**

1. හැඳින්වීම 95

2. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික අංශය හා සමාජය 105

3. සාමය ගොඩනැඟීම සඳහා වූ ව්‍යාපාරමය ආරම්භක පියවර 115

4. සමාප්තිය 121

ආශ්‍රිත ලිපි ලේඛන 127

අවසාන සටහන් 131

# සංක්ෂිප්තය

ඉන්ටර්නැෂනල් ඇලර්ට් යනු ලෝකයේ රටවල් හා ප්‍රදේශ 20කට වැඩි ගණනක් තුළ සාමය ගොඩනැගීමේ කටයුතුවල නියැලී සිටින එක්සත් රාජධානිය පාදක කොටගත් සංවිධානයකි. කල් පවත්නා සාමයක් ගොඩ නැගීමේලා ප්‍රතිපත්තිය හා ප්‍රායෝගික ව්‍යවහාරය යන දෙකම හැඩ ගැසීම පිණිස ගැටුම්වලට මුහුණ පාමින් සිටින අය සමග ඍජුවද රාජ්‍ය, යුරෝපා සංගමය හා එක්සත් ජාතීන්ගේ මට්ටම්වලද කටයුතු කරයි. අපේ කලාපීය කටයුතු සිදු වනුයේ අප්‍රිකාවේ මහාවිල් ආශ්‍රිත ප්‍රදේශ, බටහිර අප්‍රිකාව, කොකේසස්, දකුණු අමෙරිකාවේ ඇන්ඩීස් කලාපය, ශ්‍රී ලංකාව, නේපාලය හා පිලිපීනය යන රටවලය. කලාපීය හා ජාත්‍යන්තර මට්ටම්වලදී සාමයට අදාලව ව්‍යාපාරමය භූමිකාව මානව හිතවාදී ආධාර හා සංවර්ධනය ආරක්ෂාව හා ගැටුම්වලින් පසු නැවත ප්‍රතිනිර්මාණය පිළිබඳව පර්යේෂණද පවත්වන්නෙමු

යුද්ධය හෝ අස්ථාවරභාවය කොතැනක තිබුණත්, එය දේශීය පෞද්ගලික අංශය වෙත තදින් බලපායි. අඩු වී යන ආයෝජනය, හානියට පත්වන යටිතල ව්‍යුහය, ඍජු ප්‍රහාර අවස්ථා, සේවක පිරිස්, ප්‍රාග්ධනයට හා වෙළඳපලවල් වෙත පිවිසීමේ හැකියාව අහිමි වී යෑම, මෙන්ම ගැටුම් සහිත පරිසරයක් යටතේ කෙරෙන කටයුතු පිළිබඳ අනාවැකි පැවසීමට නොහැකි වීම හා ආශ්‍රිත පිරිවැය ආදිය අත්දැකීමට ඊට සිදු වේ. විදේශීය ආයෝජකයන් මෙන් තමන්ගේ ආයෝජන වෙනත් ස්ථානවලට ගෙන යෑමෙන් (ඊට) ප්‍රතිචාර දැක්වීමට දේශීය ව්‍යාපාරිකයන්ට බොහෝවිට නුපුළුවන.

මේ පිරිවැය හා අවශේෂ හේතු නිසා බොහෝවිට, සාමය ගොඩනැගීමේ කාර්යයට දායකවීම සඳහා ව්‍යාපාරිකයන් පෙළඹෙන බව ප්‍රාදේශීය ව්‍යාපාර, ප්‍රාදේශීය සාමය විසින් ප්‍රදර්ශනය කෙරේ. ඊටත් වඩා, සාමය ගොඩ නැගීමට අදාල කටයුතු රාශියක් සම්බන්ධයෙන් එසේ කිරීම සඳහා අවශ්‍ය වන සම්පත් කුසලතා හා හැකියාවන්ද ව්‍යාපාර සතු වේ. තමන්ගෙන්ම සමාජ තුළ ප්‍රතිඵල වෙත බලපෑම් කිරීම් සඳහා පුනර්ජීවනයක් ලත් ධෛර්යය හා ආභාෂය සොයා ගැනීම පිණිස ගැටුම් නිරාකරණය කිරීම සඳහා පෙළඹවූ ව්‍යාපාරයන් මගින් ලබාගෙන ඇති අති විශාල අත්දැකීම ආධාර වේයයි ඉන්ටර්නැෂනල් ඇලර්ට් බලාපොරොත්තු වෙයි.

සිංහලට හා දෙමළට පරිවර්තනය කර ඇති මෙම ප්‍රකාශනය වූ කලී විවිධ රටවල් 20 ක දේශීය පෞද්ගලික අංශය තුළ ඇති සාමය ගොඩ නැගීමේ විභවතාව පිළිබඳව 2004 දී ඉන්ටර්නැෂනල් ඇලර්ට් සංවිධානය විසින් දියත් කරන ලද වඩාත් පුළුල් පර්යේෂණ ව්‍යාපෘතියක ඇතුලත් ශ්‍රී ලංකාවට අදාල කොටසයි. දේශීය ව්‍යාපාර විසින් ගැටුම විවරණය කරන්නේ කෙසේද, එහි ප්‍රතිඵල අත්විඳින්නේ කෙසේදැයි ගවේෂණය කරන එම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාව තුළ සාමය ගොඩ නැගීම සඳහා පෞද්ගලික අංශය භූමිකාව පිළිබඳ දැක්මක්ද ඉදිරිපත් කරයි. මේ ප්‍රකාශනය භාෂා තුනෙන්ම පළ වී තිබේ. අදාළ තොරතුරු පැතිරවීම හා රටතුළ භාවිතය සඳහා කරුණු ඉදිරිපත් කිරීමට ආධාර වීම එහි අරමුණයි. මෙම පියවර අනුසාරයෙන් පර්යේෂණවල සොයා ගැනීම් වෙත පිවිසීමට සේම නිර්දේශ පිළිබඳව සංවාදයකට එළඹීමටද ශ්‍රී ලංකාව තුළ සිටින වඩාත් පුළුල් ජන සමූහයකට ඉඩ සැලසේයයි අපේක්ෂා කෙරේ.

ප්‍රචණ්ඩත්වය උග්‍ර වීමේ නැඹියාවක් ශ්‍රී ලංකාව තුළ පවත්නා හෙයින් සාමය ගොඩ නැගීම සඳහා උත්සාහ දැරීමේ කාර්යය ඉක්මන් කරවීමේ නව අවශ්‍යතාවක් පවතියි. ඕනෑම සන්දර්භයක් යටතේ සාමය ගොඩ නැගීම උදෙසා විවිධ ක්‍රියාකාරීන් හා උනන්දුවක් දක්වන්නන් අතර සහයෝගයක් හා ක්‍රමෝපායමය සන්ධානයන් අවශ්‍ය කෙරේ. දිගින් දිගටම පවත්නා ගැටුම දේශීය ව්‍යාපාර වෙත බලපෑම් දක්වන ආකාරයේ ස්වභාවය හා ප්‍රමාණය මෙම අධ්‍යයනට පෙන්වා දෙයි. පෞද්ගලික අංශය සඳහා වූ සුවිශේෂ නිර්දේශවලට අතිරේකව, සාම ක්‍රියාවලිය ගැන උනන්දු වන ප්‍රධාන ක්‍රියාකාරයකු වශයෙන් ව්‍යාපාරමය අංශය සමග සහයෝගයයෙන් යුතුව සෙසු අංශවලට කටයුතු කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳවද මේ ප්‍රකාශනය ගවේෂණය කරයි. අවසාන වශයෙන්, මෙම කෘතියේ මූල්ම අවස්ථාවල පටන් මූල්‍යමය හා විවිධාකාර සහාය සැපයුවාවූද මෙම කටයුත්ත සඳහා නැතිවම බැරි වූද ප්‍රාදේශීය සාමය ව්‍යාපෘතියේ සම්පත් දායකයන් වෙත ඇලර්ට්

සංවිධානය සිය ස්තූතිය පිරිනමයි. එම ආයතන මෙසේය: UK DFID; ආර්ථික සහයෝගය හා සංවර්ධනය සඳහා වූ ජර්මන් ෆෙඩරල් අමාත්‍යාංශය (BMZ); GTZ; හා US AID, ඊට අමතරව සංවිධානයක් වශයෙන් දිගින් දිගටම අපට කටයුතු කිරීමට ඉඩ සළසන අපගේ ප්‍රධාන සම්පත් දායකයන්ටද අපි ස්තූති කරමු, අයර්ලන්තයේ විදේශ කටයුතු දෙපාර්ථමේන්තුව (Irish Aid) ඩෙන්මාර්කයේ ජාත්‍යන්තර සංවර්ධනය ඒජන්සිය (Danida); UK DFID; පින්ලන්තයේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, නෙදර්ලන්තයේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය:SIDA; සහ සංවර්ධනය හා සහයෝගය පිළිබඳ ස්විස් ඒජන්සිය (SDL) ශ්‍රී ලංකාව තුළ මෙම පර්යේෂණය ව්‍යාප්ත කිරීමට ආධාර වූ AusAID සංවිදානයටද අපි කෘතඥවෙමු.

ආචාර්ය මර්කස් මේයර්<br>
නේවාසික නියෝජිත<br>
ඉන්ටර්නැෂනල් ඇලර්ට් - ශ්‍රී ලංකා

# පළමුව ශ්‍රී ලංකා වෙතින් - (Sri Lanka First)

වේගවත් අන්දමින් සමතුලිත සංවර්ධනයක් පවත්වා ගෙන යෑම තිරසාර සාමය සඳහා අවශ්‍ය කරන ප්‍රධාන සාධකය වේ. ආර්ථික අඩු ලුහුඬුකම් හා ජන කොටස් කොන් කර දැමීම පවත්නා විට ගැටුම් වර්ධනය වෙයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රචණ්ඩත්වය උග්‍රවෙයි. දිළිඳුකම වැඩි වෙයි. ශ්‍රී ලංකාව මීට නිදසුනකි.

නිදහස ලබා ගැනීමෙන් පසු පැවති දුබල සැලසුම්කරණය හා පටු දේශපාලන චින්තනය නිසා පැන නැගුණු දරුණු ජන වාර්ගික ගැටුම්වලින් විසි වසරකට වැඩි කාලයක් පුරා අපේ ජාතියට හානි පැමිණි තිබේ. ජනයාද භේද භින්නව සිටිති. දිළිඳුකම තුරන් කරමින් රටට අදාළ සිය සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට එකිනෙක පසුපස බලයට පත් ආණ්ඩු සංවිධාන අසමත් වී තිබේ.

නාම මාත්‍රව පවත්නේයයි සැලකිය යුතු සටන් විරාමයක් යටතේ, යළි එදිරිවාදිකම් ආරම්භ වැළැක්වීම සඳහා දරනු ලබන ප්‍රයත්නයක් වෙත පුද්ගලික අංශය විසින් දායක වීමේ හදිසි අවශ්‍යතාව දැන් ඉතා වැදගත් තත්වයකට එළඹ ඇත්තේය. එක්වන්ව කටයුතු කරමින්, සියලුම ජන ප්‍රජාවන්ගේ නෛතික අයිතිවාසිකම් හා අභිලාෂයන් තහවුරු කළ හැකි ව්‍යවස්ථාමය සංශෝධන ක්‍රියාවලියක් වෙත පියවර තැබීමේ අවශ්‍යතාව ගැන දකුණේ පක්ෂ සියල්ලම වෙත ව්‍යාපාර අංශය විසින් අවධාරණය කළ යුතු වේ.

සෙසු අංශ සමගද බෙදා හදා ගනු ලබන සාමය වෙත දැක්වෙන දැඩි කැපවීමක් සහිත අභිලාෂයක් පුද්ගලික අංශය සතුවෙයි. වේගවත් සංවර්ධනය, ජීවන තත්වයේ දියුණුව ඉහි කරන මානව දර්ශකයන් උසස් කරවීම පහසු කරවන සුලු සාමකාමී ස්ථාවර පරිසරය වඩාත් යහපත් අධ්‍යාපනයක් සහිත ශ්‍රම බලකාය හා වඩා හොඳ යටිතල පහසුකම් යන මේවායේ අවශ්‍යතාව ගැන අපි හොඳාකාර ලෙස වටහා ගෙන සිටිමු. එමගින් ව්‍යාපාරවල සශ්‍රීකත්වයට ඉඩ සැලසෙයි. යහපත් රැකියා අවස්ථා නිර්මාණය වෙයි. දිළිඳුකම හීන වෙයි. තිරසාර සමයද මනහර පුහු වාංමාලාවක් නොව යථාර්ථයක් වෙයි.

උනන්දුවක් දක්වන ප්‍රධාන පාර්ශවයක් ලෙස තමන් විසින් සපුරාලිය යුතු වැදගත් භූමිකාවක් තිබේයයි පෞද්ගලික අංශය තුළ විශ්වාසයක් ඇති කරවීම මෙහිලා පැන නගින අභියෝගයයි. මෙම අරමුණ සපුරා ලීම සඳහා සාකච්ඡා මාර්ගයෙන් එළඹගත යුතු සාමයක් උදෙසා (අදාළ පාර්ශවයන්) වෙත පෙළඹීම් කරනු වස් පුද්ගලික අංශය විසින් අපේක්ෂා පූර්ව භූමිකාවක් ඉටු කළ යුතු වේ. අහිතකර දේශපාලන ප්‍රතිඵලවලට මුහුණ දීමට සිදුවිය හැකි වුවද නැගී සිට පෙනී සිටීමේ ධෛර්යය ඔවුන් සතුවිය යුතුය. රට පෙරට තැබීමට ව්‍යාපාර අංශය සමත් වූවහොත් පෙරළිය වෙත බලපෑම් දැක්වීමට අප සමත් වනු ඇතැයි සිතීමට සෑම හේතුවක්ම ඇත්තේය. පළමුව ශ්‍රී ලංකා පියවර මගින් අපි ඒ බව පෙන්වා දී ඇත්තෙමු. අපේ රට ආපසු යුද්ධය වෙත පා තැබුව හොත් අංශයක් වශයෙන් අපට නැතිවී යන්නට ඉඩ ඇති දේ බොහෝය. ව්‍යාපාර අංශය විසින් සාමය උදෙසා අභිලාෂ පූර්ව ස්ථාවරයක් දැරීමට තීරණය කළ අවස්ථාවක් පිළිබඳ කදිම නිදර්ශනයක් හැටියට දකුණු අප්‍රිකාව ඉදිරිපත් කරන්නට පුළුවන. ගැටුමට අදාළ පාර්ශවයන් අතර පහසුකම් සලසන්නකු ලෙස කටයුතු කිරීමෙන්, අප්‍රිකාව තුළ පැන නැගීමට ඉඩ තිබුණු බිහිසුණුතම සිවිල් යුද්ධයක් වළක්වා ගැනීමට ඔවුහු සමත් වූහ. දකුණු අප්‍රිකානු ව්‍යාපාර අංශය විසින් සපුරාගත් ජයග්‍රහණය ආදර්ශයට ගැනීමෙන් ධෛර්ය සලසා ගැනීමට ශ්‍රී ලාංකික ව්‍යාපාර අංශයටද පුළුවන. අද දින තිරසාර සාමය සොයා යන ගමනේදී රැකියා ජනනය සහ සංවර්ධන කටයුතු සඳහා දකුණු අප්‍රිකානු රජයද ව්‍යාපාර අංශයද හවුල්ව කටයුතු කරති.

අභිප්‍රේරණය කරනු ලැබූ විට, ව්‍යාපාර අංශයද ප්‍රබල බලවේගයක් වීමට ඉඩ ඇත්තේය. මේ චේතනාව ආත්ම ප්‍රයෝජනය වන්නට ඉඩ තිබුවද සමාජයීය වගකීමෙන් යුත් සමතුලිත සංවර්ධනයක් උද්ගත වන්නට පුළුවන. අවසානයේදී ප්‍රධාන ප්‍රතිලාභියා වනුයේ මුළු රටමය. සාමය හා සංවර්ධනය උදෙසා වන තම අන්‍යෝන්‍ය පරිශ්‍රමය සඳහා රජය හා ජාත්‍යන්තර ප්‍රජාව විසින් පුද්ගලික අංශයද සහභාගී කරවාගත යුතුයයි. මම විශ්වාස කරමි.

පළමුව ශ්‍රී ලංකා යනු පුළුල් ව්‍යාපාරික ප්‍රජාව විසින් අරඹන ලද ධනාත්මක ආරම්භක පියවරකි. වර්ෂ 2001 දී ගුවන් තොටුපල වෙත එල්ල වූ ප්‍රහාරය නිසා අති භයානක ආර්ථික ව්‍යසනයකට මුහුණ පෑමට රටට සිදුවිය හැකිව තිබූ අවස්ථාවේදී යුද්ධය නවත්වා තිරසාර සාමයක් සොයා ගැනීම සඳහා සාකච්ඡාමය විසඳුමකට එළඹීම පිණිස දකුණේ ප්‍රධාන දේශපාලන පක්ෂ යුවල එක්වන්ව කටයුතු කළ යුතු යයි පැවසෙන සාමූහික ස්ථාවරයකට එළඹීම සඳහා පෞද්ගලික අංශය එක්සත් විය. සාමය නොමැති වුවහොත්, ශ්‍රී ලංකාවේ ආර්ථික අනාගතය අඳුරු වන බව ව්‍යාපාර අංශය විසින් වටහා ගනු ලැබිය. තවමත් සාමය යනු දුරස්ථ අරමුණක් බැවින්ද සාමය ප්‍රයත්නය අත්හැර දැමීමටද ව්‍යාපාර අංශයට නොහැකි නිසාද, විවිදාකාර දේශපාලන ක්‍රියාකාරීන් හා සිවිල් සමාජයීය සමූහයන් ඇසුරෙන් ක්‍රියාත්මක වූ මේ පෙළඹවීම් ක්‍රියාවලිය නොකඩවා පවත්වා ගෙන යා යුතු වේ.

සාම සන්ධානය සඳහා වන ව්‍යාපාර ද තවත් ධනාත්මක ව්‍යාපාරික ආරම්භක පියවරකි. අන්‍යෝන්‍ය සහයෝගය හා අවබෝධය අනුසාරයෙන් සාමය හා සංවර්ධනය ගෙන එන ජාලාවක් ගොඩ නැගීම සඳහා එක්සත්ව කටයුතු කිරීම පිණිස, ගැටුම් පවත්නා පෙදෙස්ද ඇතුළත් විවිධ ප්‍රදේශවල තිබෙන බොහෝ ප්‍රාදේශීය වාණිජ සංගම් ඒකරාශී කිරීමට එය කටයුතු කරයි.

සාමයට පක්ෂව ක්‍රියා කිරීම හා සංවර්ධන පියවර මගින් තම ජවය දිගින් දිගටම පවත්වා ගැනීම මේ සංවිධාන යුවල විසින්ම කළ යුතු වැදගත් කාර්යයකි. මෙම අරමුණ සපුරා ගැනීමේදී සාමය ගොඩනගා නැගීමට අදාළ වන, සිය කටයුතු පහසු කරවීම උදෙසා පුද්ගලික අංශය දිරි ගැන්වීම සහ ඊට ජවය සැපයීම උදෙසා රජයේද ආධාර සපයන ප්‍රජාවගේද, ශ්‍රී ලාංකික ජනතාවගේද සහාය වැදගත් වේ. තිරසාර සාමයක් පවත්වා ගනිමින්, දිළිඳුකම අවම කොට, ධනෝපායනය ප්‍රවර්ධනය කර ගැනීමට ශ්‍රී ලංකාවට බලාපොරොත්තු විය හැක්කේ විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර වැනි ආර්ථික වශයෙන් දිළිඳු පෙදෙස්වල සාමය පිහිටුවීම හා සමතුලිත සංවර්ධනය වේගවත් කිරීම හරහා පමණකි. මිනිසුන් වෙත සෞභාග්‍යය එළඹුණු විට යුද්ධය ආකර්ෂණීය විකල්පයක් නොවේ.

තිලා මරික්කාර්
සභාපති
පළමුව ශ්‍රී ලංකා

# පෙරවදන

රටක ආර්ථික සංවර්ධනය කෙරෙහි පෞද්ගලික අංශයේ ව්‍යවසායක ක්ෂේත්‍රයෙන් සිදුවන සේවය ඉමහත්ය. කෘෂිකාර්මික, කාර්මික, නිෂ්පාදන හා සේවා තුලින් ආර්ථික සංවර්ධනයට විශාල මෙහෙයක් සිදු කරනු ලබන අතර ජාතික ආදායම වර්ධනය කිරීමට මෙම අංශයන්ගෙන් විශාල දායකත්වයක්ද දරනු ලැබේ. විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටක කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනයන්ගෙන් වැඩි ප්‍රතිශතයක් ජාතික නිෂ්පාදනයට එකතු වේ.

මෑතක සිට රටේ ආර්ථික සංවර්ධනය කෙරෙහි විමර්ශනාත්මකව බලන විට කෘෂිකාර්මික හා කාර්මික අංශවලට වඩා සේවා අංශයන්ගෙන් **50 %** ට වැඩි ප්‍රතිශතයක් ජාතික ආදායමට දායකත්වය ලබා දී ඇත. පෞද්ගලික ව්‍යවසායකත්වයේ ක්‍රියාකාරීත්වය මෙම අංශයේ වර්ධනයට විශාල මෙහෙයක් ඉටුකර තිබීම සැලකිය යුතු කරුණකි. එමගින් මෑතක සිට පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් විශාල දායකත්වයක් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට සපයා තිබේ.

රටක ආර්ථික සංවර්ධනය කෙරෙහි විශේෂයෙන් බලපාන කරුණක් නම් ගැටුම්කාරී තත්වයන්ගෙන් තොර සාමාකාමී පරිසරයක් රටතුල පැවතීමයි. සාමාකාමී වාතාවරනයක් රටතුළ තිබීමෙන් ආර්ථික වර්ධනයක් ඇතිකර ගැනීමට හිතකර පරිසරයක් ගොඩ නැගේ. ඒ අනුව රටක අර්බුද නොමැති වීම හා සාමකාමී වාතාවරණයක් පැවතීම ව්‍යවසායකයන්ගේ ව්‍යාපාරික කටයුතු සාර්ථකව කරගෙන යාමට ද මනා පිටුවහලක් වන්නේය.

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා කුඩා රටක විවිධ ජාතීන් වාසය කරන බැවින් ඔවුන් අතර සුහදත්වය හා සමානාත්මතාවය ගොඩනැගීම සඳහා විශාල මෙහෙයක් පෞද්ගලික අංශයටද සිදුකළ හැක. මෙහිදී ජාතීන් අතර අන්‍යෝන්‍ය සුහදත්වය සහ මිත්‍රත්වය ගොඩ නැගීමෙන් අර්බුදකාරී තත්වයන් අවම කළහැකි වේ. ඒ සඳහා ක්‍රියාකාරීව දායකවීම තුලින් රටක සාමය ගොඩනැගීම සඳහා පෞද්ගලික ව්‍යවසායකයන්ටද සුවිශේෂ කාර්යභාරයක් ඉටු කිරීමට හැකිය.

අද එළිදැක්වෙන මෙම ග්‍රන්ථය තුලින් අර්බුදකාරී තත්වයන් හා සාමකාමී පරිසරයන් ඒ නිසා පෞද්ගලික ව්‍යවසායකයන්ට තම කටයුතු සාර්ථකව කරගෙන යාමටත් ඉන් ඇතිවන ආර්ථික වර්ධනය පිළිබඳවත් ආදී කරුණු රාශියක් ඉදිරිපත් කර ඇත. මෙම ග්‍රන්ථයට පෙරවදනක් සැපයීමට අවස්ථාවක් ලැබීම ගැන මම අතිශයින් සතුටු වන අතර මෙම ග්‍රන්ථයෙන් එළිදක්වන මූලික පරමාර්ථය වන සාමය ඉටු වේවායි ප්‍රාර්ථනය කරමි.

අස්මි තාසීම්
අධ්‍යක්ෂ ජනරාල්
හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය
හම්බන්තොට.

# ශ්‍රී ලංකා

## හැඳින්වීම: සාමය ගොඩනැගීම සඳහා ව්‍යාපාරික භූමිකාව[1]

සීතල යුද්ධයේ අවසානයෙන් පසු ලොව පුරා දරුණු ගැටුම් 125 කට වැඩි ගණනක් සිදු වී තිබෙන අතර ඒවායින් මියගියවුන්ගේ සංඛ්‍යාව හැත්තෑ ලක්ෂයක් පමණ වේ.[2] වර්ෂ 1990 දශකයේ මැද භාගයේ පටන් ගැටුම් සංඛ්‍යාව නොකඩවා පහත වැටී ඇති නමුත්, ඉතිරි වී තිබෙන ගැටුම් දිගින් දිගටම පවතී. බියකරු විනාශයක්ද ගෙන එයි. ජාතික හා කලාපීය ආර්ථිකයන්ට සහ සංවර්ධන ඉඩකඩවලටද හානි පැමිණේ. සාමාන්‍ය සිවිල් ජනතාව මරණවලටද මානව හිමිකම් උල්ලංඝනයටද ජීවනෝපායන් අහිමි වීමට හා අවතැන් වීමටද මුහුණ පාති. දැනට ලොව පුරා මිලියන 25ක පමණ ජනයා යුද්ධය නිසා අවතැන් වී සිටිති.[3] ඊටත් වඩා බොහෝ ගැටුම් ආශ්‍රිත විවෘත අවි ගැටුම් අවසානයට පත් කළ සටන් විරාමද පහසුවෙන් බිඳෙන සුලුය. මේ රටවල් යළිත් යුද්ධයට අවතීර්ණ වීමේ සැබෑ අනතුරක් ඇත්තේය.

ආයුධ සන්නද්ධ ගැටුම් වැළැක්වීම, ගැටුම් පැන නැගුණ හොත් ඒවා නිරාකරණයට පත් කිරීම හා ඉන්පසු සාමය ගොඩනැගීම යන ප්‍රබල අභියෝග දිගින් දිගටම එල්ල වේ. මෙම කටයුතු සඳහා පුළුල් පරාසයකට අයත් පුද්ගලයන් හා සංවිධානවල ඒකාබද්ධ වෑයම, කුසලතා, සම්පත් හා කැපවීම අවශ්‍ය කෙරේ. ගැටුම්වලට මුහුණ පා සිටින සමාජ වලට සේම ජාත්‍යන්තර මට්ටමට අයත් පුද්ගලයෝ හා සංවිධාන ඊට අයත් වෙති.

ශ්‍රී ලංකා

[1] මේ ලිපියේ පෙරවදන සකස් කරගෙන තිබෙන්නේ මෑතදී පළ වුණු *Local Business, Local Peace: the Peacebuilding Potential of the Domestic Private Sector,* නැමති ඉන්ටර්නැෂනල් ඇලර්ට් ප්‍රකාශනයේ විධායක සාරාංශය ඇසුරෙනි. ගැටුම් පවත්නා ප්‍රදේශ 20 කට අධික සංඛ්‍යාවක සමාජයන් තුළ තිබෙන, සාමයට දායක වීම සඳහා ක්‍රියාත්මක පියවර ගන්නා ව්‍යාපාරික ප්‍රජාවන්ගේ අත්දැකීම් එක්රැස් කරන එම සංවිධානය ඒ හරහා අනාගතය සඳහා පාඩම් සකස් කරයි

[2] Smith, D. (2003) *The Atlas of War and Peace* (London, UK: Earthscan).

[3] Human Development Report (2005) *International Co-operation at a Crossroads: Aid, Trade and Security in an Unequal World* (New York, US: UNDP).

# ගැටුම් පවතින ප්‍රදේශවල දේශීය පෞද්ගලික අංශය

සංවර්ධන ප්‍රතිපත්තිය හා ආධාර ගැටුම් නිරාකරණය සහ ගැටුම්වලින් පසු යළි ගොඩනැගීම් කටයුතු වෙත බලපාන, ගැටුම් සහිත ප්‍රදේශවල පෞද්ගලික අංශයට අදාළ ජාත්‍යන්තර චින්තනය හා ප්‍රතිපත්ති පිළිබඳව දැනට පවත්නා ප්‍රධාන ප්‍රවාහයන් දෙකක්වෙති.

සීතල යුද්ධයේ අවසානයෙන් පසු සංවර්ධන ප්‍රජාව තුළ ඒකමතික අදහසක් සේ පැන නැගුණු මිත් පලමුවැන්න (යුද්ධයෙන් පසු පුනර්ජීවනය ලබන රටවල් ඇතුළුව) රටවල ආර්ථික සංවර්ධනය උදෙසා නිදහස් වෙළඳපොල ආර්ථිකය හා පෞද්ගලික අංශයෙන් මෙහෙයවනු ලබන වර්ධනයේ ප්‍රමුඛත්වය තහවුරු කර සිටියි. මේ පදනම බෙහෙවින් ව්‍යාප්තය, සංවර්ධන ආයතන විසින් සකස් කර ඇති ප්‍රතිපත්ති, තත්කාලීන සටහන් හා ලේඛන රාශියක් මගින් ප්‍රකාශයට පත්කර තිබේ.[4] ප්‍රතිපත්තිමය උපකරණ හා මැදිහත් වීම් මාලාවක් අනුසාරයෙන් රටවල රාජ්‍ය සංවිධානය සංවර්ධනය කරනු සඳහා සංවර්ධනයේ හා දරිද්‍රතාව අඩු කරවීමේ "ඇන්ජිමක්" (ක්‍රියාකාරී බලය සපයන උපකරණයක්) ලෙස දේශීය මෙන්ම විදේශීය පෞද්ගලික අංශයේ ආයෝජන මගින් රග දැක්වෙන තීරණාත්මක භූමිකාව පිළිබඳ අවධාරණය පුළුල් ලෙස ප්‍රවර්ධනය කෙරේ. ගැටුම් සහිත ප්‍රදේශවල පවා, පෞද්ගලික අංශය තීරණාත්මක සාධකය ලෙස කටයුතු කරන - සාමයට දායක වන, දිළිඳුබව පිටු දැකීමට අදාළ වර්ධනයක් සහිත ආර්ථික චක්‍රයක් ගොඩ නැගීම සරල පියවරක් බව බොහෝ විට පිළිගනු ලැබේ.[5]

ගැටුම් පවත්නා ප්‍රදේශවල තිබෙන පෞද්ගලික අංශය පිළිබඳ දෙවැනි තත්කාලීන ජාත්‍යන්තර චින්තනය පෞද්ගලික ව්‍යවසාය හා ආර්ථික කටයුතු අතරැති ධනාත්මක බලපෑම පිළිබඳ මේ විශ්වාසය තවදුරටත් විග්‍රහ කරනුයේ යුධමය ආර්ථික පිළිබඳ ප්‍රශ්නය හුවා දක්වමිනි. අද තිබෙන ගැටුම් බොහෝමයකදී ප්‍රචණ්ඩත්වය දිගින් දිගටම පවත්වා ගෙන යෑම සමග ලාභ ඉපැයීම පෙරදැරි කරගත් ව්‍යාපාරික කටයුතු සම්බන්ධවන අන්දම අවධාරණය කරන පර්යේෂණ තොරතුරු රැසක් ඉකුත් දශකය තුළදී එක්රැස් කරගෙන තිබේ.[6]

[4] See for instance CIDA (2004) *Sustainable Development Strategy 2004-06: Enabling Change* (Ottawa, Canada: CIDA); Norad (2004) *Peacebuilding - A Development Perspective* (Oslo, Norway: Norad); Commission on Private Sector and Development (2004) *Unleashing Entrepreneurship: Making Business Work for the Poor* (New York, US: UNDP).

[5] DFID (2005) *Fighting Poverty to Build a Safer World: A Strategy for Security and Development* (London, UK: DFID); World Bank (2000) *Attacking Poverty: Opportunity, Empowerment and Security* (Washington DC, US: Word Bank); SIDA (2005) *Promoting Peace and Security through Development Co-operation* (Stockholm, Sweden: Edita).

[6] See, for example, Ballentine, K. and Sherman, J. (eds.) (2003) *The Political Economy of Armed Conflict: Beyond Greed and Grievance* (Boulder, US: Lynne Rienner); Fischer, M. and Schmelzle, B. (eds.) (2004) 'Transforming War Economies: Dilemmas and Strategies' *Berghof Handbook Dialogue Series* No. 3 (Berlin, Germany: Berghof Research Center for Constructive Conflict Management); and Collier, P. (2000) 'Doing Well Out of War: an Economic Perspective' in Berdal, M. and Malone, D. (eds.) *Greed and Grievance: Economic Agendas in Civil Wars* (Boulder, US: Lynne Rienner).

මේ දැනුම් සම්භාරය තුළ විවිධ මති මතාන්තර තිබුණද එහි ප්‍රධාන අවධාන කේන්ද්‍රය වී තිබෙන්නේ යුද්ධයෙන් ලාභ ලබන සන්නද්ධ කණ්ඩායම් හා එය පවත්වා ගෙන යෑම සඳහා මුදල් සැපයීමේ මාර්ග සලසන වෙළඳ රටාවන්ය. ස්වාභාවික සම්පත් ඉවත් කිරීම ප්‍රශ්න දෙකටම අදාළ සුවිශේෂ ලක්ෂණයකි.[7] සිවිල් ගැටුම් පවත්නා කාල සීමාව, ඒවායේ තියුණුබව හා ස්වභාවය තීරණය කිරීමේලා ඇතැම් වර්ගවලට අයත් ව්‍යාපාරික කටයුතු මගින් ප්‍රබල කොටසක් ගෙවෙන බව හෙළි කරන තොරතුරු වැඩි වැඩියෙන් ලැබීම නිසා, එය මේ විනාශකාරී ජවයන් සීමා කිරීමට යත්න දරන ප්‍රතිචාරයන් සොයා ගැනීම සඳහා උත්සාහ දැරීමට යොමු වී තිබේ. යුදමය ආර්ථිකයන්හි පර්යේෂණ හා ප්‍රතිචාර එක්ව සාමය ගොඩ නැගීම සඳහා නව තිරණාත්මක ප්‍රදේශයක් නියෝජනය කරයි.

ප්‍රාදේශීය ව්‍යාපාර, ප්‍රාදේශීය සාමය මේ විශ්ලේෂණාත්මක හා ප්‍රතිපත්තිමය නැම්යාවන් එහි සන්දර්භය ලෙස සලකයි. ඒ අනුව, යුද්ධය පවත්නා ප්‍රදේශවල තිබෙන ව්‍යාපාරික කටයුතු හා සම්බන්ධිත ප්‍රශ්න හා එහි කොටස් ඉතා තදින් පුළුල් දේශපාලන ආර්ථිකය සහ රාජ්‍ය පාලන ක්‍රමය සමග තදින් බැඳී තිබෙන බවද සැලකිල්ලට ගනියි. ඒ අනුව, සාමය හා ආරක්ෂාව වෙත පෞද්ගලික අංශයට දායකවිය හැක්කේ කෙසේදැයි විස්තර කරයි. මේ ප්‍රශ්නය ගවේෂණය කිරීමේ මාර්ගය හරහා සාමය ගොඩ නැගීමට අදාළ, ප්‍රමාණවත් තරම් පර්යේෂණ කර නොමැති අංශයක් ගැන අවධානය යොමු කරන අධ්‍යයනය ලොව පුරා ව්‍යාපාරික ප්‍රජාවන් අතර සාමය ගොඩනැගීම පිළිබඳ දැනුවත්බව තව දුරටත් පෙළගැස්වීමට උත්සාහ දරයි.

ශ්‍රී ලංකාව පිළිබඳ අධ්‍යයනයද කොටසක් සේ අයත් වන සම්පූර්ණ අධ්‍යයනයට ඇෆ්ගනිස්තානය, බොස්නියාව, කොලම්බියාව, ගෝතමාලාව, ඊස්රායලය/පලස්තීනය, නේපාලය, සෝමාලියාව, ශ්‍රී ලංකාව හා දකුණු කොකේසය යන රටවල් හෝ කලාපීය වාර්තා නවයක් සහ කෙටි සිද්ධි අධ්‍යයන 21 ක් අන්තර්ගත වේ.

# දේශීය ව්‍යාපාර විසින් ගැටුම් සම්බන්ධයෙන් දක්වෙන ප්‍රතිචාර - සම්පූර්ණ තොරතුරු රැස් කිරීම

දේශීය වුවද ජාත්‍යන්තර වුවද ඕනෑම සංවිධානයක් විසින් සාමය ගොඩ නැගීම සඳහා මැදිහත් වීමේදී ගැටුම් සන්දර්භය සහ ඊට යටින් පවත්නා ප්‍රශ්න හා අදාළ ආයතනය අතරැති සබඳතාව පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතු වේ. එබන්දක් නොමැති වුවහොත් (ඉතාම යහපත් තත්වයන් යටතේ කෙරෙන) දායකත්වය අසම්පූර්ණ එකක් වීමට හෝ (ඉතාම අයහපත් තත්වයන් යටතේ) හොඳට වඩා නරක ප්‍රතිඵල පැන නැගීමටද ඉඩ ඇත්තේය.[8] සාමයට දායක වීම අරබයා දේශීය පෞද්ගලික අංශය සතු විභව හැකියාව අවබෝධ කරගැනීම උදෙසා ගැටුම හා සාමය සහ එය අතරැති විභව බැඳීම් සියල්ල ගැන වටහා ගත යුතුය.

සිංහල

[7]See, for example, Le Billon, P. (2005) 'Fuelling War: Natural Resources and Armed Conflicts' *Adelphi Paper* No. 373, International Institute for Strategic Studies (London, UK: Taylor and Francis); Ross, M. (2003) 'Oil, Drugs, and Diamonds: The Varying Role of Natural Resources in Civil Wars' in Ballentine and Sherman, op. cit; Global Witness (2004) *Same Old Story: A Background Study of Natural Resources in the DRC* (London, UK: Global Witness); and Global Witness (1998) *A Rough Trade: The Role of Diamond Companies and Governments in the Angolan Conflict* (London, UK: Global Witness).

[8]See Anderson, M. B. and Olson, L. (2004) *Confronting War: Critical Lessons for Peace Practitioners* (Cambridge, US: Collaborative for Development Action).

ප්‍රචණ්ඩ ගැටුම් වෙත ව්‍යාපාර මගින් දැක්වෙන ප්‍රතිචාරය ක්‍රමෝපායයන් ගණනාවක මිශ්‍රණයක් විමේ නැම්යාවෙන් යුක්ත බව (ශ්‍රී ලංකාව පිළිබඳ අධ්‍යයනයද ඇතුළත්) සමස්ත අධ්‍යයන තොරතුරු මගින් අනාවරණය වේ. වෙනස් වන තත්ත්වයන් අවස්ථාවන් හා බලවේග අනුව කලින් කළ හැඩ ගැසේ. මෙකී ව්‍යාපාරමය ප්‍රතිචාරයන්ගේ විවිධත්වයද අනුක්‍රමයෙන් එකිනෙකට වෙනස් වී යන පුරුක් සහිත දාමයකට සමාන වේ. ආයුධ සන්නද්ධ සටන් දිගටම පවත්වාගෙන යැමට ආධාර වන මුදල් සපයන නීති විරෝධී වෙළඳ කටයුතුවල නියැලීම මෙන්ම සමාජයීය පන්තියක් වශයෙන් ව්‍යාපාර සහ ප්‍රචණ්ඩත්වයේ මූලික හේතු අතර පවත්නා ව්‍යුහමය සබඳතා එක් කොණක වෙයි. මධ්‍යයෙහි මුහුණ පෑමේ ක්‍රමෝපාය වෙයි. මේවා ගොඩ නැගෙන්නේ ව්‍යාපාරය සිය පැවැත්ම සඳහා වෙරදරමින් ගැටුමෙන් පැන නගින අභියෝගවලට අනුව හැඩ ගැසීම තුළිනි. අභියෝගවලට මුහුණ  පෑමේ කටයුතුවලට ගැටුම් පවත්වන හා ගැටුම අඩු කරන යන බලපෑම් දෙවර්ගයම ඇතුළත් වේ. අවසාන වශයෙන් - ගැටුම හීන කොට සාමය සඳහා ඇති ඉඩකඩ වැඩි දියුණු කිරීමට තැත් කරන ප්‍රතිචාර වෙති. මේ අධ්‍යයනයෙහි මේ කටයුතු හැඳින්වෙනුයේ සාම ව්‍යවසායකත්වය ලෙසිනි.

## සාමය ගොඩ නැගීම යනු කුමක්ද?

සාම ප්‍රවර්ධන උත්සාහයන් අවශ්‍යයෙන්ම සංකීර්ණ වේ. ගැටුමෙහිම අඩංගු සංකීර්ණත්වයන් එයින් පිලිබිඹු වෙයි. ගැටුම්වලට හේතු බොහෝය. විවිධ පැතිකඩ සහිතය. කාලය අනුව වෙනස්වන සුලුය. සමාජයීය, සංස්කෘතික, දේශපාලන, ආරක්ෂිත, ආර්ථික, භූගෝලීය හා දාර්ශනික වැනි අන්තර්ක්‍රියාකාරී සාධකද ඊට ඇතුළත් වෙති.  (ඉතා පුළුල් විවිධ වර්ග රැසකට අයත්) ක්‍රියාකාරී සංකල්ප හා න්‍යාය පත්‍ර යනු ඒ හා බැඳී පවතියි. ගැටුමේ මෙකී විවිධ පැතිකඩ සමග කටයුතු කිරීමේදී සාමය ගොඩ නැගීමේ කාර්යය දීර්ඝ කාලීන ක්‍රියාවලියක් වේ. මේ සමග "සාමකාමී, ස්ථාවර, අවසාන වශයෙන් සෞභාග්‍යවත් සමාජ හා ආර්ථික සංවර්ධනයකට ඉඩ සලසන ව්‍යුහමය තත්වයන් ආකල්ප හා දේශපාලන උපක්‍රමයක් සංවර්ධනයට අනුබල දීමට උත්සාහ දරන, විවිධ මාදිලියේ වැඩ කටයුතු රැසක් සම්බන්ධ වේ. සාමය ගොඩනැගීමේ කටයුතු සැලසුම් කරනුයේ ආයුධ සන්නද්ධ ගැටුමක් අවසාන කිරීම හෝ වැළැක්වීම සඳහාය. මෙය ආයුධ සන්නද්ධ ගැටුම පවත්නා අතරතුර ඒ පසුපස හෝ අපේක්ෂිත ආයුධ සන්නද්ධ ගැටුමක් පැන නැගීම වැළැක්වීමේ උත්සාහයක් ලෙස හෝ ක්‍රියාත්මක වේ.[9]

එකිනෙක  ගැටුමේ සන්දර්භය තුළ අන්තර්ගත  විශේෂ  ලක්ෂණ අනුව විවිධ ක්‍රමෝපායයන් හා කටයුතු සාමය ගොඩ නැගීමේ කාර්යයට අයත් විය හැකි වුවද ඒවා ප්‍රධාන වශයෙන්ම දේශපාලන, ආර්ථික ආරක්ෂක සහ සමගි සන්ධාන යන අංශ හතර යටතේ පුළුල් වශයෙන් සංවිධාන කිරීමට පුළුවන. මේ අංශ තුළ පවත්නා අසහනකාරී ප්‍රශ්න හා ඒවාට මුහුණ පෑම සඳහා අදාළ වන කටයුතුද නොවැළැක්විය හැකි පරිද්දෙන් එකිනෙකට බැඳී පවතී. එමෙන්ම එකිනෙක මත අන්‍යොන්‍ය වශයෙන් රැඳී පවතියි. නිදසුනක් වශයෙන්, මූලික ආරක්ෂාව නැතිනම් ආර්ථික වර්ධනය ඇති කරවන වඩාත් දිර්ඝකාලීන ආයෝජන සඳහා ව්‍යාපාරිකයන් ඉදිරිපත් නොවන්නට ඉඩ ඇත්තේය. අනෙක් අතට, සෞඛ්‍ය සම්පන්න ව්‍යාපාරික අංගයක් නොමැතිව, ගැටුම හමාර වුවායින් පසු ආපසු සාමාන්‍ය ජීවිත චර්යාවකට පිවිසිය යුතු හමුදා සාමාජිකයන් රාශිය සඳහා තිරසාර රැකියා සොයා ගැනීමද අභියෝගයක් වනු ඇත. මේ සියලුම මට්ටම්වල අවශ්‍ය වෙනස්කිරීම්වලට මුහුණ දිය හැකි එකම ක්‍රියාකාරිකයකු හෝ එකම ආයතනයක් නොමැති බව ඉතා පැහැදිලිය.  (ඒ සඳහා) ඌන පූරක භූමිකාවන් සහ වැඩ කටයුතු මාලාවන් සහිත විවිධ වර්ග රාශියකට අයත් දේශීය හා ජාත්‍යන්තර ක්‍රියාකාරීන් අවශ්‍ය වේ.

[9] Smith, D. (2004) *Towards a Strategic Framework for Peacebuilding: Getting their Act Together* (Oslo, Norway: Royal Norwegian Ministry of Foreign Affairs).

ගැටුම් නිරාකරණ ක්‍රියාවලීන් පහසු කරවීමේලා විදේශීය රාජ්‍ය, ජාත්‍යන්තර සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන වැනි බාහිර ක්‍රියාකාරීන්ට වැදගත් භූමිකාවකට ඉඩ ඇති නමුත්, දේශීය සාමය ගොඩනැගීමේ ප්‍රාථමික වගකීම ඇත්තේ දේශීය ක්‍රියාකාරීන්ටය යන්න පිළිබඳව මුළුමනින්ම වාගේ ඒකමතික එකඟතාවක් සහිත කරුණකි. ඇත්ත වශයෙන්ම සාමය ගොඩනැගීමට අදාළ ක්‍රමෝපායමය ප්‍රවේශය දේශීය ක්‍රියාකාරීන්ගේ මූලිකත්වය ප්‍රවර්ධනය කරයි. දේශපාලන, සමාජීය හා ආර්ථික බෙදීම්වල පාර්ශවයේ සිටින විවිධ අංශවල සහයෝගිතාව ඒ සඳහා අවශ්‍යය. බාහිර මැදිහත්වීම් මගින් දේශීය උත්සාහයන්ට ආධාර සහතික කිරීම සඳහා එය ජාතික දේශසීමාවලින් ඔබ්බට යොමු කරයි.

දේශීය පෞද්ගලික  අංශය සතුව පවත්නා ජාලයන් හා සම්බන්ධයන් මගින් එය සමාජයේ සියලුම මට්ටම් හරහා දිවෙයි. ව්‍යාපාරිකයන් හා සෙසු සමූහයන් සමග තිබෙන බැඳීම් නිසා එය තදින් ඵලදායක වීමට ඉඩ ඇත්තේය.

## සාම ව්‍යවසායකත්වය - පුළුල් නිරීක්ෂණයක්

ප්‍රාදේශීය ව්‍යාපාර, ප්‍රාදේශීය සාමය මගින් එකතු කර ඇති සිද්ධි අධ්‍යයන තොරතුරුවලින් නිරාවරණය වන්නේ විවිධ අන්දමේ ගැටුම් පරිසර යටතේ සාමය ප්‍රවර්ධනය කිරීමට උත්සාහ දරන ව්‍යාපාර මගින් කෙරෙන මැදිහත්වීම් පරාසයක් පවත්නා බවයි. එබඳු සාම ව්‍යවසායකත්ව පිළිබඳ නිදසුන් දේශීය ව්‍යාපාර. දේශීය සාමය ගොනුකර දක්වයි. එමගින්, ආර්ථික, ආරක්ෂක, දේශපාලන හා සමාජයීය පිළිගැනීම් පිළිබඳ ප්‍රශ්න නිරාකරණය කරනු සඳහා දායකවීම පිණිස ව්‍යාපාරයන් සතු විභව හැකියාව පෙන්නුම් කෙරේ.

## විධිමත් සාම සාකච්ඡාවලට අදාළ දේශීය ව්‍යාපාරමය භූමිකාව

විධිමත් දේශපාලන මට්ටමේ සාම ක්‍රියාවලීන් ගැන සලකන විට, විවිධ අන්දමේ ගැටුම් සන්දර්භයන් යටතේ ව්‍යාපාරිකයන් විසින් වැදගත් සහාය භූමිකාවක් රඟපා ඇති බව අනාවරණය වේ. නිදසුන් වශයෙන් "ඇතුළත් උදවිය" හැටියට සාකච්ඡාවලට හවුල් වන කණ්ඩායමක සාමාජිකයන් ලෙස හෝ පාර්ශවයන් අතර විශ්වාසය ගොඩ නැගීමට ආධාර කරන, මහජන මතය ගොඩ නගන අවවාද හා දැනුම සපයන සාමයට පක්ෂපාතීව ප්‍රචාරණ කටයුතු කරන හා පරිපාලන හා ප්‍රවාහන සංවිධාන, ආදී අවශ්‍ය සේවා සපයන "බාහිර අය" ලෙස හෝ ඔවුන්ට කටයුතු කරන්නට ඉඩ ඇත. ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ඉහළ මට්ටමේ සිටින ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයන් විසින් අත්‍යවශ්‍ය සම්පත් හා කුසලතා භාවිතා කර ඇත්තේය. සාම සාකච්ඡාවලට සහාය වීම සඳහා තමන් හා දේශපාලන තීරකයන් අතරැති සමීප සබඳතාවන් භාවිතයට ගෙන ඇත්තේය. සාම ලාභාංශයේ අපේක්ෂාවන් ඉටු කිරීම ඇතුළු එකඟතාවන් ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන් සතු සම්පත් හා කුසලතාවන් තීරණාත්මක යෙදවුමක් විය හැකිය. වැදගත් සම්පත් සැපයීම ප්‍රතික්ෂේප කිරීම තුළින් සාම ක්‍රියාවලීන් අහෝසි කිරීමට සමත් තත්ත්වයක් පෞද්ගලික  අංශයට තිබෙන නිසාද ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ඕනෑම සාම ක්‍රමෝපායක වැදගත් කොටසක් වෙයි

## ප්‍රාදේශීය ව්‍යාපාර හා සාමය ගොඩ නැගීමේ ආර්ථික පරිමාණ

වර්ධනය නිර්මාණය කිරීමේදී ව්‍යාපාර අංශයට හිමි තීරණාත්මක භූමිකාව අවධාරණය කරන සම්මත සංවර්ධන විශ්වාසය පදනම් කර ගනිමින්, සාමය ගොඩ නැගීමේලා දේශීය පෞද්ගලික  අංශයට ආර්ථික දායකත්වයට කළ හැකි සේවයේ විශාලත්වය ආධ්‍යාහාර වශයෙන් ගනු ලැබේ. එහෙත් මේ ප්‍රශ්නය ගැන වඩාත් සුපරික්ෂාකාරී ලෙස බැලිය යුතුය. බොහෝවිට නොදැනුවත්වම ගැටුමට පාදක වන ආර්ථික ප්‍රශ්න දිගින් දිගටම පැවතීමට සලස්වන්නට ව්‍යාපාර අංශයට පුළුවන ඒ අතරම ව්‍යාපාර අංශය තිබෙන්නේ බොහෝමයක්

ගැටුම්වලට මූල්වන සමාජ ආර්ථික සාධක කිරීම් අඩු කරවීම සඳහා ඉතාම සුදුසු තැනකය. සම්පත් රැකියා හා අවශේෂ අවස්ථාවන් වෙත පිවිසීමේ අවස්ථා පිළිබඳව යම් යම් සමූහයන් වෙත කෙරෙන සීමා නිසා නොරිස්සුම ජනිත වන්නට සංවර්ධනය විකෘති වීමට හා ප්‍රචණ්ඩත්වය වෙත යොමු වන්නටද ඉඩ ඇත්තේය. ආර්ථික හේතු පෙළඹීම් හා ප්‍රචණ්ඩ ගැටුම්වල ප්‍රතිඵලවලට මුහුණ දීම සඳහා වඩාත් කල්පනාකාරී ව්‍යාපාරවලට නිර්මාණශීලී පියවර ගත හැක්කේ කෙසේදැයි මේ අධ්‍යයනය පෙන්වා දෙයි. සේවා ස්ථානයට අදාළ කටයුතු වඩාත් පුළුල් ප්‍රජාව මගින් සිදු කරන කටයුතුවලට පක්ෂපාතීබව දිනා ගැනීම මෙන්ම ගැටුම නිසා මතු වී තිබෙන බෙදීම් සීමා හරහා ඒකාබද්ධ ආර්ථික කටයුතු දියත් කිරීම වැනි පියවර ඊට ඇතුළත් වේ. මෙබඳු මැදිහත්වීම් අනුසාරයෙන් සාමය ගොඩ නැගීමේ ආර්ථික පැතිකඩ වෙත දායක වීම සඳහා ව්‍යාපාර අංශය තමන් සතු විභව ශක්තිය සපුරා ලීමට පටන් ගතියි.

## සම්බන්ධීකාරකයන් ලෙස ප්‍රාදේශීය ව්‍යාපාර : ගැටුම නිසා මතු වී ඇති බෙදීම් හරහා සබඳතා යළි ගොඩනැංවීම

ප්‍රචණ්ඩ ගැටුම් නිසා බෙදී සිටින ප්‍රජාවන් අතර සබඳතා සාමාන්‍යයෙන් හානියට පත්වී තිබේ. ඒවා තදින්ම අවදානම් සහිතය. අතීතයේ සිදුවූ අමානුෂික සැහැසිකම් නිසා සාමාන්‍යයෙන් දැඩි අවිශ්වාසය හා කෝපය සහිතය. ගැටුම් නිසා වෙන් වී සිටින පාර්ශ්වයන් අතර පවත්නා බිඳී ගිය සබඳතා අලුත්වැඩියා කිරීම සඳහා සමාජයේ නායකයන් හැටියට දේශීය ව්‍යාපාර අංශයට විශාල මෙහෙයක් ඉටු කළ හැකියයි අධ්‍යයනයෙන් පෙනේ. මෙම කාර්යය දෙපාර්ශවයේම අය එක්තැන් කරවීම සඳහා සැකසුණු සංවාද ක්‍රියාවලීන්ට සහභාගී වීම හෝ ගැටුමේ බෙදීම් හරහා ඉදිවන ඒකාබද්ධ ආර්ථික කටයුතු සංවිධාන කිරීම හෝ ඒවාට සහභාගී වීම වැනි කාර්යයන්ගේ ස්වරූපය දරන්නට පුළුවන. අලුත් ආකාරයෙන් ගැටුම දෙස බලන්නට හා ඊට අනුරූපව තම පෙදෙසේ අය වෙත බලපෑම් දක්වන්නට ඉඩ සැලසීම හරහා ව්‍යවසායකයන් අතර පොදු අරමුණක් පිළිබඳ හැඟීමක් ජනිත කරවීමට ඉහත කී සංවාදමය පියවරවලට හැකියාව ඇත්තේය. ගැටුම් පරිසරයක් යටතේ දෙපාර්ශ්වය අතර ඉතිරි වන සබඳතා කිහිපය අතරින් ව්‍යාපාර පවත්වාගෙන යෑම ඉන් එකක් වන්නට ඉඩ තිබේ. ගැටුම් අවසාන වූ පසු යළි ඇරඹෙන ඒවායින් එකක් වන්නේද එයයි. බොහෝ අවස්ථාවලදී මේ සම්බන්ධ ස්ථාන ලාබදායක මෙන්ම ආකර්ෂණීයද වනුයේ අන්‍යෝන්‍ය ප්‍රයෝජනය උදෙසා පැවැත්වෙන සාමකාමී අන්තර්ක්‍රියාකාරීත්වය ක්‍රියාත්මක කළ හැකි හා වටිනා දෙයක් යයි එමගින් පෙනී යන හෙයිනි.

## සාමය ගොඩනැගීමේ ආරක්ෂාව පිළිබඳ පැතිකඩ නිරාකරණය කිරීමේලා දේශීය ව්‍යාපාරය සතු භූමිකාව

ගැටුම් පවත්නා හා පසුආසන්න තත්වයන් යටතේ ප්‍රධාන ආරක්ෂක අභියෝගවලින් සමහරක් නිරාකරණය කිරීම පිණිස පහත සඳහන් පියවර මගින් දායක වීමටද ප්‍රාදේශීය ව්‍යාපාරවලට පුළුවන: ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වන නිරායුධ කිරීමේ සේවාමුක්ත කිරීමේ හා යළි අන්තර්ග්‍රහණ වැඩ සටහනක කොටසක් ලෙස හෝ ඒ ඒ අවස්ථානුකූල වෙන් වෙන් පියවර මගින් කලින් සටන් කිරීමේ නියැළී සිටි අයට රැකියා සැපයීම, සැහැල්ලු අවි ආයුධ එකතු කිරීමේ වැඩ සටහන් සඳහා මිල මුදල් හා ප්‍රවාහන පහසු කම් සැලසීම, නිලමය ආරක්ෂක ව්‍යුහයන් ශක්තිමත් කිරීම හා ගැටුම් යළි පැන නැගීම හා ප්‍රජා මට්ටමේ ආරක්ෂා තත්වය බිඳ වැටීම පිළිබඳ කල්තියා දැනුම් දෙන තොරතුරු මාර්ගයක් ලෙස ක්‍රියාත්මක වීම කළ හැකිය.

විශ්වාසදායක ආරක්ෂක තත්ත්වයක් හෝ ක්‍රියාත්මක රාජ්‍ය බල සේනා හෝ නොමැති විට බොහෝවිට තමන්ගේම ආරක්ෂාව සලසා ගන්නට ව්‍යාපාරිකයෝ පෙළඹෙති. මේ සඳහා පෞද්ගලික ආරක්ෂක සමාගම් හෝ මුර සේවා කණ්ඩායම් යොදා ගැනීමට සිදු වේ.

එමගින් ඉහතදී සටන් කිරීමේ යෙදී අය සඳහා යුධමය නොවන රැකියා සැපයීමෙන් ප්‍රයෝජන ලැබිය හැකි වුවද රජයට අයත්, වගකිවයුතු ආරක්ෂක සංවිධානය තව දුරටත් ක්ෂය වීමක්ද එමගින් ප්‍රදර්ශනය වනු විය හැකිය. වඩාත් දීර්ඝකාලීන ස්ථාවරත්වය සඳහා දායක වීමට කැමති ව්‍යාපාරයන් විසින් මේ ප්‍රශ්නය සුපරික්ෂාකාරීව නිරාකරණය කරගත යුතු වේ.

## සාමය ගොඩනැගීමේ දී කාන්තා ව්‍යවසායකයන් සතු භූමිකාව

විශේෂයෙන්ම ඉතා සුළු පරිමාණයේ මූල්‍ය සම්පාදන ඇසුරෙන් පහළ මට්ටම්වල කටයුතු කරන ආර්ථික ක්‍රියාකාරීන් වශයෙන් කාන්තාවන්ගේ භූමිකාව බලගැන්වීම කේන්ද්‍ර කරගත් අවධානයක්ද දැන් ප්‍රධාන ධාරාවේ සංවර්ධන සංවාදයන්ට ඇතුළත් වේ. එමෙන්ම සමාජයේ විවිධ මට්ටම්වලදී සාමය හා මැදිහත්වීම ප්‍රවර්ධනය කිරීමේලා කාන්තාවන්ට ඉටුකළ හැකි භූමිකාව පිලිබඳ වර්ධනයවන පිළිගැනීමක්ද ඇත්තේය. ව්‍යාපාරික කාන්තාවන් ස්ථානගතව සිටින්නේ මැදිහත් වීමට අදාළ මේ හැකියා දෙක එකිනෙකට සම්බන්ධවන ස්ථානය මැදය. විශේෂයෙන්ම ගැටුම් ආශ්‍රිත ස්ත්‍රී පුරුෂ සමාජභාව වෙනස්කම් පිලිබඳ ප්‍රශ්න නිරාකරණය කිරීමේලා වැදගත් ආරම්භක පියවර ගණනාවක් සම්බන්ධයෙන් ඔවුන් පෙරමුණ ගෙන ඇතැයි සිද්ධි අධ්‍යයනයෙන් තහවුරු වේ. පහළතම මට්ටමේ ජීවන මාර්ගයන් පුනරුත්ථාපනය කරනු සඳහා වර්ග අතර ක්‍රියා කරන කාන්තා ජාලයක් සහ ගැටුමේ දෙපැත්තේ සිටින කුඩා ව්‍යාපාර අතර ඒකාබද්ධ ආර්ථික කටයුතු මගින් සහජීවනය ප්‍රවර්ධනය කරන කාන්තාවන්ගේ ව්‍යවසායමය සංවිධානයක්ද මීට උදාහරණ වේ.

## සාම ව්‍යවසායකත්වය අභිප්‍රේරණය වන්නේ (පෙළඹෙන්නේ) කුමකින්ද?

සාමය ගොඩනගන ක්‍රමෝපායයන් යොදා ගැනීමට ව්‍යාපාරවලට හැකි වන්නේ කුමකින්ද? යන ප්‍රධාන ප්‍රශ්නයට අදාළ කිසියම් එළියක් දේශීය ව්‍යාපාර, දේශීය සාමය මගින් සැපයේ වෙනත් වචනවලින් අසත හොත්, සාම ව්‍යවසායකත්වය මෙහෙයවන්නේ කුමකින්ද? සාමය ගොඩනැගීම සඳහා සම්බන්ධවීමට ව්‍යාපාරයන් පොළඹවන ප්‍රධාන සාධක හතරක් අධ්‍යයනයෙන් ඉස්මතු වේ.

## ගැටුමේ පිරිවැය ගණනය කිරීම

ගැටුමක් නිසා පෞද්ගලික අංශයට දරන්නට සිදුවන පිරිවැය ව්‍යාපාරිකයන්ට අදාළ ප්‍රධාන ප්‍රශ්නයකි. ආර්ථික පරිහාණිය: ආයෝජන නැතිවීම, යටිතල ව්‍යුහය විනාශ වීම: ප්‍රාග්ධනයට හා සේවක පක්ෂයට වන හානි, ගැටුමේ අනික් පැත්තේ සිටින ව්‍යාපාරික හවුල්කරුවන් අහිමි වීම, ක්‍රියාකාරී පරිසරය තුළ ආරක්ෂාව රහිත වීම හා වර්ධන අවස්ථා අහිමිවීම යන මේවා ගැටුම් පවතින කාලය තුළදී ව්‍යාපාරයන්ට විඳින්නට සිදුවන සෘජු ප්‍රතිඵල වේ. මේ ප්‍රශ්නයට අදාළව දැනුවත්බව වැඩි දියුණු කිරීම හා ඒ පිලිබඳව පර්යේෂණ පැවැත්වීම හා ( ඒ ගැන අවශ්‍ය කරුණු) ප්‍රචාරය ව්‍යාපාරයන් විසින් (සාමය ගොඩනැගීම සඳහා) කටයුතු කිරීම ප්‍රවර්ධනය සඳහා සෙසු අයව භාවිතා කළ හැකි මෙවලම් වේ. එය සාමය ප්‍රවර්ධනය කිරීම සඳහා හවුල් වන ලෙස අවශේෂ අයවලුන්ට ඒත්තු ගැන්වීම සඳහා විශාල සමාගම් විසින් භාවිතා කර තිබේ.

## සදාචාරාත්මක බැඳීම

සාම ව්‍යවසායකත්වය සම්පූර්ණයෙන්ම ආර්ථික හේතු සාධකවලට සීමා කරන්නට නුපුළුවන. පුද්ගලයනට ඇති සදාචාරාත්මක බැඳීම (අනිවාර්යයෙන්ම කළ යුත්තක් සේ දැනෙන්නට වීම) බොහෝ විට ඊට සමාන බලයෙන් යුත් සාධකයක් වේ. දුක් වේදනා පිටුදැකීම හා වැඩි දෙනාගේ යහපත සඳහා සාමය ප්‍රවර්ධනය කිරීම නිතරම සාම ව්‍යවසායකත්වය අභිප්‍රේරණය කිරීමේදී ආර්ථික අභිලාෂයන්ට ඌනපූරක වේ. මෙම සාධකය දේශීය ව්‍යාපාර හා ඒවායේ විදේශීය ආයෝජකයන් වෙන්කර දක්වන තීරණාත්මක ලක්ෂණයකට පාදක වෙයි: මෙයින් පළමුවැනි වර්ගය ගැටුම් සන්දර්භයක් තුළ පවත්නා සමාජ සංවිධානයක කොටස්කරුවෝ වෙති. එබැවින් ගැටුම නිසා තමන්ගේම ප්‍රජාවන්ට හා පවුල්වලට විඳින්නට සිදුවන කම්පනය හා විනාශය අත්දුටු අය වෙති.

## අන්‍යයන් විසින් "පණ පෙවෙන" අවස්ථා

ගැටුම් ආශ්‍රිත සුවිශේෂ ප්‍රශ්න නිරාකරණයට සහභාගී වන ලෙස හෝ සාමස ගොඩ නැගීම සඳහා ක්‍රියාත්මක ලෙස හවුල් වීම සඳහා ව්‍යාපාරයන් දිරිමත් කිරීම පිණිස ජාත්‍යන්තර සාම සාධක ආයතන: සන්නද්ධ කණ්ඩායම්, ප්‍රාදේශීය සිවිල් සමාජ කණ්ඩායම් හා ඔවුන්ගේ ජාත්‍යන්තර හවුල්කරුවන් ආදී සියල්ලන් විසින්ම ක්‍රියාත්මක ලෙස (ව්‍යාපාර) උත්සාහ ගෙන තිබේ. සංවාදයට හා විශ්ලේෂණයට ඉඩ සලසන හවුල්කරුවන් මගින්: අවශේෂ සාම ක්‍රියාවලීන්ට සහභාගී වන පුද්ගලයන් සමග හුවමාරු කිරීමෙන්, දේශපාලන හා ආරක්ෂක වාසි මගින්, සහ මූල්‍ය සහාය හා දිරිගැන්වීම් ආදිය අනුසාරයෙන් (සාමය ගොඩ නැගීම සඳහා) ව්‍යාපාරවලින් හවුල්වීම "පණ පොවන්නට" පුළුවන. අවස්ථා ගණනාවකදී සාමයට සහාය වීම සඳහා ව්‍යාපාර අංශය ඇදී යනසුලු ආකර්ශනීය ජයග්‍රාහී අවස්ථා ඒවා වෙත ඉදිරිපත් කර තිබේ.

## සංස්ථාමය සමාජයීය වගකීම් අභ්‍යන්තරීකරණය කිරීමේ සම්මතයන්

සංස්ථාමය සමාජ වගකීම් පිළිබඳ චර්යාවන්ගේ ව්‍යාප්තිය සිද්ධි අධ්‍යයන තොරතුරු මගින් හෙළිවන තවත් ප්‍රවණතාවකි. ප්‍රධාන කොටම එක්තරා මට්ටමක විශාලත්වයකට එළඹ ඇති සමාගම්වලට අදාළ වන සංස්ථානික සමාජයීය වගකීම් පිළිබඳ චර්යාවන් මගින් ගැටුම් හා ආශ්‍රිත ඇතැම් ප්‍රශ්න අරභයා සෘජුවම කටයුතු කිරීමේ රාමුවක් සැපයිය හැකිය. දූෂණය හෝ රැකියාවලට බඳවා ගැනීමේ අසාධාරණ පිළිවෙත් මීට නිදසුනකි - ප්‍රධාන ව්‍යාපාරික කටයුතුවලට අදාළ ප්‍රවේශයන් වෙනස් කිරීම හෝ ප්‍රජාමය සහ දේශපාලන මට්ටම්වල පවත්නා වඩාත් පුළුල් සබඳතා හරහා මෙය ඉටු කරන්නට පුළුවන. ඒ අතරම, ගැටුම්වලට යටින් පවත්නා (ඒවාට හේතුවන) ප්‍රශ්න නිරාකරණය සඳහා ව්‍යාපාරවලට තිබෙන හැකියාව පිළිබඳව පවත්නා ආශුභවාදී සංකල්ප වෙනස් කිරීමේ ප්‍රබල යාන්ත්‍රණයක් ලෙස කටයුතු කිරීමටද සංස්ථාමය සමාජයීය වගකීම් පිළිබඳ මූලධර්මවලට පුළුවන.

## සාම ව්‍යවසායකත්වය හැඩ ගැසෙන්නේ කුමකින්ද ?

ව්‍යාපාර අංශය පෙළඹවුව හොත් ( අභිප්‍රේරණය කළ හොත්) සාමය ගොඩ නැගීම අරභයා එය සතු උනන්දුව නියත ක්‍රියාමාර්ග ලෙස තවදුරටත් පරිණාමය කරවීම සඳහා ඇතැම් අභ්‍යන්තර හා බාහිර සාධකවලට හැකි බව සහ එමගින් එය විසින් අනුගමනය කරනු ලබන ගමන් මාර්ගය තීරණය වන්නට ඉඩ ඇති බවද මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

# අභ්‍යන්තර සාධක

## නායකත්වය

සිද්ධි අධ්‍යයන තොරතුරුවලින් ඉතා වැඩි කොටස අදාළ වනුයේ ව්‍යාපාරික කටයුතුවලට වුවද ජයග්‍රහණයක් සපුරා ගත හැකි වනුයේ එම ව්‍යාපාර මෙහෙයවන ව්‍යාපාරිකයන්ටය. අවසාන වශයෙන් සලකන විට, ඕනෑම සාමය ගොඩ නැගීමේ කාර්යයක සාර්ථක අසාර්ථක බව රඳා පවතින්නේ එය මෙහෙයවන පුද්ගලයන්ගේ පෞද්ගලික ශක්තිය හා කැපවීම මතය. සාමාන්‍යයෙන් ඔවුහු සාමය ගොඩනැගීම උදෙසා වඩාත් පුළුල් භූමිකාවක් ඉටුකිරීම පෞද්ගලික අංශය සතු හැකියාව (පෞද්ගලික අංශය එසේ කළ යුතු බව) පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමට හා සැක කරන අයටද එසේ නියැළිය යුතුයයි ඒත්තු ගැන්විය හැකි: එල්ලවිය හැකි අහිතකර පහරවල් පිළිබඳ බියෙන් තොරව තම බලපෑම් ක්‍රියාත්මක කළ හැකි, තමන්ගේ සහායකයන් හා පුළුල් සමාජය විසින් ගරු කරනු ලබන පුද්ගලයෝ වෙත්.

## සාමූහික ක්‍රියා

පුළුල් අන්දමේ බලපෑම් ගැන සලකන විට, දේශපාලන ක්‍රියාකාරීත්වය වෙත දැක්වෙන බලපෑම උපරිම කරවනු සඳහා හෝ ගැටුම් හා සාමය පිළිබඳව ජනතාව සතු දැනුවත්බව ඉහළදැමීම් සඳහා ව්‍යාපාරික අංශයේ කොටස්වලින් සාමූහික ලෙස කටයුතු කිරීම ඉතාමත් සාර්ථක ආරම්භක පියවර අතරට අයත් වේ. විවිධ අංශයන් එකමුතු කරන වෙළඳ සංගම් වැනි සාමූහික සංවිධාන හරහා අංශ අතර කටයුතුවල නියැලීම වඩාත් ඵලදායක ආරම්භක පියරවල් ලෙස දක්නට ලැබේ. පෞද්ගලික අංශ හරහා කටයුතු කිරීම නිසා කිසියම් ආරම්භක පියවරක විශ්වසනීයබව හා නීත්‍යානුකූල භාවය ශක්තිමත් වීමටද වඩාත් පුළුල් න්‍යාය පත්‍රයක් හා බලපෑමක් ගෙනඒමද පහසුවිය හැකිය. ඒකාබද්ධව හඳුනා ගන්නා ලද අරමුණක් සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් අන්දමේ බෙදාහදාගත් අභිලාෂයන් පිළිබඳ තිබිය යුතු ප්‍රමාණවත් තරම් අවබෝධයක් තුළින් පෞද්ගලික අංශය තුළ පවත්නා තරඟකාරී බලපෑම් ජයගත යුතු වේ.

## නීත්‍යානුකූලභාවය

සෙසු අය සමග ගනු ලබන සාමූහික පියවර හා සහයෝගය ගෙන ඒමට හා ඵලදායක වීමට නම් සාමය ගොඩ නැගීමෙහි නියැලීමට අදහස් කරන අන් ඕනෑම අයකුට මෙන්ම පෞද්ගලික අංශයටද විශ්වාසනීයබව, නීත්‍යානුකූලභාවය හා අවශේෂ අංශවලින් සැලසෙන සහාය තිබිය යුතුය. ගැටුමට අදාළ පාර්ශ්වයන්ගේ මෙන්ම පුළුල් ජනතාවගේද පිළිගැනීම දිනා ගැනීම උදෙසා මෙය ඉතා වැදගත් වේ. යම් යම් ව්‍යවසායයන් විසින් ගැටුම දිග්ගැස්සීම සඳහා කටයුතුකර තිබේ නම් හෝ එසේ කර ඇතැයි යන විශ්වාසයක් පවතී නම් නීත්‍යානුකූල භාවය ලබා ගැනීම පෞද්ගලික අංශයට මුහුණ පාන්නට සිදුවන අභියෝගයක් වන්නට ඉඩ තිබේ. (එබැවින්) ව්‍යාපාරික ප්‍රජාවේ සහයෝගය ලබාගැනීමේ උත්සාහයන්හිදී අහිතකර සංකල්ප ගැනද සලකා බැලිය යුත වේ.

## ගැටුම් විශ්ලේෂණය හා ස්වයං ආවර්ජනය

ගැටුම් පිළිබඳ සංකල්ප බොහෝවිට මනෝමූලය. ඒවා සෙසු අයගේ භූමිකා පිළිබඳව පවත්නා පූර්ව නිගමන හෝ පූර්ව සංකල්ප මත ගොඩනැගුණ ඒවා වන්නට පුළුවන. පෞද්ගලික අංශය තුළ පවත්නා අගතිය දුරලීමට හා ගැටුමට හේතු පිළිබඳ සම්පූර්ණ චිත්‍රයක් ගොඩ නගා ගැනීම පිණිස උනන්දුවක් දක්වන සෙසු පාර්ශ්වයන් සමග පැවැත්වෙන පුළුල් අදහස් හුවමාරුවද ඇතුළත් සියුම් විශ්ලේෂණාත්මක ප්‍රවේශය ආධාර වන්නට ඉඩ තිබේ. සමාජය විසින් පෞද්ගලික අංශයේ භූමිකාව පිළිබඳව ඇති අදහස් හා එහි ගැටුමේ ක්‍රියාකාරීත්වය අතරැති සබඳතා පිළිබඳ මනා වැටහීමක්ද ඊට ඇතුළත් විය යුතුය. ව්‍යාපාර අංශය විසින් සංස්කරණමය පිළිවෙළකට ප්‍රධාන ප්‍රශ්නවලට අත පෙවීම සඳහා එබඳු ස්වයං ආවර්ජන ඉතාමත් තීරණාත්මක වේ. ඒවාට ඇතුළු විය යුත්තේ කොතැනින්දැයි ඒමගින් අනාවරණය වීමට පවා ඉඩ ඇත. බඳවා ගැනීමේ පිළිවෙළ වැඩි දියුණු කිරීම ඊට එක නිදසුනකි.

### පෞද්ගලික අංශයේ විශාලත්වය හා වර්ගය

ව්‍යාපාරයක විශාලත්වය අනුව සාමය ගොඩනැගීම සඳහා එය සහභාගී වීම සහ එසේ නියැලීමට අදහස් කරන වර්ග ක්‍රියාකාරකම් විමද යන්න හැඩ ගැසේ. දේශපාලන මට්ටමේදී සාමයට පක්ෂව සිය බලපෑම ක්‍රියාත්මක කිරීම විශාල පරිමාණයේ සමාගම් විසින් ඉටු කෙරෙන සාමය ගොඩනැගීම් පිළිබඳ ඉතාම තදින් කැපී පෙනෙන නිදසුන් අතරට වැටේ. කෙසේ වුවද කුඩා හෝ ඉතා සුළු පරිමාණයේ ව්‍යාපාර මගින් මධ්‍යම ආණ්ඩුව වෙත කළ හැකි බලපෑම බොහෝවිට ඉතාමත් සීමිත නිසා ඒවායේ බලපෑම වඩාත් ප්‍රාදේශීය එකක් වීමට ඉඩ ඇතත්, ඒවා කිසිසේත්ම සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියෙන් බැහැර කරනු නොලැබේ. එසේ වුවත්, ඒවා බොහෝ විට ස්ථානගත වී තිබෙන්නේ සටන් පෙරමුණුවල බැවින් ඒවායේ දායකත්වයද තීරණාත්මක වන්නට ඉඩ තිබේ.

## බාහිර සාධක

### ව්‍යාපාර පරිසරය

කිසියම් සමාගමක් කටයුතු කරන පරිසරය සාමය සඳහා ඊට දායක වීම පිණිස එය සතු හැකියාව බලපානුලැබේ, කුමන වර්ගවල මැදිහත් වීම්වල නියැලේද යන්නද එයින් තීරණය වේ. ගැටුම නිසා මතුවන අවිනිශ්චිත අනාගතය ආයෝජනයට හා ලාබදායකබවට අදාළ කාල පරාසය හකුළුවයි. ව්‍යාපාරිකයන් තුළ අනාගතය ගැන විශ්වාසයක් නොමැති වුවහොත් සාමය තුළ ආයෝජනය කිරීම දූරස්ථ ප්‍රමුඛත්වයක් ලෙස පෙනෙන්නට ඉඩ ඇත. ඒ අතරම ගැටුමේ බලපෑමට පාත්‍ර වූ බාධාසහිත ව්‍යාපාරික පරිසරය මගින්ද අවස්ථා සැපයෙන්නට ඉඩ තිබේ. උදාහරණ වශයෙන්, වසාදමන ලද දේශ සීමා සහ සිදීගිය ව්‍යාපාරික සබඳතා නිසා වෙළඳාමට පහර වදී, සිද්ධි අධ්‍යයනයෙන් විස්තර වන උත්සාහයන්ගෙන් වැඩි කොටස අයත් වන්නේද මෙකී ඇහිරීම් ජයගැනීමටය.

### දේශපාලන සන්දර්භය

විවෘත ලෙස ගැටුම්වලට අදාළ ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා පවත්නා දේශපාලනමය ඉඩකඩ සීමා වන්නට ඉඩ ඇත්තේය. කුඩා ව්‍යාපාරිකයන්ගේ හඬ හා අභිලාෂයන් බොහෝවිට තීරණ ගන්නා අය විසින් නොසලකා හරිනු ලැබේ. ව්‍යාපාරිකයන් සාම ව්‍යවසායකත්වය සංවර්ධනය කරත් ද නොකරත්ද කරත් නම් එ කෙසේද යන්න වෙත එබඳු ප්‍රශ්න බලපායි. ඒ අතරම, සාම ව්‍යවසායකත්වයද නිරතුරු පරිණාමය වන දේශපාලන සන්දර්භයකට අනුව හැඩ ගැසිය යුතු වේ. ගැටුමට අදාළ පාර්ශ්වයන්ගෙන් සාම මගට පිවිසෙන ලෙස කෙළින්ම කියා සිටීම වැනි ඇතැම් විකල්ප ක්‍රියාත්මක කිරීමට නුපුළුවන් වන්නට ඉඩ තිබෙන ඇතැම් අවස්ථාවන් තිබෙන්නට පුළුවන. මෙබඳු අවස්ථාවලදී, වඩාත් දීර්ඝකාලීන ක්ෂිතිජයක් සහිත විකල්ප හඳුනා ගැනීම අවශ්‍ය විය හැකිය. බාහිර පරිසරය, වෙනස් වූ අවස්ථා හා තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමට ( හා ඒවා මෙහෙයවීමට පවා) සාර්ථක ක්‍රමෝපායයන්ට පුළුවන. සාම ව්‍යවසායකත්වයට අදාළ ප්‍රබලතම උදාහරණ අනුව, ඒවා අනුගමනය කරන්නේ වෙනස් වන සන්දර්භය පිළිබඳ ගැඹුරු අවබෝධය හැඩ ගැසුණු, පෙරමුණු ගණනාවකදී ද සාමය ගොඩනැගීමට දායක වන නම්‍යශීලී මාර්ගයකි.

### බැහැරෙන් සැපයෙන පහසුකම් හා ආධාර

ව්‍යාපාර අංශය සඳහා සාමය ගොඩනැගීමට අදාළ භූමිකාවක් පණ පොවනු සඳහා - ජාත්‍යන්තර සම්පත් දායක ආයතන රාජ්‍ය සංවිධාන හා සිවිල් සමාජයද ඇතුළත් - සෙසු අය විසින් පණ පොවනු සඳහා දරා ඇති ආරම්භකයන් ඵලදායක වී තිබේ. දේශීය පෞද්ගලික අංශය සමග බාහිර ක්‍රියාකාරීන් අන්තර්ක්‍රියා පවත්වන්නේ කෙසේද ගැටුම්වලට ඉඩ ඇති සමාජ තුළ සංවර්ධනය වෙත පිවිසෙන්නේ කෙසේද යන්න පිළිබඳව දේශීය ව්‍යාපාර, දේශීය සාමය මගින් රුස්කර තිබෙන කරුණු බෙහෙවින් වැඩදායක වේ. තීරණාත්මක ප්‍රථම පියවර වනුයේ පෞද්ගලික අංශයේ තිබෙන විවිධ කුඩා කොටස් සහ ගැටුම් අතර තිබෙන්නට ඉඩ ඇති සංකීර්ණ සබඳතාවන් වටහා ගැනීමයි. මේ අනුව සාමයට

දායක වීම සඳහා ඔවුන් සතු විභව හැකියාව ඇගයීමට භාජන වෙයි. පහත සඳහන් වනුයේ ප්‍රයෝජනවත් පිවිසීම් ස්ථාන සමහරකි.

**ගැටුම්වලට සංවේදී ආර්ථික මැදිහත් වීම්.** අද දක්වාම, ආර්ථික වර්ධනය ගෙන ඒමට කටයුතු කරන ජාත්‍යන්තර සංවර්ධන ආයතන කිසිවක් ගැටුම් විශ්ලේෂණය හා සංවේදිතාව තමන්ගේ මැදිහත්වීම්වලට අන්තර්ග්‍රහණය කර නැත. ගැටුම්වලට සංවේදිතාව නොදක්වන මැදිගත්වීම්වලින් ජාතික ආර්ථික මට්ටමේදී එයින් ලැබෙන ප්‍රතිඵලද බැහැරින් පටවා තිබෙන්නක් නොව පෞද්ගලික අංශයටම අයත් දෙයක්ය යන හැඟීම තුළ මුල් බැස ගන්නා බව තහවුරු කරයි.

**සාම ව්‍යවසායකයන් කැඳවීම හා වේදිකාවක් සැපයීම.** අවශේෂ ක්‍රියාකාරීන් හා ව්‍යාපාරිකයන් එකමුතු කිරීම සහ පොදු අභියෝග හා අදහස් ගවේෂණය සඳහා වෙනත් අයුරකින් ඉඩක් නොමැති වේදිකාවක් සපයා දීමේලා බාහිර ආයතනවලට ඉටු කළ හැකි අගනා කාර්ය භාරය ගැන සිද්ධි අධ්‍යයනයන් ගණනාවකින් පැහැදිලි කෙරේ. මෙකී කැඳවුම්කරු සේවය තමන්ගේම විශ්ලේෂණයන් සැකසීමට ව්‍යාපාරයට ඉඩ දෙයි. ජාතික ආර්ථික මට්ටමේදී එයින් ලැබෙන ප්‍රතිඵල බැහැරින් පටවා තිබෙන්නක් නොව පෞද්ගලික අංශයටම අයත් දෙයක්ය යන හැඟීම තුළ මුල් බැස ගන්නා බව තහවුරු කරයි.

**දැනුවත්බව වැඩි දියුණු කිරීම හා ව්‍යාප්ත කිරීම.** ව්‍යාපාර තුළ ගැබ්වී ඇති විභව හිතකර හා අහිතකර බලපෑම් පිළිබඳ දැනුවත් බව උසස් කිරීම මගින් සහාය සැලසීම සඳහා වැඩිදුර මාර්ග ඉදිරිපත් වේ. සාම ක්‍රියාවලියට සහභාගී වීමට තද ඇල්මක් දක්වන ව්‍යාපාරවලට සෙසු ගැටුම් සන්දර්භ වෙතින් ලබාගත් පාඩම් බෙදාහදා ගැනීම අදහස් සපයන මූලාශ්‍රයක් වන්නට ඉඩ තිබේ. ගැටුම නිසා ආර්ථිකයට හා නියත ව්‍යාපාරික අංශවලට අත් විඳින්නට සිදුවන පිරිවැය පිළිබඳ වැඩි දැනුවත් බව සේම සංස්ථාමය සමාජයීය වගකීම පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම මගින්ද සාමය ගොඩනැගීමට අදාළ වඩාත් ගැඹුරු ඉල්ලුම් (අවශ්‍යතා) වටහා ගැනීමට යොමු කරවන අනියම් මාර්ගයක්ද සැපයේ.

**හවුල් කාරත්ව ගොඩනැගීම.** ව්‍යාපාර, සිවිල් සමාජය රජය හා ජාත්‍යන්තර ක්‍රියාකාරීන් අතර ගොඩනැගෙන හවුල් කාරත්ව මගින් පුද්ගලයන්ගේ හා අන්‍යෝන්‍ය ශක්තිය මත ඉදිවන ආරම්භක කටයුතුවල බලපෑම ප්‍රබල වන්නට ඉඩ තිබේ. සාමය ගොඩනැගීම යනු මුහුණත් ගණනාවකින් යුත් පරිශ්‍රමයකි. ඒ නිසා නියත කටයුතුවලදී සම්පත් හා විශේෂඥකුසලතා ගොනු කිරීම අත්‍යවශ්‍ය වේ. උනන්දුවක් දක්වන සෙසු පාර්ශ්වයන්ගේ පිළිගැනීම හා විශ්වාසය දිනා ගැනීම සඳහා මේ ව්‍යාපාරික හවුල් කාරත්ව ආධාර වෙයි.

**හිතකර පරිසර හා ව්‍යාපාරමය ජාල ප්‍රවර්ධනය.** වර්ධනය උත්තේජනය කරනු සඳහා ව්‍යාපාරික පරිසරය තීරණාත්මක වේ. සාම ව්‍යවසායකත්වය පිළිබඳවද එය වැදගත් වෙයි. විශේෂයෙන්ම ව්‍යුහමය ප්‍රශ්න හා දුබල පාලනය පිළිබඳ ගැටලු නිරාකරණය කිරීම සඳහා ව්‍යාපාරවලට ඉටු කළ හැකි ක්‍රියාත්මක කාර්ය භාරය බාහිර ක්‍රියාකාරීන් විසින් හඳුනා ගෙන ඊට සහායවිය යුතුය. සාම ව්‍යවසායකත්වයට සහාය වශයෙන් සාමූහික ව්‍යාපාරමය කටයුතු පහසු කරවීමට හා යොමු කරවීමට වාණිජ මණ්ඩල හෝ අංශමය ප්‍රධාන සංවිධාන වැනි සංවිධාන පද්ධති හා ජාලාවන්ට පුළුවන.

**ගැටුම් හරහා යන ආර්ථික කටයුතු ප්‍රවර්ධනය.** ගැටුම් නිසා වෙන් වී සිටින පාර්ශවයන් අතර පුරුකක් ලෙස කටයුතු කිරීම සඳහා ව්‍යාපාර සතු හැකියාව බාහිර ආධාර ඇසුරෙන් උපරිම කරගත හැකිය. සහයෝගයට බාධා පමුණුවන ව්‍යුහමය බාධක ඉවත් කිරීමෙන්, තොරතුරු බෙදා ගැනීමෙන් හා හුවමාරු සඳහා ආරක්ෂා සහිත ඉඩකඩ සහ අවස්ථා සැපයීමෙන් ගැටුම් අතරතුර නැතිවූ ව්‍යාපාරික සබඳතා හෝ - බොහෝ විට අවිධිමත් ලෙස මතුවන සහයෝගයට අදාළ නව හෝ විභව අවස්ථා ශක්තිමත් කරගන්නට පුළුවන.

සමාජය හෝ ව්‍යාපාරවලින් පවා එහි භූමිකාව වටහා ගෙන තිබෙනුයේ පුරුක් ආර්ථික ඒකක ලෙසිනි. එබැවින් එහි අවධාන කේන්ද්‍රය වූයේ වර්ධනය හා ධන නිර්මාණයයි. නැතහොත්, වඩාත් මෑත කලෙකදී යුද්ධ ආර්ථිකයක් තුළ එහි ගැබ්වී ඇති ගැටුම් දිග්ගස්සන අංශ වෙත අහිතකර ලෙස අවධානය යොමු වී තිබේ. දේශීය ව්‍යාපාර දේශීය සාමය මගින් පෙන්වා දී ඇති පරිදි, සාමය ගොඩ නැගීමේලා දේශීය ව්‍යාපාර අංශය සතු භූමිකාවන් වෙයි. එය අන් ඕනෑම ක්‍රියාකරුවකුගේ භූමිකාව සේම විවිධය, පුළුල්ය එහෙත්, එය ශක්තිය ලබා ගන්නේ විවිධ ප්‍රවීණතා, කුසලතා හා සම්පත් වෙතිනි. මේ අනුව, දේශීය ව්‍යාපාරය දේශීය සාමය මගින් ගොනු කරන ලද දේශීය ව්‍යාපාරිකයන්ගේ අත්දැකීම්වලින් පෙනී යන්නේ නොසලකා හරින ලද එකතුවක් තිබෙන ආකාරයකි. ගැටුම් නිරාකරණය සඳහා පෞද්ගලික අංශය විසින් වඩාත් අපේක්ෂා පූර්වකව හා හිතකර ලෙස සහභාගී වීමට සහාය විය හැකි ව්‍යාපාරිකයන්ට සේම සෙසු අයටද ප්‍රයෝජනවත් පාඩම්, අදහස් හා නිර්දේශ රාශියක් තිබෙන අන්දම මෙම අධ්‍යයනය මගින් මේ පියවර පිළිබඳව කර තිබෙන කරුණු එකතුව හා විශ්ලේෂණය තුළින් පෙන්නුම් කෙරේ. අනාගතයේදී තිරසාර සාමයක් උදෙසා ඔවුන්ගේ වඩාත් ගැඹුරු සහභාගීත්වය පණ පෙවීමට තරම්වන උත්තේජනයක් පාඨකයන්ට ලැබෙයයි ඉන්ටර්නැෂනල් ඇලර්ට් බලාපොරොත්තු වෙයි.

කියවන්නාට සටහන්: ඉන්ටර්නැෂනල් ඇලර්ට් පර්යේෂණ අධ්‍යයනය රටවල් 20 ක් ආවරණය කළද මෙම ප්‍රකාශනයේ සුවිශේෂ වශයෙන් ඉදිරිපත්කරන්නේ සම්පූර්ණ අධ්‍යයනය පිළිබඳ මුල් ප්‍රකාශනයෙන් උපුටා ගත් ශ්‍රී ලාංකීය අධ්‍යයනයන්ය.

# ශ්‍රී ලංකා

## ශ්‍රී ලංකාව: ව්‍යාපාරික අංශය සාමය සඳහා නියමුවෙක් වශයෙන්

මාකස් මේයර් සහ මලීකා සලී

## 1. හැඳින්වීම

ගැටුම් වැළක්වීම හා ගැටුම්වලින් පසු අවධිවල සාමය ගොඩ නැගීම සඳහා ව්‍යාපාරික අංශය (සංවිධාන) මගින් ධනාත්මක භූමිකාවක් රඟ පෑ යුතුය යන අදහස දැන් වැඩි වැඩියෙන් පිළිගැනීමට පාත්‍ර වෙමින් පවතියි. ගැටුම්වලට අදාළ එක් සාධකයක් ලෙස පුද්ගලික අංශය හඳුනා ගෙන ඇතත් සාම ක්‍රියාවලීන් වේගවත් කිරීම සහ ඒවාට ආධාර කිරීම සඳහා ජාත්‍යන්තර හා දේශීය ව්‍යාපාරයන් යොදා ගැනීම සම්බන්ධයෙන් උත්සාහ දරා ඇත්තේ මද වශයෙනි.[1] බොහෝ විට මෙය මෙසේ සිදු වී තිබෙන්නේ ගැටුම් ඇති කිරීමෙන් හා ඒවා පැතිරවීමෙන් ආර්ථික කටයුතුවලට වාසි සැලසුණු සේම ඒ සඳහා ආර්ථික කටයුතු දායක වූ අවස්ථා ද ජාත්‍යන්තර හා දේශීය ප්‍රජාවන් විසින් හුවා දක්වනු ලැබීමේ ප්‍රවණතාව පවත්නා හෙයිනි. සාම ක්‍රියාදාමයන් ඉදිරියට ගෙන යෑමේලා ව්‍යාපාරික ක්‍රියාකාරීන් වඩාත් ධනාත්මක භූමිකාවක් "රඟ පෑ " උදාහරණ සම්බන්ධයෙන් කර ඇති පර්යේෂණ ප්‍රමාණවත් නොවේ.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ව්‍යාපාරික අංශය හා ගැටුම් පිළිබඳව දැනට තිබෙන ප්‍රකාශනවල අදාල බව මෙම වාර්තා විභාග කර බලයි. සාපේක්ෂ වශයෙන් රටට අලුත් සංකල්පයක් වුවද වඩ වඩා අවධානය ඇදගන්නා සංකල්පයක් වන පුළුල් සංස්ථාමය සමාජයීය වගකීම පිළිබඳ අංශයෙන් සලකන විට ශ්‍රී ලංකාව තුළ මත ගැටුම් නිරාකරණය හා සාමය ගොඩනැගීම සඳහා ව්‍යාපාරික අංශය තුළ ඇති වර්තමාන භූමිකාව පිළිබඳ පර්යේෂණාත්මක සොයා ගැනීම්ද එයින් ඉදිරිපත් කෙරේ. ගතවූ අවුරුදු කීපය තුළදී තරමක ජවයක් ලබා සිටින, ව්‍යාපාර මගින් මෙහෙයවුණු සාම ක්‍රියාවලි දෙකක් එය ඉදිරිපත් කරයි. මින් පළමුවැන්න ශ්‍රී ලංකාව පළමුව යන්න වේ. මෙය කොළඹ මූලස්ථානය කරගෙන සිටින විශාල ව්‍යාපාර මගින් කරන ලද සාම පාක්ෂික පෙළඹීම් ක්‍රියා මාලාවකි. දෙවැන්න සාම සන්ධානයක් සඳහා ව්‍යාපාරය නම්. මෙය දීප ව්‍යාප්ත වාණිජ සංගම් ජාලාවකි. එමගින් රටපුරා පලාත්බදව සිටින ව්‍යාපාරිකයන් අතර විශ්වාසය හා සබඳතා ගොඩනගනු ලැබේ.

මෙකී උදාහරණ තුළින් හා සාමය සහ ගැටුම අරබයා පුළුල් ව්‍යාපාරික ප්‍රජාවගේ ආකල්පය මගින් වඩාත් පුළුල් අධ්‍යාපනයක් ජනිත කරවනු සඳහා විෂයයන් කීපයක් පිළිබඳව ව්‍යාපාර අංශය සතු අදහස් උදහස් මැන ගැනීම පිණිස පර්යේෂණයක් පවත්වන ලදී ක්ෂණික

අවධානය යොමු විය යුතු පුළුල් සමාජ ප්‍රශ්න, ව්‍යාපාරික ප්‍රජාව වෙත ගැටුම බලපා තිබෙන ආකාරය, ශ්‍රී ලංකාව තුළ සාමය ගොඩනැගීමේ වගකීම දරන්නේ කවුද සහ සාමය වෙනුවෙන් මැදිහත් වීමට ව්‍යාපාරිකයන් පෙළඹෙන්නේ කුමන සාධක ඇසුරෙන්ද යන මේ කරුණ ඊට අයත් විය.

මුලින්ම පර්යේෂණය පවත්වන ලද්දේ අදාල ද්විතියක මූලාශ්‍රයන් කාර්යාලය තුළදී සමාලෝචනය කිරීමෙනි. ඊට පසු, තෝරා ගත් තොරතුරු සපයන්නන් සමග තත්වමය වශයෙන් ව්‍යුහගත පුද්ගලික සාකච්ඡා මාලාවක් පවත්වන ලදි. කොළඹ මුල් කරගත් විශාල ව්‍යාපාරික නියෝජිතයෝ **20** ක් හා ගාල්ල, මහනුවර හා ත්‍රිකුණාමලය යන පළාත්වලින් තෝරාගත් ව්‍යාපාරික නියෝජිතයන් දස දෙනකුත් මීට අයත් වූහ. අවසාන වශයෙන්, කොළඹ සිටින කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාර හිමියන් 150 ක අයිතිකරුවන් හෝ කළමනාකරුවන් සමගද ප්‍රමාණාත්මක සමීක්ෂණයක් පැවැත්විණ. සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් අතරින් 63.3% සිංහලයෝ වූහ. 12.7% ක් දෙමළ හා 24% ක් මුස්ලිම් අය වූහ. එකිනෙක ව්‍යාපාරයේ සේවක සංඛ්‍යාව 1-21 දක්වා විය. එක් සමාගමකට වැටෙන සාමාන්‍ය සේවක ගණන 4.3% කි. සිල්ලර කඩ, සන්නිවේදන හා වීඩියෝ වෙළඳසැල්, රත්රිදී ආභරණ වෙළඳසැල්, කුඩා ඖෂධ වෙළඳසැල්, කුඩා ආපන ශාලා, රෙදිපිළි වෙළඳසැල්, නිෂ්පාදන සාප්පු, යකඩ බඩු සාප්පු හා විවිධ අවිධිමත් සේවා සපයන ආයතන මේ සංඛ්‍යාවට ඇතුළත් විය. කුඩා ව්‍යාපාර අතරින් විශාල බහුතරයක් වන 68% ක් විසින්ම සේවයෙහි යොදවා ගනු ලැබයේ තමන්ගේම ජන වර්ගයට අයත් පුද්ගලයන් පමණි. 25% ක දෙවර්ගයකට අයත් සේවකයෝ වූහ. තුන් වර්ගයේම සේවකයන් සිටියේ 7% ක පමණකි. අවසාන වශයෙන්, විශ්ලේෂණය සාරවත් කරනු සඳහා පර්යේෂණය මුළුල්ලේදීම, ප්‍රධාන තොරතුරු සැපයුම් කරුවන් සමග සාකච්ඡා පවත්වන ලදී. ගැටුම් අධ්‍යයනය හෝ ඒ පිළිබඳ මත ඉදිරිපත් කිරීම ගැන ක්‍රියාත්මක ලෙස හවුල් වී සිටීම හා ඔවුන්ගේ අධ්‍යාපන පසුබිම යන මේ කරුණු මත ඔවුහු තෝරා ගන්නා ලදහ.

ශ්‍රී ලංකාව ඉන්දියානු උප මහාද්වීපයේ දකුණු, කොනට දකුණේ පිටිහි කුඩා රටකි. ජාතික සංඛ්‍යා ලේඛන අනුව, 2004[2] දී රටේ ජන සංඛ්‍යාව මිලියන 19.4 ක් විය. ඉන් බහුතරය මුළු සංඛ්‍යාවෙන් 81.9% ක් වන සිංහලයෝය. දෙමළ සුළු පිරිස 9.4% කි මුස්ලිම්වරු 8.1% කි. මීට අමතරව සුළු වශයෙන් සිටින තවත් ජන වාර්ගිකයෝද වෙත්. බ්‍රිතාන්‍යයෙන් නිදහස ලබා ගැනීමෙන් පසු, සාක්ෂරභාවය, ජීවිතාපේක්ෂාව, ජනගහන වර්ධන වේගය පහත බැසීම හා පහත් පෙළේ ළදරු මරණ අනුපාතය ආදී සමාජ දර්ශක අනුව පෙනෙන පරිදි ශ්‍රී ලංකාව විශාල කීර්තියක් හිමි කරගෙන තිබේ.[3]

වර්තමානයෙහි, දේශපාලන හා සමාජ ගැටුම් ගණනාවකට මුහුණ දෙන්නට ශ්‍රී ලංකාවට සිදුවී ඇත්තේය. දරුණු අන්දමේ ප්‍රචණ්ඩත්වය සහ අඛණ්ඩව පවත්නා දේශපාලන අස්ථාවරබවද මෙහිම නිසැගි ලක්ෂණයකි. ආයුධ සන්නද්ධ කැරලි කෝලාහල, සංවිධානාත්මක රාජ්‍ය භීෂණය සහ බෙදුම්වාදී අරගලයක්ද නිසා සංවර්ධන ජයග්‍රහණයන් අබිබවා යන අයුරින් රටේ සමාජ ආර්ථික ව්‍යුහයට හානි සිදුවී තිබේ. ඊටත් වඩා ශ්‍රී ලංකාවද 2004 දෙසැම්බර් 26 වැනි දින සිදු වූ සුනාමියෙන් තදින් විපතට පත් රටකි. මේ ව්‍යසන නිසා ජීවිත 35,000 කට අධික සංඛ්‍යාවක් මරුමුවට පත් විය. නැති වූවන්ගේ ගණන 4000 ඉක්මවයි. මිනිසුන් 550,000 කට නිවාස අහිමි විය. සුනාමිය නිසා මිනිසුන්ට අති උග්‍ර දුක් වේදනා ඇති වුවා පමණක් නොව, ශ්‍රී ලංකාවේ මුහුදු තීරයෙන් තුනෙන් දෙකකටත් වැඩි භූමි භාගයක දේපලවලටද විශාල හානියක් සිදුවිය.

## 1.1 ශ්‍රී ලංකාවේ ගැටුම

දශක තුනකටත් වැඩි කාලයක් පුරා ශ්‍රී ලංකාව ප්‍රචණ්ඩ ගැටුම් වලට පාත්‍ර වී පවතියි. වර්ෂ 1971 දී ද යළිත් 1988-89 දී ද රටේ දකුණු ප්‍රදේශවල රාජ්‍ය විරෝධී කැරලි පැන නැගුණේය. මේවා මෙහෙයවන ලද්දේ ජනතා විමුක්ති පෙරමුණට අයත් සිංහල තරුණයන් විසිනි.

රජය ඊට ප්‍රතික්‍රියා දැක්වූයේ ඉතාමත් මෘග අන්දමිනි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 60,000 කට අධික සංඛ්‍යාවක් අතුරුදහන් වූහ[4]. පසුව දේශපාලන භූමියට අවතීර්ණ වූ ජනතා විමුක්ති පෙරමුණ දැන් ක්‍රියාකරී භූමිකාවක නිරතවෙයි. උතුරු හා නැගෙනහිර පෙදෙස්වල කොටි සංවිධානය විසින් 1980 මුල් අවධියේ සිට බෙදුම්වාදී ව්‍යාපාරයක් දියත් කර තිබේ. මෙම ව්‍යාපාර දෙකම ක්‍රියාත්මකව ඇත්තේ අසාධාරණ හා අගතිගාමී ලෙස වටහා ගෙන ඇති හෝ අත්දැක ඇති ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් ලෙස ජනිත වූ රජයට එරෙහි ප්‍රතික්‍රියාවන් ලෙසිනි.[5]

එසේ වුවද රජය හා කොටි සංවිධානය අතර පැන නැගී තිබෙන ගැටුම වර්ගවාදී යුද්ධයක් ලෙසද හැඳින්වේ. දෙමළ කණ්ඩායම් ආයුධ සන්නද්ධ ප්‍රචණ්ඩ ක්‍රියාවලට පෙළඹීමට හේතු මෙසේයයි සලකනු ලැබේ: 1957 දී සිංහල රාජ්‍ය භාෂාව බවට පත් කිරීම, ඒ නිසා එය රාජ්‍ය සේවය සඳහා පූර්ව අවශ්‍යතාවක් බවට පත් වීම, ඉඩම් බෙදීම හා රජයේ ආධාර සහිතව උතුරු නැගෙනහිර ප්‍රදේශවල සිංහල ජනාවාස ඇරඹීම, දෙමළ බහුතරය සිටින පෙදෙස්වල සීමා යළි ලකුණු කිරීම හා 1983 දී කොටි සංවිධානය විසින් සොල්දාදුවන් 13 දෙනෙකු ඝාතනය කිරීමෙන් පසු රජයේ ආධාර සහිතව දෙමළ ජනතාවගේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම.[6]

දශක දෙකක් තිස්සේ රජය ප්‍රධාන වශයෙන්ම තැත්කලේ ප්‍රශ්නය සඳහා යුදමය විසඳුමක් ලබා ගැනීමටය. ඒ නිසා යුදමය බල තුලිතතාව වඩ වඩා වැදගත් විය. මේ වන විට යාපනය හැර උතුරු නැගෙනහිර අභ්‍යන්තර ප්‍රදේශවලින් වැඩි කොටස කොටි සංවිධානයේ පාලනය යටතේ පවතී. මෙයින් බැහැර වනුයේ කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්කයි. රජය විසින් වෙරළාශ්‍රිත පෙදෙස් පාලනය වේ. 1990 දී මුස්ලිම්වරුන් බලයෙන් පලවා හැරීමෙන් පසු ඔවුන්ද වැදගත් දේශපාලන සාධකයක් බවට පත්ව ඇත්තේය. ඒ අනුව, ඔවුහුද දේශපාලන ක්‍රියාවලියේදී වඩාත් වැදගත් කොටසක් රඟ පාන්නට වී සිටිත්. සෘජු සාම කතාබහ 1995 දී බිඳ වැටුණද 2002 දී නෝර්වේ රටේ මැදිහත් වීම සහිතව සටන් විරාමයක් අත්සන් කරන ලදී. කොටි සංවිධානයේ නායකත්වය යටතේ ප්‍රදානය කළ යුතු ස්වයං පාලනය කෙබඳු බලතල සහිත විය යුතුද යන්න(ස්වරූපය) පිළිබඳ මතභේද නිසා 2003 අප්‍රේල් මාසයේදී සාම සාකච්ඡා යළි බිඳ වැටුනේය. ඊට පසු දෙපාර්ශ්වය විසින්ම - වැඩිපුරම කොටි සංවිධානය විසින් - සටන් විරාමය උල්ලංඝනය කරන ලදී. දැන් එම සංවිධානය යළිත් ආයුධ සන්නද්ධ වෙමින් සිටිතැයි වාර්තාවේ. මේ අභියෝග පැමිණියද 2004 අප්‍රේල් මාසයේදී සිදු වූ දේශපාලන වෙනස්වීම ඉදිරියේ පවා දෙපාර්ශ්වය විසින්ම සටන් විරාමය පවත්වාගෙන අවුත් තිබේ.

මෙයින් මද කලකට පෙර කොටි සංවිධානයේ නැගෙනහිර පෙදෙස් නායකයා විසින් බිඳී වෙන්වූයේ සංවිධානය ප්‍රාදේශීය වශයෙන් වෙනස්කම් කරන්නේය යන චෝදනාව මතය. මේ නිසා නැගෙනහිර ප්‍රදේශවල තත්වය නොසන්සුන් විය. දෙපාර්ශ්ව අතර **2004** දී වරින් වර ගැටුම්ද මතුවිය. කැරලිකාර කණ්ඩායම විසුරුවා හැර ඇතත් නැගෙනහිර ප්‍රදේශය පුරාම වරින් වර සැලසුම් කළ මිනිස් ඝාතන, අවිධිමත් මිනී මැරුම්, අත්බෝම්බ පිපිරීම් හා ඉඳහිට අවිගැටුම්ද පවතියි. ජනතා සංධානය හා ජනතා විමුක්ති පෙරමුණ යන සංවිධාන යුවලේ හවුල් පෙරමුණක් වූ නව රජය විසින් ආර්ථික ප්‍රතිසංස්කරණ හා **2004** තුළ සිදුවූ සාම ක්‍රියාවලිය පිළිබඳව පැන නැගී තිබූ පුළුල් නොසතුට උපයෝගී කරගනු ලැබීය. මේ නිසා සටන් විරාමය සහ සාම සාකච්ඡා යළි ඇරඹීම පිළිබඳ ජාතික කැපවීමද දුබල විය. මෑතදී සිදුවූ සුනාමි ව්‍යසනය සහ ආධාර බෙදා හැරීම පිළිබඳ පැන නැගුණු උග්‍ර මතභේද නිසා රජය හා කොටි සංවිධානය අතර සබඳතා අයහපත් අතට හැරීමකටද තුඩු දුන්නේය. 2005 නොවැම්බර් මස පැවැත්වූ ජනාධිපතිවරණ ඡන්දයේ සිට මේ දක්වාම තත්වය දිගින් දිගටම අයහපත් වෙමින් තිබේ.

මේ ගැටුම් ද්විත්වය නිසා, ප්‍රාදේශීය හා ජාතික මට්ටම්වල ඉමහත් වධහිංසා සහ විනාශයන් සිදුවී තිබේ. ගැටුම් ආශ්‍රිත සිද්ධීන් නිසා මිනිසුන් භාවික හා සමාජයීය වශයෙන් පීඩාවට පත්වන අතර, මේ අත්දැකීම්වල ද්‍රව්‍යමය හා ආර්ථික අංශද සිත් තැවුල් සඳහා ප්‍රාථමික සාධකයක් වී තිබේ.[7] අලුත් මිනිස් කණ්ඩායම් බිහිවීම, කලින් සිටි අය බිඳී යෑම හා කණ්ඩායම්

අතර සබඳතා ශක්තිමත් වීම හෝ දුබලවීම යන මේවායේ ප්‍රතිඵලයක් වශයෙන් පැන නැගී තිබෙන අනාරක්ෂිත භාවය, වියවුල් සහිත ස්වභාවය හා හානි පැමිණීමට ඇති වැඩි ඉඩකඩ පිළිබඳව පැතිර පවත්නා හැඟීම නිසා සමාජ හා ප්‍රජාමය සබඳතාවන්ට හානි පැමිණ ඇත්තේය.[8] ගැටුම නිසා සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ දේශපාලන සමාජයීය හා නීතිමය හිමිකම් ක්ෂය වී තිබේ.[9] ඒ නිසා, භෞතික හා සමාජයීය උපව්‍යුහයන්ට හානි පැමිණ ඇත්තේය ආර්ථික අවස්ථා හීනවී ගොස් තිබේ. ආයෝජකයන්ගේ විශ්වාසය ගිලිහී ගොස්ය, ජාතික සම්පත් සංවර්ධනයට නොව යුදමය කටයුතුවලට යොමු වී තිබේ. වගා කළ හැකි ඉඩම් හා සෙසු සම්පත් නැතිවී ගොස්ය. ජනතාවගෙන් විශාල සංඛ්‍යාවක් අවතැන් වී ගොස් සහනාධාර මත යැපෙති.[10]

2004 දෙසැම්බර් මාසය වන විට බංකොලොත් වීමට ආසන්නව පැවති රජයට සුනාමිය නිසා සැලසුණු මුදල්මය හා ද්‍රව්‍යමය ආධාර නිසා රජය ස්ථාවර වූයෙන් එය බල සමතුලිතතාවය වෙතද බලපෑවේය.[11] තදින්ම පහර වැදුණේ උතුරු නැගෙනහිර ප්‍රදේශවලටය. මුළු මරණ සංඛ්‍යාවෙන් හා අවතැන් වූවන්ගෙන් තුනෙන් දෙකකටත් වඩා අයත් වූයේ මේ පෙදෙසටය. එමගින්, දිගු කලක සිට පවත්නා ගැටුම්වල අහිතකර ප්‍රතිඵලද තවත් උග්‍ර විය. සමස්තයක් වශයෙන් සලකන විට සුනාමියේ ආර්ථික බලපෑම එතරම් විශාල වේයයි බලාපොරොත්තු නුවූවද දරිද්‍රතාව සහ තදාසන්න බලපෑමට ගොදුරු වූ ප්‍රදේශවල අසමානතාව වැඩි වී යන්නට ඉඩ ඇතැයි අපේක්ෂිතය.[12]

එබැවින්, සුනාමිය නිසා, ඉතා දුබල සටන් විරාම සම්මුතිය වෙත නව අභියෝග එල්ල වූ බව පෙනේ. පළමුවෙන්ම - සුනාමියට භාජනය වූ ප්‍රජාවන්ට ප්‍රමුඛත්වය ලැබීමෙන් (එහෙත් ඔවුන් ජීවත් වන්නේද සුනාමියෙන් හානි නොවූවද ඉතා දිළිඳු, ගැටුම්වලට පාත්‍ර වූ ප්‍රජාවන්ට සමීපවය) දෙවනුව පුනරුත්ථාපන පරිශ්‍රමයන්හිදී රජය හා කොටි සංවිධානය යන දෙකම වඩාත් මධ්‍යගත ක්‍රියා මාර්ග දෙසට යොමු කරවීමෙන් වාර්ගික ගැටුම් සඳහා යෝජිත දේශපාලන විසඳුම්වල වැදගත් අවශ්‍යතාවක් වන ප්‍රාදේශීය හා කලාපීය හැකියාවන් ශක්තිමත් කිරීමේ ප්‍රතිපත්තියට ප්‍රතිවිරුද්ධ දිසාවට යොමු වීමක් වේ.[13]

## 1.2 ශ්‍රී ලංකාවේ ආර්ථිකය

රජය විසින් පාලනය කරනු ලැබූ ආර්ථිකය අරබයා පුළුල් වශයෙන් පැතිර තිබූ අසතුටෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1977 දී ආර්ථිකය නිදහස් කිරීමේ ප්‍රතිපත්ති වැළඳගත් ප්‍රථම දකුණු ආසියාතික රාජ්‍යයබවට ශ්‍රී ලංකාව පත්විය.[14] රජය විසින් විදේශ වෙළඳාම හා විනිමය පාලනය ලිහිල් කරවනු ලැබිය. මිල පද්ධති හා පොලී පිළිබඳ උපරිම සීමා පරිපාලනය කරන ලදී. කෙසේ වුවද, මේ අයුරින් කලින්ම අරඹන ලද නමුදු අපිළිවෙළේ, අක්‍රමවත් ලෙස ක්‍රියාත්මක වන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය දීර්ඝකාලීන දැක්මක් රහිත වීමේ දුබලතාවෙන් පෙළේ. අපනයන ප්‍රමුඛ වර්ධන ආදර්ශ රූපය 1977-94 තුළදී අනුක්‍රමයෙන් පුද්ගලික අංශය විසින් මෙහෙයවුණු වර්ධනයක් වෙත යොමු වූවද මෙහි දෙවනුව සඳහන් ක්‍රියා පිළිවෙළ උදෙසා පසුව පැවති රජයන් වෙතින් පැහැදිලි ස්ථාවර සංඥාවක් නොලැබුණේය. පාඩු විඳින රාජ්‍ය ව්‍යවසායයන් හා තදින්ම කාර්යාල පෙළන්ති ස්වරූපයේ පරිපාලන ක්‍රමය වැනි මූලික ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා එතරම් වැදගත් දෙයක් කරනු නොලැබිණ. ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවල ප්‍රමාණය හා ස්වභාවය පිළිබඳව පැහැදිලි සංඥාවක් පුද්ගලික අංශයට නොසැපයීම සේම මෙකී ප්‍රතිපත්තිවල අපිළිවෙළ නිසා අවිනිශ්චිත පරිසරයක් බිහිවිය. ශ්‍රම පිරිවැය සහ නිෂ්පාදකතාව ඇසුරෙන් බලන විට, මෙම පරිසරය කිසිම ප්‍රතිසංස්කරණයක් නොමැති වීමට වඩා හානිකර වේ යයි ශ්‍රී ලංකා මහ බැංකුව කල්පනා කරයි.[15]

වර්ෂ 1995 පටන් පුද්ගලිකරණය හා ප්‍රතිව්‍යුහකරණය ගැන අඛණ්ඩ අවධාරණයක්, පවතියි. මෙය තරමක් දුරට පැන නගිනුයේ ජාත්‍යන්තර ආධාරවලට අමුණා තිබෙන

කොන්දේසි ඇසුරෙනි. කෙසේ වුවද පසුගිය පස් වසර තුළදී රාජ්‍ය ආයතන පුද්ගලීකරණය හා ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ උත්සාහයන් ගැන වෘත්තීය සමිති වෙතින් අභියෝග එල්ල වී තිබේ.

සුනාමිය නිසා පුළුල් ආර්ථික දෘෂ්ටිය වෙනස් වී ඇතැයි ද යළි ඉදිකිරීම් හා සහන සැලසීම් ස්වරූපයෙන් ඉදිරිපත් වන නව අභියෝග ඉස්මතු වී තිබේයයිද මහ බැංකුව විසින් හඳුනාගෙන තිබේ.[16] **2005** වසර තුළදී ආර්ථිකයෙහි පසු බෑමක් පැන නැගුණද එය එතරම් ප්‍රබල නොවන්නේ සුනාමිය නිසා තදින්ම හානියට පත් වූයේ ධීවර කර්මාන්තය හා සංචාරක ව්‍යාපාරය බැවිනි. දළ දේශීය නිෂ්පාදනය වෙත ඒවා මගින් සැලසෙන (අඩු වී ගිය) දායකත්වය වර්ධනය වූ යළි ඉදිකිරීම්වලින් තරමක් දුරට පියවී යයි. මහ බැංකු ඇස්තමේන්තු අනුව සුනාමියෙන් සිදු වූ මුළු හානිය ඇමෙරිකන් ඩොලර් බිලියනයක් (දළ දේශීය නිෂ්පාදනයෙන් 3.9% ක් පමණ වේ. මේ අතර තුන් අවුරුදු යළි ඉදිකිරීම් වැඩ සටහන මගින් ඇමරිකානු ඩොලර් බිලියන 1.8% ක් පමණ (දළ දේශීය නිෂ්පාදනයෙන් 8.9% ක්) ජනිත වේයයි අපේක්ෂිතය.[17]

### 1.2.1 වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතය හා වර්ධන අනුපාතය

සත්‍ය දළ දේශීය නිෂ්පාදනය ඇසුරෙන් සලකන විට 2003 දී 6% ක් ව පැවති ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය 2004 දී 5.4% ක් විය. (වගු අංක 1 බලන්න) අපනයන, පරිභෝජනය හා ආයෝජනය සහ සටන් විරාමය දිගටම පැවැත්ම යන මේවා වර්ධනයට ආධාර විය. අහිතකර කාලගුණ තත්වයන් හා යල් පැනගිය යටිතල පහසුකම්වල ප්‍රතිඵලයක් වශයෙන් ජනිත වූ කෘෂිකාර්මික හා විදුලිය ජනන උප අංශවල දුබල ක්‍රියාකාරිත්වය නිසා **2003** සිට වර්ධන වේගය හීන වූ බව සලකනු ලැබේ. වර්ෂ 2004 දී සාමාන්‍ය උද්ධමන වර්ධන අනුපාතය 7.9% කින් ඉහළ ගියේය.[18] සේවා, කර්මාන්ත හා කෘෂිකර්මය ආර්ථිකයේ ප්‍රධාන අංශ අතරට වැටේ.

වගුව 1: දළ දේශීය වර්ධන අනුපාතය

| 1990 | 1992 | 1993 | 1994 | 1995 | 1996 | 1997 | 1998 | 1999 | 2000 | 2001 | 2002 | 2003 | 2004 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4.6 | 4.3 | 6.9 | 5.6 | 5.5 | 3.8 | 6.3 | 4.7 | 4.3 | 6.0 | -1.4 | 4.0 | 6.0 | 5.4 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව 2004

### 1.2.2 රැකියා සහ ශ්‍රම බලකාය

රැකියා කරන මිලියන 7.3 කින් සහ රැකියා විරහිත 0.7 කින් ශ්‍රම බලකාය සමන්විත වේ. මේ අනුව විරැකියා අනුපාතය 8.5% කි.[19] තේ අපනයනය, ඇඟලුම් හා ගෘහ සේවිකා යන ශ්‍රී ලංකාවේ මුළු විදේශ විනිමය ආදායමෙන් 90% ක් උපයා දෙන ප්‍රධාන ක්ෂේත්‍රවල ප්‍රමුඛ ස්ථානය දරන්නේ ස්ත්‍රීන් විසිනි.

වර්ෂ 2004 දී පිරිමින් අතර විරැකියාව 6.3% ක් හා ස්ත්‍රීන් අතර 13.2% ක් විය.[20] වයස අවුරුදු 20 -29 අතර සමූහයේ විරැකියාව 19.7% ක් සහ 15-19 අතර 30.6% ක් විය. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) මට්ටමේ සහ ඉන් ඉහළ සුදුසුකම් සහිත අය අතර විරැකියාව 18.2% ක් විය.

ශ්‍රී ලංකාවේ රැකියා රහිත මුළු ගණනින් 71% ක් පමණ අවුරුදු 14-24[21] අතර වයස්වල අය වෙති. රැකියා රහිත, අවුරුදු 15-29% අතර වයසේ සිටින අයගෙන් අඩක් පමණ රැකියා

සොයමින් සිටින්නෝ වෙති.[22] එබැවින්, ශ්‍රී ලංකාවේ සමාජ දේශපාලන ස්ථාවරත්වය රඳා පවත්නේ තරුණ පරපුරට රැකියා සැපයීමට අදාළ පලදායක කඩිනම් ප්‍රතිපත්ති ක්‍රියාත්විත කිරීම මතය.

### 1.2.3 දළ දේශීය නිෂ්පාදිතය පළාත් වශයෙන් බෙදී යන අන්දම

ගත වූ දශක ගණනාව තුළ දක්නට ලැබුණු පරිදිම, 2004 තුළදී ද දළ දේශීය නිෂ්පාදනය වෙත බස්නාහිර පළාතෙන් සැපයුණු දායකත්වය 49% කි.[23] (බලන්න වගුව 2) වඩාත් යහපත් සමාජ ආර්ථික හා භෞතික යටිතල පහසුකම් නිසා ආර්ථික කටයුතුද බස්නාහිර පෙදෙස තුළ කේන්ද්‍රගත වී තිබේ. දළ දේශීය නිෂ්පාදන දායකත්වයට අදාළව ප්‍රාදේශීය වශයෙන් දක්නට ලැබෙන විෂමතාවන්ට හේතුවී ඇත්තේ මහා මාර්ග, විදුලිය, සන්නිවේදන හා අවශේෂ පහසුකම්වල අසමානතාවත් නිසා බව පෙනී යයි. ඇත්ත වශයෙන්ම පළාත් අනුව කරන ලද සැසඳීමකින් පෙනෙන පරිදි, ඇමරිකානු ඩොලර් 1000 ඒක පුද්ගල ආදායම ඉක්මවන්නේ බස්නාහිර පළාත පමණි. ඇතැම් පළාත්වල ඒක පුද්ගල ආදායම තවමත් අමෙරිකානු ඩොලර් 500ට පහළ මට්ටමක පවතියි.

**වගුව 2: දළ දේශීය නිෂ්පාදන කොටස-පළාත් අනුව 1990-2000**

| | 1990 | 1992 | 1994 | 1996 | 1998 | 2000 |
|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 40.2 | 41.4 | 41.9 | 43.5 | 45 | 49.4 |
| වයඹ | 11.1 | 9.9 | 9.8 | 11.3 | 12.0 | 10.4 |
| මධ්‍යම | 12.1 | 11.8 | 11.7 | 10.6 | 10.3 | 9.9 |
| දකුණ | 9.5 | 9.6 | 9.6 | 8.9 | 9.2 | 9.3 |
| සබරගමුව | 8.1 | 7.6 | 7.8 | 9.1 | 6.7 | 6.7 |
| නැගෙනහිර | 4.2 | 4.7 | 4.5 | 4.8 | 5.5 | 4.5 |
| ඌව | 8.1 | 7.6 | 7.8 | 5.0 | 4.9 | 4.0 |
| උතුරුමැද | 4.8 | 6.0 | 6.3 | 4.5 | 3.6 | 3.8 |
| උතුර | 4.4 | 3.6 | 3.2 | 2.4 | 2.8 | 2.1 |

මූලාශ්‍රය: සර්වනන්දන්, 2005

මෙබඳු භූගෝලීය විෂමතාවන් තුළ බරපතල සමාජමය වැදගත්කම් අඩංගු වේ. මේ අසමානතාවත් හා ව්‍යූහමය වශයෙන් වෙනස්කම් කර තිබේය යන විශ්වාසයද උතුරු නැගෙනහිර හා දකුණේ සන්නද්ධ අරගලවලට තදින් දායක වී තිබෙන සැටියක් පෙනේ.[24]

## 1.3 ආර්ථිකය කෙරෙහි ගැටුම්වල බලපෑම

දළ දේශීය නිෂ්පාදනයට දායකවීම පිළිබඳව උතුර හා නැගෙනහිර පළාත් සතු හැකියාව වෙත ආයුධ සන්නද්ධ ගැටුම් ඉතා අහිතකර ලෙස බලපෑවේය.[25] පළාත් දෙකම, 1990 සිට විනාශකාරී ආර්ථික තහංචියකින්ද පීඩාවට පත්විය. මෙම ප්‍රදේශය ප්‍රධාන වශයෙන්ම කෘෂිකාර්මික කටයුතුවලින් යැපෙන්නකි. එහි ප්‍රමුඛත්වය උසුලන්නේ ආහාර බෝග වගාව, ධීවර කර්මාන්තය හා සත්ව පාලනයයි. තහංචිය නිසා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ඖෂධ, කෘෂි යෙදවුම් හා ආශ්‍රිත කටයුතු තදින් සීමා විය. ඊටත් වඩා, ආරක්ෂක හේතු මත මසුන් ඇල්ලීම සඳහා අවසර දෙන ලද්දේ නියමිත වේලාවන් හා වෙරළේ සිට නියමිත දුර ඇතුළතය. ඊට

අමතරව, කොටි සංවිධානය මගින් පනවා තිබූ නීති විරෝධි බදු සහ කප්පම් ගැනීම් හා රාජ්‍ය ව්‍යුහයන්ගේ දූෂණයද නිෂ්පාදකතාවේ පරිහානියට දායක විය. ආයුධ සන්නද්ධ ගැටුම ජාති මට්ටමේදී ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් අති විශාල ආර්ථික පාඩුවලට හේතු වී ඇත්තේය. හුදු ආර්ථික පිරිවැය පදනම් කර ගනිමින්, 2000 දී පවත්වන ලද ආර්ථික විශ්ලේෂනයකට අනුව 1996 තෙක් යුද්ධය සඳහා වූ මුළු වැය ප්‍රමාණය 1996 මිල ගණන් අනුව ඇමරිකානු ඩොලර් බිලියන 12 ක් ලෙස තක්සේරු කොට තිබුනේය. (මෙය 1996 දළ දේශීය නිෂ්පාදනයෙන් 168.5% කි.)[26] මේ විශ්ලේෂණයේදී එහි කර්තෘවරු සෘජු හා අනියම් යන පිරිවැය දෙවර්ගයම ඊට ඇතුළත් කළහ. සටන්වැදී සිටි පාර්ශ්වයන්ගේ යුද්ධ වියදම, අහිමි වූ යටිතල පහසුකම්වල පිරිවැය හා මානව සහන සැලසීම සඳහා රජය දැරූ වියදම යන මේවා සෘජු පිරිවැයවලට අයත් විය. අත්හැර දමන ලද ආයෝජනවලින් ලැබිය හැකිව තිබූ ආදායම, අඩු වූ සංචාරක පැමිණීම්, නැති වී ගිය මානව ප්‍රාග්ධනය (මරණ, තුවාල වීම් හා අවතැන්වීම්) නැති වුණු විදේශීය ආයෝජන හා උතුරු පළාතෙන් නොලැබුණු නිපැයුම් යන මේවා අනියම් පිරිවැය තුළට ඇතුළත් විය.

ගැටුමේ ආර්ථික හා සමාජ පිරිවැය ආපසු හැරවිය යුතු අතර එය සාමූහික වගකීමක් වන බවද ප්‍රශ්නය ගැන උත්සුක වන විවිධාකාර පාර්ශ්වයන්ගේ පිළිගැනීමට භාජනය වී තිබේ. එමෙන්ම එය වර්ධනය වෙමින්ද පවතී. තව දුරටත් ආර්ථික වර්ධනය ගෙන ඒම සඳහා අවශ්‍ය තත්වයන් රජය විසින් තහවුරු කළ යුතු අතර, ප්‍රධාන වර්ධන බලවේගය ලෙස ක්‍රියා කරන පුද්ගලික අංශයද වර්ධන ක්‍රියාවලියට සහාය වීම අවශ්‍ය වේ. කෙසේ වුවද දේශපාලන අස්ථාවර භාවය නිසා අඛණ්ඩ ප්‍රතිපත්තිමය උපාය මාර්ග පිළිබඳ අර්ථ නිරූපණය සංකීර්ණ වේ. දැනට සෑම දෙවසරකට වතාවක් පමණ නව මැතිවරණ ( හා ප්‍රතිපත්ති පිළිබඳ වගකීම් දරන්නන්ගේ වෙනස් වීම්) සිදු වේ. ප්‍රතිපත්තිවල ස්ථාවරත්වය හෝ ව්‍යාපාරයට වැඩි දියුණු විය හැකි, කල් තියා දැන ගත හැකි, ක්‍රියාකාරී වාතාවරණයක් පිහිටුවීම සඳහා ද මෙය එතරම් හිතකර නොවේ.

## 1.4 පුද්ගලික අංශය කෙරෙහි ගැටුමේ බලපෑම

මේ වාර්තාව සඳහා තතු විමසීමට භාජනය කරන ලද, කොළඹ මුල් කරගත් විශාල පරිමාණයේ ව්‍යාපාරිකයන්ගේ මතය අනුව කරුණු කිහිපයක් නිසා ව්‍යාපාරවල දීර්ඝකාලීන සංවර්ධනය කෙරේ ගැටුම බලපෑම් දක්වයි. පළමුවෙන්ම, එය ඔවුන්ගේ ක්‍රමෝපායන්, අරමුණු හා සැලසුම් සීමා කරයි. මේ නිසා ගෝලීය ප්‍රතිඵල ජනිත වේ. හීනවූ ව්‍යාපාර පිළිබඳ විශ්වාසය නිසා ගෝලීය වශයෙන් ආයෝජනවලට පහර වැදේ. එමෙන්ම, ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහිද එය අහිත කර ලෙස බලපායි. ශ්‍රී ලංකාව තද අවදානම් සහිත රටක් ලෙස විදේශීය ආයෝජකයන් විසින් සැලකීමටද ඉඩ තිබේ.

ප්‍රාග්ධන මූලික ව්‍යාපාරවල මතය අනුව, මෙම ගැටුම් ප්‍රාදේශීය ව්‍යාපාර-විශේෂයෙන්ම ගැටුම් සහිත පෙදෙස්වල ව්‍යාපාර වෙත බල පාන්නේ වෙනත් අන්දමකිනි. ඔවුනට තාක්ෂණවේදී හුවමාරුව හා හවුල් සංවර්ධනය උදෙසා පවතින ඉඩකඩ අහිමි වේ. බොහෝ අය ගැටුමට හැඩ ගැසී ඔවුන්ගේ කටයුතුද සංවර්ධනයට වඩා හුදු ප්‍රශ්නම කේන්ද්‍ර කොට ගත්තක් බවට පරිවර්තනය කරගෙන සිටිති. මාර්ග බාධක, අබලන් වූ පාරවල්, ආර්ථික තහංචි හා වේගවත් ලෙස අලෙවි වන භාණ්ඩ සඳහා ඉල්ලුමක් නොමැති වීම යනාදිය නිසා ගැටුම් පවත්නා ප්‍රදේශ තුළ තිබෙන ව්‍යාපාරවල වර්ධන ඉඩකඩද ඇහිරී තිබේ. ප්‍රාදේශීය ව්‍යාපාර සම්බන්ධයෙන්ද එම කරුණ එලෙසින්ම අදාළ වේ.

තම ව්‍යාපාර වෙත ගැටුම බලපාන අන්දම ගැන දකුණේ සහ නැගෙනහිර තිබෙන ව්‍යාපාර විසින් වෙනස් අදහස් උසුලනු ලැබීම පුදුමයට කරුණක් නොවේ. දකුණුදිග ව්‍යාපාරයන් මෙම සබඳතාව හඳුනා ගන්නේ පක්ෂවාදී දේශපාලනය මගින් ඇවිස්සී යා හැකි අවදානම ඇසුරෙනි. මේ අතර ගැටුම හා සාම ක්‍රියාවලිය තුළින්ම තම කටයුතු කෙරේ බලපෑම් දක්වන්නට ඉඩ සලස්වන ව්‍යුහමය ප්‍රශ්න ගණනාවක් නැගෙනහිර දිග ව්‍යාපරයන් විසින් හඳුනාගෙන ඇත්තේය. විශේෂයෙන්ම දෙමළ ව්‍යාපාරයන් අපක්ෂපාතී ලෙස නොසැලකේ. මේ

නිසා, පොලීසිය හා සන්නද්ධ කණ්ඩායම් මගින් ඔවුන්ට වෙනත් අයුරින් සංග්‍රහ කරනු ලැබීමේ හේතුවෙන් ඔවුන්ගේ කටයුතුවලට බාධා පැමිනේ. නිදසුනක් වශයෙන්, දෙමළ ව්‍යාපාරයන් අපක්ෂපාති වුවද ජනවාර්ගික ගැටුම්වලින් විනාශ වූ භාණ්ඩ හා දේපල සඳහා ඊට අදාළ පොලිස් වාර්තා නොසැපයීම නිසා රක්ෂණ හිමිකම් ලබා ගැනීමට නොහැකිවූ අවස්ථා ඇත්තේය. ඊටත් වඩා ප්‍රචණ්ඩකාරී කටයුතු වැළැක්වීම සඳහා පොලිසිය විසින් කිසිවක් නොකර ඇති නිසා දෙමළ ව්‍යාපාරිකයෝ බියෙන් ජීවත් වෙති.

ව්‍යාපාරික ප්‍රජාවන් දෙවර්ගය විසින්ම ප්‍රාදේශීය ආර්ථික වර්ධනයට බලපාන දුබල ආයෝජන චක්‍රයේ ලක්ෂණ හඳුනා ගෙන තිබේ. (අප්‍රමාණවත් අධ්‍යාපනය ඇතුළු) වැඩි යන තරුණ විරැකියාව සහ අසහනය, ප්‍රචණ්ඩතාවට ඇති ඉඩකඩ වර්ධනය වීම, ඒ නිසා ආයෝජන තවත් අඩුවීම - මේ එම ලක්ෂණ වේ. මේ බව නැගෙනහිර දිග ව්‍යාපාර නියෝජිතයන් විසින් තදින් අවධාරණය කර තිබේ. ව්‍යාපාරික මධ්‍යස්ථානයක් වශයෙන් ත්‍රිකුණාමලය සතු විභව ඉඩකඩ බොහෝය. රටේ තිබෙන විශාලත්වයෙන් තෙවැනි වරාය එයයි. එමෙන්ම එය තරමක් දුරට විවිධ වර්ගයන් මිශ්‍රව සිටින පෙදෙසකි. එහෙත් මෑත අවුරුදු තුළදී එකම ව්‍යාපාරමය නෞකාවක්වත් එහි පැමිණ නැතැයි ඔවුහු පෙන්වා දෙති. ආයෝජන නොමැති වීම ගැන සලකනු ලබන්නේ කොළඹ පිහිටි මධ්‍යම ආණ්ඩුව විසින් අනුගමනය කරන පක්ෂපාතී කටයුතුවල සේයාවක් ලෙසිනි. ත්‍රිකුණාමලයේ එක් ව්‍යාපාරිකයෙක් මෙසේ පැවසීය. "යහමින් මුදල් තිබෙන අය ත්‍රිකුණාමලය තුළ ආයෝජන නොකරන්නේ ගැටුම් පිළිබඳ අවදානම නිසාය. ත්‍රිකුණාමලයේ සිටින, තමන්ගේ නගරය තුළ ආයෝජනය කිරිමට සූදානම් අය එසේ නොකරන්නේ ණය වැනි මුදල් සැපයුම් මාර්ග වෙත පිවිසීමට ඔවුන් අසමත් නිසාය" වැඩි වී යන අවුල් සහගත තත්වය යටතේ රාජ්‍ය නොවන සංවිධාන පවා මුදල් ආයෝජනයට බියෙන් සිටිතැයි ඔහු සඳහන් කළේය.

## 1.5 ගැටුම්වලට අදාළ පුද්ගලික අංශයේ භූමිකාව

ගැටුම නිසා පැන නැගුණු සමහර අයට පැහැදිලි ලෙසම වාසිදායක-ආර්ථික අවස්ථා කවරේද යන්න පිළිබඳව දැන සිටින කරුණු අල්පය. සිය කටයුතු සඳහා අවශ්‍ය මුදල් ලබා ගැනීම පිණිස කොටි සංවිධානය විසින් සාර්ථක ලෙස අනුගමනය කර තිබෙන නොයෙක් උපාය මාර්ග පිළිබඳව එක් දුලබ අධ්‍යයනයකින් විශ්ලේෂණය කර තිබේ. ඒ මෙසේය: දෙමළ පවුල් හා ව්‍යාපාරවලින් මුදල් එකතු කරගැනිම සඳහා ඍජුව හෝ අනියම් මගින් හෝ බලපෑම් කිරීම, විදේශගත දෙමළ ප්‍රජාවන් සමග පවත්නා ජාත්‍යන්තර සබඳතා ප්‍රයෝජනයට ගැනීම, අර්ධ නෛතික හා නිති විරෝධී කටයුතුවල නියැලීම ආදිය ඒ අතරට වැටේ.[27] අවි ආයුධ සැපයීම, අවශේෂ උපකරණ ආනයනය හෝ අහස්යානා මිල දී ගැනීම ආදී මාර්ග ඇසුරෙන් කොටි සංවිධානයට මෙන්ම ඇතැම් ව්‍යාපාරවලටද ගැටුම නිසා වාසි අයත්වී තිබේ. පිළිගත් ආචාර ධර්ම හා විනිවිද භාවයට අනුකූල පිළිගත් නීතිරීති රාමුවක් තුළ ව්‍යාපාර කටයුතු සිදුකරවීම තහවුරු කිරිම සඳහා සමාලෝචනය කිරීම අඩු මට්ටමකින් සිදුවන ගැටුම් සහිත පරිසරයක් තුළදී අනියම් හා නීතියෙන් පරිබාහිර ව්‍යාපාරික කටයුතු ඉතා සශ්‍රීක ලෙස සිදුවේ.

ගැටුම් ඇති කිරීම හෝ පැතිරවීම සඳහා ව්‍යාපාරවලට දායක විය හැකියයි සාමාන්‍යයෙන් පිළිගෙන තිබුවද ශ්‍රී ලංකාව තුළ පවත්නා මෙවැනි සබඳතාවන් පිළිබඳ විශ්ලේෂණාත්මක පර්යේෂණ සිදු වී තිබෙන්නේ ඉතා මඳ වශයෙන් නිසා, එබඳු චෝදනාවල සත්‍යාසත්‍යව පිරික්සා බැලීම දුෂ්කර වේ. නොදැනුවත්ව හෝ ව්‍යුහමය ජවයන් ශක්තිමත් කිරිමට හේතු සාධක වීම තුළින් විශේෂ සැලකිලි දැක්වීම වැනි පොදු ව්‍යාපාරික පියවර අනුසාරයෙන් ගැටුම් නිර්මාණය හෝ වර්ධනය සඳහා ව්‍යාපාරවලට දායක විය හැකි යයි කොළඹ සිටි ව්‍යාපාරික නියෝජිතයන්ගෙන් බහුතරය පිළිගත්හ. ඒ සමගම, වෙනස්කම් කිරීම සම්බන්ධවී තිබුණේ සමාජය තුළ සිටින ඇතැම් අය විසින් අත්දැක ඇති පුළුල් ලෙස ව්‍යාප්ත කොන්කිරීමේ සිරිත සමගය. ව්‍යාපාර මගින් සෑම දෙනාටම සමාන අවස්ථා නොසැපයුණහොත් එය නිසා ගැටුම ව්‍යාප්ත හෝ නීත්‍යානුකූල වීමට ඉඩ ඇතැයි සඳහන් කරන ලදි. කිසියම් නියත ගැටුම් හෝ සාමකාමී තත්වයක් යටතේ ව්‍යාපාර මගින්

අනුගමනය කෙරෙන ආකල්පය හෝ කටයුතු කරන ආකාරය නිසා සමාජ ආතතීන් උග්‍ර හෝ ලිහිල් වීමට ඉඩ අතැයිද ඔවුහු පිළිගත්තෝය.

නැගෙනහිරදිග ව්‍යාපාරිකයෝ මේ අදහසට තදින් එකඟ වූහ. එහෙත් ඔවුන් එය සම්බන්ධ කළේ ඇතැම් අංශ හා කර්මාන්ත තුළ සමහර වාර්ගික කණ්ඩායම් සතුව පවත්නා ඒකාධිකාරය සමගය. කොළඹ සිටින දේශපාලකයන් සමග පවත්නා සබඳතාවන් නිසා නැගෙනහිරදිග සිටින සිංහලයන් අත පවත්නා ප්‍රවාහණ ඒකාධිකාරය මේ පිළිබඳව නිතර නිතර ඉදිරිපත් කෙරෙන නිදසුනකි. මුස්ලිම් ප්‍රජාවට අයත් සාමාජිකයන් විසින් විකල්ප සේවාවන් ඉදිරිපත් කළවිට, සිංහලයෝ ඔවුන්ගේ වාහනවලට හානි සිදුකළහ. එමෙන්ම ත්‍රිකුණාමලයේ ත්‍රීරෝද සංගමයේ සභාපති සිංහලයෙකු වුවද රියදුරන්ගෙන් 85% ක් දෙමළ අය වෙත්. මුස්ලිම්වරු 15% කි. සිංහලයෝ සිටින්නේ 5% ක් පමණකි. මේ පත්වීම කරන ලද්දේ සිංහලයකු හැටියට පොලීසිය සහ අවශේෂ බලධාරීන් සමග ලෙහෙසියෙන් කටයුතු කිරීමට ඔහුට හැකිවන නිසායයි පවසනු ලැබීය. තම ඡන්ද කුට්ටිය/ගොඩ ආරක්ෂා කර ගැනීම සඳහා දේශපාලනඥයන් විසින් ප්‍රජාවගෙන් එක කොටසකට විශේෂ සැලකිලි දක්වනු ලැබේය යනු පොදු විශ්වාසයකි. රටේ ඇතැම් කොටස්වල ව්‍යාපාර පාලනය කරන සමාන්තර බල අධිකාරියක් වශයෙන් කොටි සංවිධානය වෙතද සමහර සමූහයන් විසින් එම චෝදනාවම එල්ල කරනු ලැබීය.

# 2 ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික අංශය හා සමාජය

## 2.1 ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික අංශයේ සමාජ වගකීම

ගැටුම ඉදිරියේ ධනාත්මක කොටසක් ඉටු කිරීම සඳහා දේශීය ව්‍යාපාර සතු විභව හැකියාව රඳා පවත්නේ වඩාත් පුළුල් අයුරින් එම ව්‍යාපාර සමාජය හා සම්බන්ධ වී තිබෙන අන්දම හා දායක වන පිළිවෙළ මතය. සමාජයීය වශයෙන් දැනුවත්ව සිටින බව ප්‍රදර්ශනය කරන, එසේ දැනුවත්ව සිටිතියි පිළිගනු ලබන ව්‍යාපාර[xxvii] වේ නම්, ඔවුන් "සාම දූතයන්" ලෙස පුළුල් සමාජය විසින් පිළිගනු ඇත. අනෙක් අතට, ඒවා සතුව ඇත්තේ කිලිටු වූ කීර්තියක් නම්, පුළුල් ජන සමාජය ඒවා දෙස බලන්නේ සැකමුසු සිතිනි. ඒ අනුව, ඒවාට කටයුතු කිරීමට තිබෙන ඉඩකඩද ඇහිරී යයි. සංස්කෘතික ත්‍යාගශීලීභාවය පිළිබඳ දීර්ඝ ඉතිහාසයක් ශ්‍රී ලංකාව සතුව ඇත්තේය. එහෙත් ඊට මූලික වී තිබෙනුයේ විධිමත් මහජන සබඳතා හෝ සමාජයීය වගකීම් පිළිබඳ ප්‍රතිපත්ති නොව, පුද්ගලික විශ්වාසයන්ය. ගත වූ වසර කීපය තුළදී ගෝලීය නැඹියාවන් අනුව යමින් එබඳු කටයුතු සංස්කෘතික සමාජයීය වගකීම ලෙස යළි සංකල්ප ගතකර තිබේ. මේ යෙදුම විවිධාකාරයෙන් වටහා ගෙන තිබෙන්නකි. කෙසේ වුවද, සමාගම්වලින් ඉතා වැඩි කොටසක් තමන්ගේ සමාජයීය වගකීම් ක්‍රියාත්මක කරන්නේ කෙසේදැයි අපැහැදිලිය.[28] නීත්‍යානුකූලව අනුකූල වීමේ අවශ්‍යතාවක් නොමැති නිසා, සමාගම්වලින් ඉටු කරන්නේයයි කියනු ලබන මෙකී සංස්කෘතික සමාජයීය වගකීම් අර්ථවත් අයුරින් හෝ වාර්තාගත තරම් විශාල ලෙස හෝ ක්‍රියාත්මක වේයයි සහතික වීමට කිසිවකුට නුපුළුවන. එමෙන්ම, සමාජයීය වශයෙන් වගකිව යුතු ආයෝජනය හා (විශාල වශයෙන් භාණ්ඩ හා ද්‍රව්‍ය පරිභෝජනයට ගැනෙන) පොදු වෙළඳපල තුළ ආචාරධර්මීය පරිභෝජනය යන මේ අංශ ශ්‍රී ලංකාව තුළ ඉතාමත් අල්පමාත්‍ර ලෙස පැමිණේ. ඒ තුළින් අදහස් වනුයේ සංස්කෘතික සමාජයීය වගකීම්වලට අදාළ ප්‍රතිපත්ති, කටයුතු හා විමර්ශන යන්ත්‍රණ පිළිගන්නා මෙන් එතරම් බලපෑමක් සමාගම්වලට නොකෙරෙන බවයි..

එසේ වුවද සංස්තානික සමාජයීය වගකීමට අදාළ වාංමාලාව උපයෝගී කරගනු ලබන ආකාරය පෙනෙන්නට තිබේ. ක්‍රීඩා හා පාරිසරික දැනුවත්කම ව්‍යාප්ත කිරීමේ වැඩ සටහන් ඉංග්‍රීසි භාෂා පන්ති, අධ්‍යාපන ආයතන, ආබාධිත අයට ආධාර වීම, ගම් මට්ටමේ ව්‍යාපෘතිවලට සහාය වීමෙන් ගැමි ආර්ථිකය නගා සිටුවීම, ස්වභාවික ව්‍යසනවලට ගොදුරු වූ අයට ආධාර වීම හා තරුණයන් සඳහා ව්‍යවසායක වැඩ සටහන් ආදී විශාල පරාසයකට අයත් කටයුතු හඳුනා ගෙන තිබෙන ප්‍රධාන පෙළේ සමාගම්වල සංස්තානික සමාජයීය වගකීම් ව්‍යවහාරයන් පිළිබඳ පුළුල් විස්තරයක් ලංකා මන්ත්ලි ඩයිජෙස්ට් (Lanka Monthly Digest) සඟරාව විසින් පළ කර තිබේ.

දීප ව්‍යාප්ත ප්‍රවේශයකට ( ළමයින්ට සුහද පෙර පාසල් ඇති කිරීමට සහාය වීම) පිවිස සිටියේ එක් සමාගමක් පමණි. නියත රැකියා ප්‍රතිපත්තියක් (ආබාධිතයන් පමණක් සේවයට බඳවා ගැනීම) ගැන සඳහන් කළේද එක් සමාගමක් පමණකි.[29] වර්ෂ 2004 දී පවත්වන ලද අදහස් සමීක්ෂණයකදී සමාජයේ වැඩි දියුණුව උදෙසා තමන්ට ඉටු කළ හැකි කොටස් ගණනාවක් ව්‍යාපාර ප්‍රධානීන් විසින් හඳුනා ගනු ලැබීය.[30] දිළිඳුකම පිටු දැකීමට අදාළ සංවර්ධන කටයුතුවලට සහය වීම හෝ සමාජ සේවා (32%) රැකියා සැපයුම් හෝ රැකියා පුහුණුව (22%) සහ ආගමික කටයුතුවලට මුදල් සැපයීම (17.7%) යන මේවා ඒ අතරින් ප්‍රමුඛ ස්ථානය ඉසිලීය.

සංස්තානික සමාජයීය වගකීම් ආශ්‍රිත කටයුතුවල වර්ධනය ශ්‍රී ලාංකික සමාජය මුහුණ පාමින් සිටින ප්‍රශ්නවල වර්ධනය වෙත දක්වෙන ඍජු ප්‍රතිචාරයකියි. සුප්‍රකට සමාගම් ප්‍රධානියකු විසින් පවසා තිබේ. "ජාතියට වින කරන බියකරු පරිමාණයේ සමාජමය හා පාරිසරික දෝෂ නිසා මෑත කාලයේදී ශ්‍රී ලංකාව තුළ සංස්කෘතික සමාජයීය වගකීම් පිළිබඳ උනන්දුව තදින් වේගවත් වී ඇත්තේය"[31] මෙම කරුණ සත්‍ය වේ නම් ගැටුම්වලට අදාළ ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා දැනට සමාගම්වල දක්නට ලැබෙන සම්බන්ධීකරණයක් රහිත

සංස්කෘතික සමාජමය වගකීම් උපයෝගිතාව ප්‍රයෝජනවත් ලෙස යොදා ගතහැකි බව අදහස් වේ.

## 2.2 සාමය හා ගැටුම පිළිබඳ ව්‍යාපාරික අංශයේ දැක්ම

ව්‍යාපාර, සාමය හා ගැටුම අතර පවත්නා සේ පෙනෙන්නට තිබෙන සබඳතාවන් මේ අධ්‍යයනයේ නිරීක්ෂණයට භාජනය විය. මෙය කරනු සඳහා දැන පවත්නා ගැටුමට හේතු හා ඊට අදාළ විසඳුම් සාමය ගොඩ නැගීම සහ ගැටුම් වැළැක්වීම පිළිබඳ සංකල්ප ගැටුම් හා ව්‍යාපාර අතර පවත්නා අන්‍යොන්‍ය බලපෑම් සහ මේ රට තුළ සාමය ගොඩනැංවීම සඳහා වග කිවයුතු ප්‍රධාන සමූහ යන මේවා පිළිබඳව ප්‍රශ්න ගණනාවක් අසනු ලැබීය. ඒ සමගම ව්‍යාපාර ප්‍රජාවගේ සැලකිල්ල යොමු වන පුළුල් සමාජයීය කරුණු ගැනද විමසන ලදි. පහත පෙනෙන පරිදි හඳුනාගෙන තිබෙන බොහොමයක් සමාජයීය ප්‍රශ්නද ගැටුමට අදාළ ප්‍රශ්න සමග බැඳී ඒ අබිබවා යයි.

තමන්ගේ දැඩි අවධානයට පාත්‍රව තිබෙන ප්‍රශ්න අරබයා කොළඹ පාදක කරගත් ව්‍යාපාර හා දකුණු සහ නැගෙනහිරදිග ව්‍යාපාර අතර විශාල වෙනස්කම් පවතියි. ව්‍යාපාර කටයුතු කිරීමට සිදුවී තිබෙන නියත සන්දර්භය සේම ව්‍යාපාරවලට මුහුණ දීමට සිදුවී ඇති පුළුල් තේමාවන්ගේ විවල්‍යතාද ඒ ඒ ප්‍රශ්නය තුළින් පිළිබිඹු වේ.

### 2.2.1 දේශපාලන අස්ථාවරත්වය

කොළඹ පාදක කරගත් විශාල පරිමාණයේ ව්‍යාපාර විසින් පැහැදිලි ලෙස ප්‍රකාශ කරන ලද ඉතාමත් පොදු ප්‍රශ්නය වනුයේ වර්ධනය වෙමින් පවත්නා දේශපාලන අස්ථාවර භාවයයි. මෙය දීර්ඝ කාලීන මූලික ආර්ථික ප්‍රතිපත්තිවල අනාගත නැම්යාව කෙරේ බලපායි. ඒ නිසා ඒවායේ ආර්ථික භූමිකාව පිළිබඳ අපැහැදිලි චිත්‍රයක් සපයයි.
කොළඹ ආශ්‍රිත ඉතා වැඩි පිරිසකට මෙයින් අදහස් වූයේ (ව්‍යාපාර සඳහා ඉඩකඩ සහිත) පරිසරය නිරතුරුව වෙනස්වීම්වලට භාජනය වන වගයි. මේ නිසා සම්පූර්ණ වශයෙන් ආයෝජනය කරමින් ව්‍යාප්ති සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුහු ධෛර්ය සම්පන්න නොවෙති.

දේශපාලන ස්ථිරභාවය රහිත වීම දකුණුදිග ව්‍යාපාර වෙත බලපා තිබෙන්නේ මීට වඩා හාත්පසින්ම වෙනස් අන්දමිනි. විශේෂයෙන්ම, මෑත කලෙක සිට, ගම් මට්ටමේ දක්නට ලැබෙන දේශපාලන පක්ෂ අතර වර්ධනය වෙමින් පවත්නා ආතතියෙහි ස්වරූපයෙනි. රටේ පුළුල් අවශ්‍යතාවන් ගැන නොබැලීම සහ උචිත නායකත්වයක් නොසැපයීම ගැන කොළඹ මෙන්ම දකුණේ ව්‍යාපාරිකයෝද දේශපාලන නළුවන්ට චෝදනා කළෝය.

සමාජය තුළ දේශපාලනයට ලැබී තිබෙන වැදගත්කම මේ සමග තදින් බැඳී පවතින්නකි. "සියල්ලම දේශපාලනකරණයට යටත් කිරීම නිසා සමාජ ප්‍රමිතීන් පරාභවයට යයි. තවත් ගැටුම් ඇති කරයි" යනුවෙන් කොළඹ ආශ්‍රිත එක් අයෙක් පැවසීය. එක් දකුණුදිග අයකු වෙතින් එල්ල වූයේ මීට වඩා බරපතල චෝදනාවකි. ඔහු පවසන අන්දමට රජය එකිනෙකට වෙනස් චරිත යුවලක් රඟ දක්වයි. වැදගත් ප්‍රශ්න සම්බන්ධයෙන් එහි ස්ථාවරය කුමක්දැයි පැහැදිලි නොකරයි. මේ අනුව තත්වය පාලනය කර ගැනීමට නොහැකි තැනට එළඹ භයානක ලෙසින් අස්ථාවර වෙයි."

### 2.2.2 අයහපත් අතට හැරෙන ආරක්ෂක තත්වය සහ වර්ධනය වන ප්‍රචණ්ඩත්වය

තම ප්‍රදේශය තුළ පවත්නා, නරක අතට හැරෙන ආරක්ෂක තත්වය සහ වර්ධනය වන ප්‍රචණ්ඩත්වය සමග දේශපාලනමය අංශ හා බැඳුණු ප්‍රශ්නද සම්බන්ධ වී ඇතැයි නැගෙනහිරදිග සියල්ලෝම කියා සිටියහ. කිසිම පුද්ගලයකු සමූහයක් හෝ ඒකකයක් මධ්‍යස්ථ ලෙස පිළිගැනීමට සියලුම දේශපාලන පක්ෂ විසින් ප්‍රතික්ෂේප කිරීම මීට අදාළ විශේෂිත ප්‍රශ්නයක් ලෙස පෙන්වා දෙන ලදි. ත්‍රිකුණාමල ප්‍රදේශය තුළ ගැටුම හා බැඳුණ සියලු පාර්ශ්වයන්ම සිටින නිසා, ව්‍යාපාරිකයන් වෙතින් විශේෂ වරප්‍රසාද ඉල්ලුම් කර සිටීමේ

නැමියාව සියලුම දේශපාලන පක්ෂ තුළ පැවතුණි. මුදල් ආධාර දේශපාලන පෙළපාලිවලට සහභාගී වීම සමාගම සතු දේපල හා සෙසු සේවා පරිහරණය යනාදිය මෙම ඉල්ලීම්වලට අයත් වේ. බලපෑම යටතේ හෝ කිසියම් දේශපාලන පක්ෂයක ඉල්ලීම්වලට එකඟ වුවහොත්, අවශේෂ පක්ෂ එම ව්‍යාපාරය දෙස වපර ඇසින් බැලීමටද අදාල පුද්ගලයා හෝ ඒකකය තමන්ට එරෙහි ලෙස ලේබල් ගැසීමටද එසේත් නැත්නම් ඔවුන්ගේ ඉල්ලීම් පුළුල් කිරීමටද ඉඩ ඇත. මේ නිසා ගැටුම් පවත්නා ප්‍රදේශවල තිබෙන ව්‍යාපාර තුළ දැඩි ආතතියක් බිහිවිය. කොළඹ ආශ්‍රිත ව්‍යාපාරිකයන්ගෙන් එබඳු ඉල්ලීම් කෙරේ නම් හෝ තමන්ගේ මධ්‍යස්ථ බවට හානි පැමිණේ නම් යටත් පිරිසෙයින් අදාල ප්‍රදේශයෙන් බැහැර වීමේ අගනා නිදහස කොළඹ ව්‍යාපාරිකයන් සතුව තිබේ.

දිගින් දිගටම හර්තාල්වලට සහභාගී වන මෙන් තමන්ට බලකර සිටීම නැගෙනහිරදිග ව්‍යාපාරික ප්‍රජාවට මුහුණ පාන්නට සිදුවී තිබෙන ප්‍රශ්නයන් ලෙස ඉදිරිපත් විය. මේවා නිසා භාණ්ඩ හා සේවා සැපයුමට බාධා පැමිණේ. ආර්ථික නිෂ්පාදකතාවද හීන වේ. නැගෙනහිර දිග සිටින ඇතැම් ප්‍රජාවන්ට පමණක් සැලසෙන විශේෂ වරප්‍රසාද ද තවත් ප්‍රශ්නයකි. ධීවර කර්මාන්තයේ නියැලී සිටින ඇතැම් ජන වාර්ගික ප්‍රජාවන්ට අගනුවර සිටින අමාත්‍යාංශ මට්ටමේ අය සමග වාසිදායක සබඳතා තිබේයයි පැවසේ. සෙසු ප්‍රජාවන් විසින් එබඳු සබඳතා ගොඩ නැගීම ඔවුහු ක්‍රියාත්මක ලෙස වළක්වති. යම් යම් ජන වාර්ගික/ හා හෝ ප්‍රාදේශීය සමූහයන් සතුව පවත්නා ප්‍රවාහන අංශයේ ඇතැම් ව්‍යාපාර ගැන ද සඳහන් විය.

## 2.2.3 ජන වාර්ගික ප්‍රශ්නය

ජන වාර්ගික ප්‍රශ්නය ව්‍යාපාරික ප්‍රජාවගේ දැඩි සැලකිල්ලට හේතු වුවක් ලෙස විස්තර කරන ලද්දේ කොළඹ ආශ්‍රිත සමාගම් දෙකක් විසින් පමණකි. දකුණු ප්‍රදේශමය සමාගම් එකක් වත් ඒ ගැන සඳහන් නොකළේය. කෙසේ වුවද කොළඹ ජන වාර්ගික ප්‍රශ්නය සමග වැඩී යන අන් මත නොඉවසීමේ ආකල්පය බැඳී තිබේ. උග්‍ර ජාතිවාදී ව්‍යාපාර බිහිවීම හා ආගමික පදනම මත වෙනස්කම් කිරීම හා ආතතිය බැඳී පවතියි. 1983 දී පැන නැගුණු වර්ගවාදී කැරලිවලින් පසු බොහෝ දෙමළ වෘත්තිකයන් රට අත්හැර යෑම නිසා පුහුණු මිනිස් සම්පත් නැතිවීම ගැන එක් සමාගමක් සඳහන් කළේය.

තමන්ගේ ප්‍රදේශ තුළ දරුණු ගැටුම්වලට තුඩු දුන් අන්දමේ ඕනෑම වර්ගයක වෙනස්කම් කිරීමේ අවස්ථා පිලිබඳ අත්දැකීමක් තිබේදැයි කොළඹ ආශ්‍රිත සුළු ව්‍යාපාරිකයන් වෙතින් විමසන ලදී. ඔවුන්ගෙන් 36.7% එසේ යයි පිළිතුරු සැපයූහ. ජන වාර්ගික ප්‍රජාවන් සතු ව්‍යාපාරවලට එරෙහි අපරාධ, තරගය හා අසාධාරණ ලෙස පක්ෂග්‍රාහී වීම ආදිය උදාහරණ ලෙස සඳහන් කරනු ලැබීය. අනාගතයේදී දරුණු ගැටුම්වලට තුඩු දීමට ඉඩ ඇති, තම තමන්ගේ ප්‍රදේශ තුළ පවත්නා ආතතීන් ගැන පිළිතුරු සැපයූවන්ගෙන් අඩක් පමණ (49.3%) දැන සිටියහ. මේ අනුව ප්‍රචණ්ඩ ගැටුම්වලට තුඩු දෙන, වැඩී යන තර්ජන ඉඟි කිරීමේ හැකියාවක් ව්‍යාපාර පිලිබඳව දේශීය මට්ටමේ පවත්නා සංකල්ප තුළ ඇතැයි සිතන්නට පුළුවන.

## 2.2.4 නීතිය සහ විනය බිඳවැටීම

නීතිය සහ විනය බිඳ වැටීම සහ දූෂණය වැඩි වීමද බරපතල ප්‍රශ්න ලෙස කොළඹ ආශ්‍රිත හා උතුරුදිග ව්‍යාපාර විසින් සඳහන් කරනු ලැබීය. නීතිය හා විනය බිඳ වැටීම සෘජුවම තමන්ට බලපාන්නේ කෙසේදැයි ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් පැහැදිලි නොකළෝය. එහෙත් අධිකරණ කාර්යයේ කාර්යක්ෂමතාව හීන වීම සහ නීතිය හා මහජන විනය පවත්වා ගෙන යෑමට අසමත් වීම නිසා ව්‍යාපාරවලට සැලසුණු ආරක්ෂාව අඩු වී, ඔවුන්ගේ පිරිවැය වැඩි යෑමට හේතුවී යයි පෙනෙන්නට තිබේ. නීති රීති ක්‍රියාත්මක නොකිරීමේ හේතුවෙන් ලියා පදිංචි නොවූ ව්‍යාපාරවලින් අපිලිවෙළේ තරගයක් එල්ල වන බවද ප්‍රදේශය පිලිබඳ උචිත ආර්ථික තොරතුරු නොසැපයෙන බවද දකුණුදිග ව්‍යාපාර විසින් සඳහන් කර තිබුණේය. මේ නිසා දකුණු දිග සමාජය තුළ අසහනය හා ආතතිය වැඩි වී යතියි ඔවුන්ට හැඟී තිබේ. කොළඹ ආශ්‍රිත එක් සමාගමක් විසින් පැවසූ අන්දමට නීතිය හා විනය බිඳ වැටීමේ එක් අනියම් ප්‍රතිඵලයක් නම් පද්ධතිය පිලිබඳ විශ්වාසය අහෝසි වීමයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, අකර්මණ්‍ය වුවද, නොඉවසිල්ලෙන් පසු වන, සංවර්ධනය හා ආර්ථික වර්ධනය ගැන නොතකන ශ්‍රී ලාංකිකයන් පිරිසක් බිහිවී තිබේ. පරිපාලනය වෙත විවෘතව චෝදනා

කල ඇතැම් ව්‍යාපාරිකයෝ එහි ඇති දූෂණය සහ එහි ක්‍රියාකාරීත්වය නිසා තමන්ගේ කටයුතුවලට සිදු වන හානිකර බලපෑම ගැන සඳහන් කළද නියත අවස්ථා හෝ විස්තර සැපයීමෙන් වැළකී සිටියහ.

## 2.2.4 ගැටුම - හේතු සහ විසඳුම්

කොළඹ ආශ්‍රිත හා ප්‍රාදේශීය තොරතුරු සැපයුම්කරුවන් සිතන අන්දමට ගැටුමට ප්‍රධාන හේතුව වී තිබෙන්නේ ගතවූ වසර **20** හෝ **60** පමණ කාලය තුළ සිටි දේශපාලන නායකත්වයේ අඩු ලුහුඩුතා බවයි. මෙකී අඩු ලුහුඩුතා මෙසේ දක්වා තිබේ: පළමු වරට තත්වය පැන නැගුණු විට, එය හා ඊට අදාළ සමාජයීය සන්දර්භය නිසි ලෙස වටහා ගැනීමට අසමත් වීම, බහු ජනවාර්ගික සමාජයක් තිබුවද සිංහල බෞද්ධ ශ්‍රී ලංකීය ජාතික අනන්‍යතාවක් සැපයූ සිංහල පමණක් වැනි එක් සමූහයකට ලැදි නීති රීති. ඉදිරිපත් කිරීම, කෙටිකාලීන දේශපාලන වාසි තකා කටයුතු කිරීම, "හරිදෙය" කිරීමට තරම් ධෛර්ය සම්පන්න නොවීම. කාලාන්තරයක් මුළුල්ලේ ගැටුමට හේතු පරිණාමය වී හෝ වෙනස් වී හෝ පරණ ඒවා වෙනුවට අලුත් හේතු එකතු වෙමින් හෝ එන්නට ඉඩ ඇති බව සඳහන් විය. කොළඹ කුඩා ව්‍යාපාරිකයන් අතර ප්‍රමුඛ ලෙස පැවතුණේද ඊටම සමාන අදහස් උදහස්ය. ශ්‍රී ලංකාවේ ප්‍රශ්නයට හේතුව දේශපාලනය හෝ දේශපාලඥයන් යයි 56.5% ක් විශ්වාස කළහ: 30.5% එය සම්බන්ධ කළේ ජන වාර්ගික අසාධාරණකම්වලටය. සියයට 3.4% ක් ඒ ගැන ආර්ථික ප්‍රශ්නවලට දොස් පැවරූහ. මේ සාම්පලය තුළින් ප්‍රශ්නයේ සමාජ-ආර්ථික හේතු පිළිබඳ කිසිම අවබෝධයක් ප්‍රදර්ශනය නොවීය.

විසඳුම් ගැන කථා කරද්දී, ඉතාමත්ම තදින් අවධාරණය කරන ලද්දේ රටේ පුරවැසියන් සියල්ලන්ටම සමාන අයිතිවාසිකම්, අවස්ථා සහ ප්‍රවේශයන් තහවුරු කළ යුතු බවයි. "අපි ආවේ කවදාද?" කොහේ ඉඳලාද යන්න වැදගත් නැහැ එක් අයෙක් පැවසීය "අපි දැන් මෙහෙ ඉන්නවා අපි දැන් එකට ජීවත් වෙන්න නම් කරන්න ඕනෑ කුමක්ද?" දෙවැනි ඉතාමත් පොදු විසඳුම ලෙස ඉදිරිපත් කරන ලද්දේ කණ්ඩායම් අතර විශ්වාසය, අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය හා සන්නිවේදනය ගොඩ නැංවීමයි. ගැටුම නිරාකරණය කිරීම සඳහා, පහත සඳහන් පිළිවෙළ යෝජනා කරන ලදි. පළමුවෙන්ම ප්‍රධාන පක්ෂ දෙක ඔවුන්ගේ වෙනස්කම් අත්හැර දමා එකට වැඩ කළ යුතුය. ඊට පසු ප්‍රශ්නයට සම්බන්ධ සියලු දෙනාම එකට වාඩි වී (එකිනෙකාට යෝජනා යවන්නේ නැතිව) සිංහල, දෙමළ, මුස්ලිම් ආදී සැම දෙනාගේම අභිලාෂයන් සපුරා ලන අන්දමේ පොදු යෝජනාවලියක් සෑදිය යුතුය. මෙය ඊට පසු රටේ සාකච්ඡාවට භාජනය කළ යුතුය. ඊට පසු එය ක්‍රියාවට යෙදීමට තරම් අධිෂ්ඨාන ශක්තියක් සැමටම තිබිය යුතුය. ශක්තිමත් ජන හිතකාමී ඒකාධිපති ආණ්ඩුවක් පිහිටුවීමද එක් විකල්පයක් ලෙස කොළඹ හා දකුණුදිග කිහිපදෙනකු විසින් යෝජනා කරන ලද බව විශේෂයෙන් සැලකිය යුත්තකි.

## 2.2.5 සාමය ගොඩ නැගීම

කොළඹ ආශ්‍රිත ව්‍යාපාර බොහොමයකට සාමය ගොඩ නැගීමට අදාළ සංකල්පමය අංශ ගැන වැටහීමක් තිබුණු අතර සාමය ප්‍රවර්ධනය කිරීමට හේතු වන නියත කටයුතු ගණනාවක් ප්‍රාදේශීය අය විසින් සඳහන් කරනු ලැබීය. කොළඹ ආශ්‍රිත වැඩි දෙනාගේ මතය අනුව සාමය ගොඩ නැගීම සම්බන්ධ වී තිබෙන්නේ විවිධ ජන කොටස් අතර අවබෝධය, විශ්වාසය, ගෞරවය හා ඉවසීම සමගය. විවිධ මත අදහන අය සම්බන්ධයෙන් මෙය විශේෂයෙන් වැදගත් ලෙස දක්නා ලද්දේ සාමාන්‍යයෙන් මිනිසුන් වෙනස්කම් ගැන බියෙන් පසු වන නිසාය. මීට සමාන අන්දමින්ම, දකුණුදිග අය සාමය ගොඩ නැගීම දුටුවේ හුවමාරු වැඩ සටහන් අනෙක් භාෂා ඉගෙන ගැනීම හා අන්‍යෝන්‍ය සම්බන්ධය වැඩි දියුණු කිරීම හරහා අවබෝධය හා අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය වැඩි කිරීමේ කටයුත්තක් ලෙසය. එක් සමාගමක නියෝජිතයකු පැවසූ අන්දමට මෙය සහේතුක මාදිලියේ චෛතසික තත්වයන් නොව හදවත සහ ස්ථාවර පුද්ගලික වර්ධනය හා සම්බන්ධ වූවකි තවත් නියෝජිතයකු වැඩි දුරටත් පැහැදිලි කළ පරිදි සාමය ගොඩ නැගෙන්නේ ආගම සහ ජන වර්ගය වැදගත් නොවන ඒකාබද්ධ අනන්‍යතාවක් සංවර්ධනය කර ගැනීම මගිනි. මෙහිදී රටේ සියලුම ජන වර්ග හා ආගම් ශ්‍රී ලාංකීය ලෙස පිළිගැනීම අදහස් කෙරේ. ශ්‍රී ලාංකිකයන්හට අමතක කළ යුතු බොහෝ දේවල් තිබේ යයි සඳහන් විය. පළමුවෙන්ම වර්ගවාදී චින්තනය ආපසු හැරවීම සහ දෙවනුව, ප්‍රචණ්ඩ චර්යාව කණපිට හැරවීම වශයෙනි.

කොළඹ ආශ්‍රිත විශාල පරිමාවේ ව්‍යාපාර බොහෝමයක් (කුඩා පරිමාවේ අය මෙන් නොව) විසින් සාමය ගොඩනැගීමේ කාර්යය හඳුනා ගනු ලැබුවේ වෙනස්කම් හා කොන් කිරීම් අවම වන පරිද්දෙන් සම්පත් හා ධනය යළි බෙදා හැරීම සඳහා ආර්ථික හා සමාජ සංවර්ධනය ගෙන ඒම හා සම්බන්ධ ප්‍රශ්නයක් ලෙසිනි. මෙතැනදී ගැටුම සම්බන්ධ වී තිබෙන්නේ අතෘප්තිය, වෙනත් ලෙස සැලකීම හා බෙදීම යන ලක්ෂණ තුන සමගය. එක් ප්‍රතිචාරකයකු පැවසූ පරිදි, තමන්ගේම හැකියා සහ සීමා අනුව තීරණය වන පරිදි, සාර්ථකත්වය ලබා ගැනීමේ සමාන අවස්ථාවක් සෑම අයෙකුටම තිබිය යුතුය. තවත් අය මේ අදහසට වෙනස් අයුරින් කියා පෑහ. සාමය යන්න දක්නා ලද්දේ බොහෝ දේවල ප්‍රතිඵලයක් ලෙසිනි. එහෙත් සමාජය තුළ සිටින සෑම දෙනාටම සමාන ලෙසින් සාධාරණ ලෙසින් යුක්තිය ඉෂ්ට වීම ඉත් ඉතාමත් වැදගත් දෙය වේ. මෙය තහවුරු කරගත හැක්කේ ස්වාධීන ප්‍රබල සිවිල්පාලන පද්ධතියක් තුළිනි. යුක්තිය හා සාධාරණත්වය ඉටු වීමක් නොමැති නම් හෝ අප්‍රමාණවත් නම් මිනිස්සු නීතිය තමතට ගනිති.

ඒ අතරම, දැනට පවත්නා යුද්ධයක් නැති සාමයක්ද නැති තත්වය බොහෝ අයගේ දැඩි විවේචනයට භාජනය විය. සාමය උදා කරන්නේ කෙසේද යන්න පිළිබඳ නියත අදහස් නොමැති වුවද සාමය පිළිබඳ පුළුලින් පිළිගත් දැක්මක් හා අරුතක් ශ්‍රී ලාංකිකයන් විසින් ගොඩ නගාගත යුතු වේ. දැනට විවිධ පෙදෙස්වල සිටින විවිධ කණ්ඩායම් තුළ සාමය පිළිබඳව පවත්නා අදහස්ද විවිධාකාර බව පෙනෙන්නට ඇත්තේය. කොළඹ සිටින කුඩා පරිමාණයේ ව්‍යාපාරිකයන්ගෙන් නියෝජිතයන්ගෙන් තුනෙන් එකක් පමණ (30.9%) සාමය ගොඩ නැගීම ගැන විස්තර කළේ ජන වාර්ගික ප්‍රජාවන් අතර සුහදතාව වැඩිදියුණු කරන ක්‍රියාවලියක් ලෙසය. යුද්ධය අවසාන කිරීම (23.7%) හා සෑම දෙනාටම සමාන අයිතිවාසිකම් තහවුරු කිරීමද 17.3% කැපී පෙනෙන්ට තිබූ තවත් පිළිතුරු යුගලකි.

## 2.2.6 ගැටුම් වැළැක්වීම

කුමන ප්‍රදේශයකින් පැමිණියද ව්‍යාපාරික නියෝජිතයන් සියලූ දෙනාම ගැටුම් වැළැක්වීමේ කාර්යය පියවර තුනකින් සමන්විතයයි සැලකූහ. ප්‍රශ්නයට මූලික හේතු පිළිබඳ මනා අවබෝධය විභව ගැටුම් හා ප්‍රචණ්ඩත්වයන් කල්තියා හඳුනා ගැනීමේ යාන්ත්‍රණය උග්‍ර අතට හැරෙන්නට පෙර ඒවා නිරාකරණය හෝ ඉවත් කිරීමේ පියවර ගැනීම එහෙත් කොළඹ ආශ්‍රිත තොරතුරු සැපයුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් මෙම පියවර තුන පහත සඳහන් පරිදි විය යුතුයයි කියා සිටියෝය: කල් ඇතිව ගැටුම් හඳුනා ගැනීමේ යාන්ත්‍රණය සහ ඒවා වැළක්වීම සඳහා ගනු ලබන පියවරද සමාජය තුළ සිටින සියලූම පුද්ගලයන්ට හා ප්‍රජාවන්ට පිළිගත හැකි විය යුතුය. දැන ගත හැකි විය යුතුය. ඊට අතිරේකව, තමන්ගේ කටයුතු නිසා විභව ගැටුම් උග්‍ර වීමට හෝ සන්සිඳීමට ඉඩ ඇති වගඳ පුද්ගලයන් විසින් දැනුවත්ව සිටිය යුතුය. බොහොමයක් දකුණුදිග හා නැගෙනහිරදිග ව්‍යාපාරික නියෝජිතයන් විසින් සඳහන් කරන ලද, ගැටුම් වැළැක්වීමට කළ යුතු තවත් අංගයක් වේ එනම්, ගැටුම් පවත්නා පෙදෙස්වල මිනිස් ඝාතන නැවැත්වීමයි. අදාළ ඝාතනවල ඉලක්කයවූයේ එක් ජන වාර්ගික ප්‍රජාවක්ද නැත්නම් ඒ දෙකමදැයි අපැහැදිලිය.

ගැටුම් අවම කිරීමට අදාළව නැගෙනහිරදිග ව්‍යාපාරික නියෝජිතයන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අතර වෙනස් අයුරින් සැලකීම හා සම්බන්ධ සුවිශේෂ යෝජනාද විය. දිගින් දිගටම ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරීම සඳහා අනියම් ලෙසින් සැපයෙන ආධාරය නැවැත්වීම ඇතුළත් විය. ඉහළ පෙළේ දේශපාලකයන් විසින් ඇතැම් ප්‍රජාවන් වෙත අනුග්‍රහය සැලසීම වැනි කටයුතු මීට උදාහරණ වේ.: මැතිවරණයකට පෙර ප්‍රාථමික දේශපාලන උපාය මාර්ගයක් වශයෙන් වර්ග භේදය ඇවිස්සීම නවත්වා දැමීම නැගෙනහිරදිග පෙදෙස් තුළ ප්‍රජාතාන්ත්‍රික සංස්කෘතියක් තහවුරු කිරීම. ත්‍රිකුණාමල නගරය තුළ බෞද්ධ ප්‍රතිමාවක් ඉදි කිරීම නිසා මෑතදී කැරලි පැන නැගුනේ ඊට පොලීසිය මැදිහත් නොවන බවට අදාළ පාර්ශ්වයන් වෙත දේශපාලන පක්ෂ විසින් සහතික කර තිබීම නිසා යයි එක් අයෙක් පැවසීය. නැගෙනහිරදිග පෙදෙස් ප්‍රජාතන්ත්‍රවාදී පරිපාටි විරහිත වීම ගැන කථා කළ එක් ව්‍යාපාරික නියෝජිතයකු විසින් පෙන්වා දුන් පරිදි රජයේ දිසාපති හා නගරාධිපති යන දෙදෙනාම ප්‍රදේශවාසීහු නොවූහ. දැනට නැගෙනහිරදිග පවත්නා දේශපාලන, සමාජ හා ආර්ථික වාතාවරණය අනුව ගැටුම් වළක්වා ගැනීමේ ඉඩකඩ පිළිබඳව එක් ව්‍යාපාරික නියෝජිතයකු සතුවූයේ අශුභවාදී ආකල්පයකි. එසේ වුවද යුද්ධය මගින් නොව, විවාදය හා

සංවාදය ඇසුරෙන්, ගැටුම් වැළැක්වීමේ සාමකාමී ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට සැම දෙනාම වාගේ වැඩි කැමැත්තක් දක්වන බව පෙනෙන්නට තිබීම සතුටට කරුණකි.

## 2.2.7 ගැටුම් වැළැක්වීම සහ සාමය ගොඩ නැගීම පිළිබඳ වගකීම

සාමය ගොඩ නැගීමට අදාළ ප්‍රාථමික වගකීම තිබෙනුයේ රජය හා කොටි සංවිධානය වැනි සමූහයන්ද ඇතුළත් දේශපාලන පක්ෂ වෙතයයි තොරතුරු සපයන්නන් සියලු දෙනාම පාහේ විශ්වාස කළෝය. කෙසේ වුවද සාමය ගොඩ නැගීමේ හා ගැටුම් වැළැක්වීමේ කාර්යය මෙහෙයවීමේ ශක්තිය රජය සතු නොවේ යනු එක් සමාගම් නියෝජිතයකුගේ නිරීක්ෂණය විය. රජය ගැන තිබූ විශ්වාසය සැලකිය යුතු අන්දමින් පිරිහී ගොස් තිබෙන බැවින් මේ වගකීම ඉටු කිරීමේලා එය සතු හැකියාවද අඩු වී තිබේ යයි තවත් නියෝජිතයෙක් කියා සිටියේය. සමාජයේ සිටින සෙසු සමූහයන්ද සාමයට ගොඩනැගීමට අදාළ ප්‍රාථමික නොවේ නම් සැලකිය යුතු තරමේ හෝ වගකීමක් දරන බව ප්‍රතිචාරකයෝ පිළිගත්හ. සිවිල් සමාජයේ ක්‍රියාකාරීන්, ග්‍රාමීය හා ප්‍රජා නායකයෝ, ව්‍යාපාර නියෝජිතයෝ - විශේෂයෙන්ම මනා පාලනයක් පිළිබඳ වාර්තාවන් උසුලන ව්‍යාපාර - රජයේ නොවන සංවිධාන ප්‍රජා සමූහ හා පුණ්‍යාධාර කටයුතුවල නියැලී සංවිධාන - යන මේ හැමටම සාමය ගොඩනැගීම පිළිබඳ කිසියම් වගකීමක් තිබේ යයි හඳුනාගනු ලැබීය. කෙසේ වුවද සිවිල් සමාජයේ ක්‍රියාකාරීන් ගැන බොහෝ විටම සිතනු ලබන්නේ පක්ෂග්‍රාහී (හෝ අපක්ෂපාත නොවන) අය ලෙස ශ්‍රී ලංකාවේ සැම පෙදෙසකම විනිවිදභාවයෙන් යුක්තව කටයුතු කිරීම හරහා ඔවුන් විසින් තමන්ගේ අවංක භාවය ප්‍රදර්ශනය කර සිටිය යුතුයයි දකුණුදිග ආශ්‍රිත නියෝජිතයෝ පෙන්වා දුන්හ. සාමය ගොඩ නගන්නන් ලෙස උගතුන් හා බුද්ධිමතුන් යෝග්‍ය වෙයයි ව්‍යාපාරික කණ්ඩායම් තුනටම අයත් නියෝජිතයෝ සැලකූහ. සාමකාමී සමාජයක් තහවුරු කිරීම සඳහා ආගමික සංවිධානද වගකිව යුතු ලෙස සැලකිණ.

රජය හා දේශපාලන නායකයන් විසින් සාමය ගොඩ නැගීමේ ක්‍රියාවලියෙහි පෙරමුණ ගනු ඇතැයි යනුවෙන් පවත්නා උසස් බලාපොරොත්තුව තුළින් අවශේෂ පර්යේෂණ වලින් සොයාගෙන තිබෙන, ශ්‍රී ලංකාව පුරාම පවත්නා එම විශ්වාසය තහවුරු වේ. එසේ වුවද ආගමික නායකයන් සේම මාධ්‍යකරුවන්ද සැලකිය යුතු තරම් වැදගත් ක්‍රියාකාරීන් වේ යයි කුඩා ව්‍යාපාරිකයන් විසින් සිතනු ලැබීම සැලකිය යුත්තකි. අනාගතයේදී ව්‍යාපාරික ප්‍රජාව සමග වැදගත් හවුල් සන්ධාන ඉදිකිරීමේලා මෙම කරුණ වැදගත් වේ. අතීත් අතට, සාමය ගොඩනැගීමේ සුදුසුකම සම්බන්ධයෙන් විශාල පරිමාණයේ ව්‍යාපාරවලට හිමි වනුයේ පහත් ස්ථානයකි. එහෙත්, සිංහල හෝ මුස්ලිම් අය මෙන් දෙගුණයක දෙමළ නියෝජිත සංඛ්‍යාවක් විසින් සාමය ගොඩ නැගීම සඳහා මහා පරිමාණයේ ව්‍යාපාරයන් වඩාත් වගකීමක් දැරිය යුතුයයි අදහනු ලැබීම සිත් අලවනසුලු කරුණකි. ගැටුම් වැළැක්වීමේ වගකීම සමාන ලෙස සැම දෙනා අතරම බෙදී යා යුතුයයි ඇතැම් සමාගම් නියෝජිතයෝ විශ්වාස කළහ. පුද්ගලයන්. සිවිල් සමාජ සමූහයන්, දේශපාලන පක්ෂ හා රජයද ඊට ඇතුළත් වේ. එක් නියෝජිතයකු විස්තර කළ පරිදි, සාමකාමී සමාජයක් තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන විවිධ වර්ගයේ ශක්තීන් විවිධ ක්‍රියාකාරීන් සතුව ඇත්තේය: රජය-ජන්දයෙන් පත් වී තිබෙන නිසා: පුද්ගලික අංශය - අවශ්‍ය සම්පත් තිබෙන නිසා: සිවිල් සමූහ වර්ගවාදී චින්තයෙන් බැහැරට ගෙන ඒමට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීමට පුළුවන් නිසා - මේ කුඩා සමූහය පවසන පරිදි, සාමය ගොඩ නැගීම යනු සාමූහික ප්‍රයත්නයකි. අප කටයුතු කරන්නේ සාමය ගෙන එමේ ක්‍රියාවලිය රජයටද දේශපාලන පක්ෂවලටද ත්‍රිවිධ හමුදාවලටද අයත් කාර්යයක් ලෙස සිතා ගෙනය. එය එසේ නොවේ. එය අපේය ¨ එක් අයෙක් පැවසීය.

## 2.3 ව්‍යාපාරික අංශය සාමය ගොඩ නැගීමේ කටයුතුත්තෙහි යෙදීමට බලපාන සාධක

### 2.3.1 ව්‍යාපාරමය අංශය සාම ක්‍රියාවලියට මැදිහත් වීමේ පෙළඹවීම් ක්‍රියාවලිය

මෙබඳු පරිශ්‍රමයන් ගැන කැපවීමට ව්‍යාපාරික නායකයන් පෙලඹෙන්නේ ලාබ අලාභ තත්වය වෙත සමාජ ප්‍රශ්න බලපාන ආකාරය හඳුනා ගැනීම මතයයි බොහෝමයක් කොළඹ ආශ්‍රිත හා දකුණු ප්‍රදේශ ආශ්‍රිත ව්‍යාපාර නියෝජිතවරු කියා සිටියෝය. ව්‍යාපාරවලින් සාමය ගොඩ නැගීම විකල්පයක් ලෙස සැලකෙනුයේ එය ඔවුන්ගේම ආත්ම ප්‍රයෝජනයට හිතකර වේ නම් පමණකි. විදේශ ආයෝජනය වැඩිවීමත් සමග නව වෙළඳපලවල් විවෘත වෙයි. ව්‍යාපාරවලට භාවිතා කළ හැකි සම්පත්ද එලෙසින්ම විශාල වෙයි. සාමය ගොඩනැගීමේ කටයුතුවල  නියැලීම යනු ආයතනයේ ප්‍රතිරූපය ඉදි කිරීම හා හොඳහිත වැඩිදියුණු කිරීමේ ප්‍රශ්නයකියි කිහිප දෙනෙක් පැවසුහ.

සමහර දකුණුදිග ව්‍යාපාරිකයන්ට අන්තර් කලාපීය සබඳතා සංවර්ධනය කොට ගෙන එමගින් ව්‍යාපාරික අවස්ථා සංවර්ධනය කර ගැනීමේ හැකියාව අභිප්‍රේරණ සාධකයක් විය. ව්‍යාපාර සංවර්ධනය කිරීම පිණිස වුවමනා සබඳතාවන් සඳහා විවිධ සමූහයන් අතර විශ්වාසය හා මිත්‍රත්වය අවශ්‍යය. අනෙක් අතට, බොහෝ කලක් පුරා වෙන්වී තිබූ කලාප අතර ගොඩ නැගෙන ආර්ථික සබඳතා මගින් විශ්වාසය හා මිත්‍රත්වය ඉදි කළ හැකි වේයයි තවත් අයෙක් කියා සිටියේය. බොහොමයක් නැගෙනහිර දිග ප්‍රතිචාරකයන් පැවසූ අන්දමට ව්‍යාපාරිකයන් සාමය ගොඩ නැගීමට හවුල් නොවන්නේ අභිප්‍රේරණය විරහිත නිසාය. අති සංකීර්ණ හා අනතුරුදායක විය හැකි සාමය ගොඩ නැගීමේ දේශපාලනයට හෝ ගැටුම් ආශ්‍රිත මැදිහත්වීම්වලට අත පෙවීමට ඔවුහු පසුබට වෙති.

වර්තමාන ගැටුම් තත්වය තුළින් මතුවන අවස්ථාමය පිරිවැය නිසා සාමය ගොඩ නැගීම පිළිබඳව සමහර ව්‍යාපාර විසින් වඩාත් විශාල උනන්දුවක් දක්වනු ලබන බව පැවසේ. නිදසුන් වශයෙන්, සිල්ලර පාරිභෝගික භාණ්ඩ අලෙවි කටයුතුවල යෙදී සිටින හා නිරන්තරයෙන්ම භාණ්ඩ ප්‍රවාහණය හා සේවා සැපයීම මත රැඳී පවත්නා ව්‍යාපාරවලට සාමය ගොඩ නැගීම ගැන වැඩි කැපවීමක් ඇත්තේය. දකුණුදිග ප්‍රදේශයෙහි සංචාරක ව්‍යාපාර තුළ සාමය ගොඩ නැගීම ගැන සැලකිය යුතු උනන්දුවක් පවතින බව පෙනේ. එමෙන්ම රජයේ  හා අර්ධ රාජ්‍ය සමාගම් වෙතින් පෙනෙන්නට තිබෙන්නේද සාමය ගොඩ නැගීම හා ගැටුම් වැළැක්වීම පිළිබඳ වඩාත් විශාල උනන්දුවකි.

සාමය ගොඩ නැගිමේ කටයුතුවල යෙදීම සඳහා ඇතැම් ව්‍යාපාරවලට වැඩි සුදුසුකමක් තිබෙන ලෙස සැලකේ. නිදසුනක් වශයෙන්, බැංකු, රක්ෂණ හා අධ්‍යාපනය වැනි තම සේවාලාභීන් සමග දීර්ඝ කාලීන සබඳතා පවත්වා ගෙන එන ආයතනවලට සිය සේවාලාභීන්ගේ චින්තන රටාව වෙනස් කළ හැකි මනා තත්වයක් ඇත්තේය. මීට අමතරව, රැකියා ජනනය කරන ව්‍යාපාරද ජනතාව හා රජය වෙත බලපෑම් දැක්වීම සඳහා වඩාත් සුදුසු තත්වයන් සහිත සංවිධාන වන්නට ඉඩ ඇත්තේය. ඍජු හෝ අනියම් වශයෙන් මේ ගැටුමෙන් පල ප්‍රයෝජන ලබන ව්‍යාපාර මගින් සාම ක්‍රියාදාමය අඩපණ කරන්නට ඉඩ ඇතැයි එක් අයෙක් සඳහන් කළේය. එ කෙසේ වුවද කොළඹ පිහිටා තිබීම හා ආර්ථිකය තුළ වැදගත් කොටසක් රඟ පෑම යන වාසි දෙකම හේතු කොටගෙන රජයට බලපෑම් කිරීමේ හැකියාව ඇත්තේ විශාල පරිමාණයේ ව්‍යාපාරවලට පමණකැයි දකුණේ සහ නැගෙනහිරදිග සියලුම ව්‍යාපාරික නියෝජිතයෝ එකග වූහ.

### 2.3.2 ව්‍යාපාරික අංශයේ සාම මැදිහත්වීම් හා බැඳුනු අවදානම් සාධක

සාමය ගොඩ නැගිමේ හා ගැටුම් වැළැක්වීමේ යෙදෙන ව්‍යාපාරවලට මුහුණ පෑමට සිදුවිය හැකි අවදානම් පවත්නේයයි සමාගම් සියල්ලම වාගේ එකග විය. මේවා මිනිසුන්ගේ අනන්‍යතාව, සාධාරණත්වය හා යුක්තිය පිළිබඳ අදහස් සමග තදින්  සමීප වී තිබීම නිසා වැරදි අවබෝධයට, වැරදි නියෝජනයට හා වැරදි ලෙස අර්ථ නිරූපණයට ඉතාමත් ඉඩකඩ පවතියි. රජය අස්ථාවර වී පවත්නා අවස්ථාවක කිසියම් දේශපාලන දර්ශනයකට සහාය දක්වන්නේ යයි ව්‍යාපාර වෙත චෝදනා එල්ල වීමට ඉඩ ඇත්තේය. සියලුම දේශපාලන පක්ෂ

තිබීම හා (කිසිවකු) මධ්‍යස්ථ නැතැයි ඇඳහීමක් පවත්නා නිසාද ගැටුම් පවත්නා පෙදෙස් තුළ මෙය දැඩි අවදානමක් ලෙස සැලකේ. මෙබඳු චෝදනාවක් නිසා රජය තුළ හෝ ඉන් බැහැර සිටින කණ්ඩායම් විසින් සමාගම හෝ එහි නියෝජිතයන් හෝ භෞතික වශයෙන් ඉලක්ක කර ගැනීමට ඉඩ ඇත්තේය.

ව්‍යාපාරයක අරමුණ වරදවා වටහා ගත් රාජ්‍ය නිලධාරීන් විසින්ද පරිපාලන, ආරක්ෂක හා කාර්යාලයීය බාධක මගින් එම ව්‍යාපාරයේ කටයුතු දුෂ්කර බවට පත් කිරීමට පුළුවන. මහජනයා විසින් ¨හංවඩු ගසනු ලැබීමේ අනතුරද පවතියි. මේ නිසා සමාගමේ ප්‍රතිරූපයට හා කීර්තියට හානි පැමිණේ. ඊටත් වඩා අයහපත් අන්දමින් ජාතිවාදී, අන්තවාදී හෝ සටන්කාමී සමූහවල කෝපයට පාත්‍ර වීමටද ඉඩ ඇත්තේය. සාම කටයුතුවලට සහාය දුනහොත් කුමන අන්දමේ ප්‍රශ්නවලට මුහුණ පෑමට සිදු විය හැකිදැයි අසන ලදුව කොළඹ කුඩා ව්‍යාපාරික ප්‍රජාව ඒ පිළිබඳ අදහස් සැපයුවේ මෙසේය: 42.9% ක් පැවසුවේ දේශපාලනමය ප්‍රශ්න පිළිබඳවය, දේශපාලන මැරවරයන්ගේ තාඩන පීඩනවලට භාජන වීමට හේතුවේයයි බිය. අසල් වාසීන්ගෙන් හෝ වඩාත් වර්ගවාදී අදහස් දරන සෙසු ව්‍යාපාරිකයන්ගෙන් හෝ අහිතකර ප්‍රතික්‍රියාවලට භාජන වේ යැයි තවත් 39.1% ක් බියෙන් පසු වූහ. 11.1% කින් සඳහන් වූ ව්‍යාපාරික ප්‍රශ්න යන අදහසට ඉහත ප්‍රකාශ දෙකද අයත් වෙයි. අතිරේක ආර්ථික බරකට මුහුණ පෑමට යෝග්‍ය සම්පත් සුළු ප්‍රමාණයක් සහිත කුඩා ආයතනවලට තම සංවිධාන ගැන පැතිරෙන අහිතකර අදහස් වඩාත් බරපතල ලෙස බලපානු ඇතැයි ඔවුහු බිය වෙති.

මෙම අවදානම් පැන නගින්නේ ඒවා අවම කරගැනීම සඳහා බුද්ධිමත් ලෙස සැලසුම් නොකළහොත් පමණකියි පැවසූ ප්‍රතිචාරකයෝ දෙදෙනෙක් එසේ කිරීම සඳහා යොදා ගත හැකි අදහස් කීපයක්ද ඉදිරිපත් කළෝය. ඒවාට පහත සඳහන් යෝජනා ඇතුළත් විය. සාමය ගොඩ නැගීමට අදාළ පණිවුඩ හොඳින් පිළිගැනීමට පාත්‍ර වේදැයි සොයා යනු සඳහා අලෙවි පර්යේෂණ පැවැත්වීම. මැනවින් දැනුවත්වී පර්යේෂණ සඳහා ප්‍රවේශය, ක්‍රමෝපාය සැලැස්ම, පණිවුඩය ඔවුන්වෙත ගෙනයෑමේදී නිවැරදි ක්‍රමය අනුගමනය කිරීම. වැරදි අන්දමින් විවරණය වීමට ඉඩ ඇති නිසා එබඳු(සාම) කටයුතු ඉටු කරන්නේ තමන්ගේම වාසියට යයි පෙනීම වළක්වා ගත යුතු යයිද ඔවුහු නිර්දේශ කළෝය. අදාළ අවදානම අවම කර ගැනීමේ එක් උපක්‍රමයක් නම්, සාමූහිකව කටයුතු කිරීම, විනිවිදභාවය ආචාර ධර්ම අනුගමනය හා සාමය ගොඩ නැගීමේ පණිවුඩ සම්බන්ධ කර ගැනීමයි. සාමය එතරම් අගනා නිසා, එය තහවුරු කර ගැනීම සඳහා පුරවැසියන් විසින්ද කිසියම් අවදානමක් පිළිගත යුතුයැයි නැගෙනහිරදිග බොහෝ සමාගම් නියෝජිතයෝ කල්පනා කළහ.

### 2.3.3 අවශේෂ සාධක

සාමය ගොඩනැගීමේ හෝ ගැටුම් වැළැක්වීමේ කටයුතුවල නියැලීම සඳහා තමන් දිරිගන්වන්නට ඉඩ තිබෙන අන් සාධක කවරේද යන්න පිළිබඳව කොළඹ ආශ්‍රිත හා ප්‍රාදේශීය ව්‍යාපාරික නියෝජිතයන් අතර විවිධ අදහස් දන්නට ලැබුණේය. ඔවුන්ගේ ප්‍රතිචාරයන් තුළ රජයට ලැබුණේ ඉතා වැදගත් ස්ථානයකි. රජය විසින් සාමය ගොඩ නැගීම ගැන පැහැදිලි ලෙස ඇප කැප වී තිබීම සැම දෙනාම සඳහන් කළ අවශ්‍යතාවන්ගෙන් එකකි. එක් අයෙකු පැවසූ පරිදි ¨ සාමයේ අවශ්‍යතාවය ගැන සියලුම පක්ෂ එකඟ වූවහොත්, (සාම ක්‍රියාවලියට හා සාම කටයුතුවලට) සහාය වීමද අපට ලෙහෙසිය. එහෙත්, ඔවුන්ට වෙන වෙන න්‍යාය පත්‍ර තිබෙන විට කටයුත්ත ඉතා දුෂ්කරවේ.¨ සාමය ගොඩ නැගීම හා ගැටුම් වැළැක්වීම වෙත තම සහභාගීත්වය සැපයීම සඳහා බොහොමයක් ව්‍යාපාරවලට අවශ්‍ය වූයේ ස්ථාවර රජයක් හා ස්ථාවර මාර්ගෝපදේශ පමණකි.

ව්‍යාපාරවලට සහභාගී වීමට ඉඩ සලසන අන්දමේ ගැලපෙන යාන්ත්‍රණද ඔවුන්ට අවශ්‍ය විය. රජය හෝ වෙනත් ඕනෑම දේශපාලන කණ්ඩායමක් විසින් හෝ තමන්ගේ සාම කටයුතු ප්‍රයෝජනයට නොගැනීමේ සහතිකයක් සමාගම්වලට අවශ්‍ය යයි එක් නියෝජිතයෙක් පැවසීය. ගැටුම් පවත්නා ප්‍රදේශ තුළට පිවිසීමේ ඉඩකඩ පමණක් ප්‍රමාණවත් අභිප්‍රේරණයක් වේ යයි ඇතැම්හු කියා සිටියෝය. එහෙත් මෙම අවදානම පිළිගැනීමට ව්‍යාපාර කැමති වන්නේ රජය විසින් කිසියම් අන්දමක මූලික ආරක්ෂාවක් සැපයුවහොත් හෝ ගැටුම් නිරාකරණයට අදාළ අවදානම් පිළිගැනීමට සතුටු ව්‍යාපාර සඳහා සාමය ගොඩ නැගීම

පිණිස වැය කළ මුදලට සරිලන අන්දමේ බදු සහන හෝ සැපයුවහොත් පමණකැයි තවත් අයට ඒත්තු ගොස් තිබුණේය.

වර්තමාන දේශපාලන හා ආර්ථික තත්වයේ බරපතලකම හා එහි වැදගත්කම ව්‍යාපාර නායකයන් අවබෝධ කර ගත්තේ නම්, රජයේ ස්ථාවරත්වය හෝ මැදිහත් වීම රහිතව ව්‍යාපාරිකයන් සාමය ගොඩ නැගීමේ කටයුතුවල නියැලෙනු ඇතැයි යනු සමහර කොළඹ ආශ්‍රිත සමාගම්වල මතය විය. "ව්‍යාපාර තිබෙන්නේ" සිටින්නේ සැප පහසු කලාපයක නම් ඒවා ක්‍රියාශීලී නොවේ. එහෙත් ව්‍යාපාරයට දැනෙන්ට පටන් ගත්තොත්, ඔවුන් ඒ ගැන යමක් කරන්නට ඉඩ ඇතැයි එක් අයෙක් පැවසීය. යුද්ධයේ අවස්ථාමය පිරිවැය පිළිබඳ දැනුම හෝ සාමයේ ආර්ථික ප්‍රතිලාභ ගැන වටහා ගැනීම වැනි මුදල්මය දිරිගැන්වීම් නිසා සාමය ගොඩ නැගීමේ හා ගැටුම් වැළැක්වීමේ කටයුතුවල නියැලීමට ව්‍යාපාරයන් පෙළඹේ යයි ඔහු තව දුරටත් කියා සිටියේය.

ඊට අයත් සෙසු සාධක මෙසේය: උසස්තම පෙළේ ප්‍රතිපත්ති සම්පාදකයන් වෙත සමීප වීමේ ඉඩකඩ, ව්‍යාපාරවලට සහභාගී විය හැක්කේ කෙසේද යන්න ගැන තවත් අදහස්; සාමය ගොඩනැගීමේ කටයුතු සඳහා මාධ්‍ය සහාය; එබඳු කටයුතුවලට මහජන සහාය; ආශ්‍රිත අයවලුන් හවුල් කරවා ගැනීම; පවත්නා තත්වය ගැන වඩාත් නිවැරදි තොරතුරු ප්‍රවාහණ දුෂ්කරතා ඇතැම් ප්‍රදේශවලට යෑමට නුපුළුවන් වීම හා අනුමැතිය ලබා ගැනීමේ අමාරුකම් ආදිය තමන්ගේ වර්තමාන සාමය ගොඩනැගීම් කටයුතුවලදී ක්‍රියාත්මක මට්ටමින් මුහුණ පාන්නට සිදු වන සාධක ලෙස එක් සමාගමක් විසින් සඳහන් විය. කුඩා පරිමාණයේ ප්‍රාදේශීය ව්‍යාපාරවලට ව්‍යාපාරික ලාබදායක බව ඉතා වැදගත් විය. නැගෙනහිරදිග පෙදෙස්වල ආරක්ෂාව පිළිබඳ තහවුරුව ඉතාමත් වැදගත් සේ සලකන ලදී.

### 2.3.4 වඩාත් කැමති මැදිහත්වීමේ පිළිවෙල හා නායකත්වය

සාමය ගොඩනැගීමේ කටයුතු සඳහා භාවිතා කළහැකි පදනම් දෙකක් පවත්නේයයි කොළඹ ආශ්‍රිත සමාගම් අනුබද්ධ නියෝජිතයෝ විශ්වාස කළහ. රොටරි වැනි පුණ්‍යාධාර සමූහයන්ගේ සාමාජිකයන් වශයෙන් ව්‍යාපාරික ප්‍රධානියෝ දැනටමත් පුද්ගලික වශයෙන් පුණ්‍යමය කටයුතුවල යෙදෙති. වඩාත් ක්‍රියාශීලි තවත් අය වර්ගවාදය, පක්ෂග්‍රාහීවීම හා අන්‍ය මත නොඉවසීම වැනි ප්‍රශ්න ගැන වෙහෙසීමට වඩාත් ප්‍රිය කරති. ව්‍යාපාරමය නොව පුද්ගලික කටයුත්තක් ලෙස සාම කටයුතුවල නියැලීමට තමන් සතුටුයයි බොහෝදෙනා කියා සිටියහ. සමාගමේ පාලන මණ්ඩලයෙන් අවසර ගැනීම සඳහා ගතවන දීර්ඝ කාලය හා කටයුතු වැරදී ගියහොත් ඉන් මතුවිය හැකි අහිතකර ප්‍රතිඵලවලින් සංවිධානය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය ඊට හේතු වශයෙන් ඉදිරිපත් කරනු ලැබීය.

සංස්ථානිය අනන්‍යතාවක් (සමාගමක් මගින්) හරහා සාම කටයුතුවලට මැදහත් වීම තුළ පැහැදිලි වාසියක් තිබේ යයි කොළඹ ආශ්‍රිත නියෝජිත පිරිසෙන් සැලකිය යුතු තරම් කොටසක් විශ්වාස කළෝය. එහෙත්, කණගාටුවකට මෙන් ඉන් බොහෝ දෙනා ඊට කැමති නොවූහ. ව්‍යාපාරමය මෙහෙයවීම යටතේ කෙරෙන මැදිහත්වීමක් තුළ වැඩි විශ්වසනීය බවක් හෝ බලපෑමක් තිබේ යයි පෙනේ. එය සාමූහික උත්සාහයක කොටසක් වීමට පුළුවන. ඒ නිසා එයින් ජනිත වන්නේ වඩාත් පුළුල් බලපෑමකි. බලපෑම් දෙවර්ගය යා කිරීමේ උපාය මාර්ග පවත්නා හෙයින්, අංශ දෙක ඔස්සේම සාමය ගොඩ නැගීම් කටයුතු කළ හැකි යයි යනු කිහිප දෙනකුගේ අදහසයි. නිදසුනක් වශයෙන්, සාමය ගොඩ නැගීමේ වැඩ පිළිවෙළක් සැදීමට, මෙහෙයවීමට හෝ එවැන්නකට සම්බන්ධ වීමට ව්‍යාපාරික විධායකයකුට පුළුවන. ඒ අතර වැඩ ස්ථානයෙහි බෙදුම්වාදී හෝ යුද්ධවාදී ප්‍රතිපත්ති අධෛර්යවත් කිරීමටද පුළුවන.

ඊට සමගාමීව, සමූහයන් අතර වඩාත් සමීප සබඳතා දිරිමත් කිරීමට, විවිධ ප්‍රජාවන්ගේ කලාශිල්ප හැදෑරීමට සහාය දීමට, සහ ක්‍රීඩා සහ එවැනි අවශේෂ කටයුතු පිණිස වෙනස් වෙනස් කණ්ඩායම් ඉදි කිරීමට ඔවුන්ට පුළුවන. කෙසේ වුවද සාමය ගොඩනැගීමේ කටයුතුවලට සහභාගීවීම තුළ පුද්ගලික හා ව්‍යාපාරමය වශයෙන් වඩාත් දැඩි අවධානමක් තිබේ යයි පැවසූ නැගෙනහිරදිග සමාගම් නියෝජිතයෝ එබඳු කටයුතු ඉටු කළ හැකි අන්දමේ ව්‍යාපාර තම පෙදෙස තුළ එතරම් සුලභ නොමැති නිසාද ඒ කටයුතු සමග ඇමිණී

පවත්නා අවදානම නිසාද උතුරු හා නැගෙනහිරදිගට වඩා දකුණු පෙදෙස්වල සංස්ථානික සමාජයීය වගකීම් ආශ්‍රිත කටයුතු පවත්නා බව ඔවුන්ගේ හැඟීමයි.

සාමය සඳහා මැදිහත්වීම් කිසි කලෙකවත් දේශපාලනමය ගති ලක්ෂණවලින් සමන්විත යුතු නොවේ. ඒවා නිරතුරුවම සමාජයීය ස්වභාවයක් දැරිය යුතුයයි කියැවෙන පැහැදිලි යෝජනාවක් දකුණුදිග ව්‍යාපාර අතර පැවතිණ. ලාභ ලැබීමේ චේතනාව නිසා, සාමය ගොඩ නැගීමේ කටයුතුවල අව්‍යාජබව හීන වෙයයිද වඩාත් කොන්දේසි මත රැඳීමට ඉඩ ඇතැයිද යනු බොහො දෙනාගේ අදහස විය. එබැවින් ඒ සඳහා වඩාත් යෝග්‍ය වනුයේ පුද්ගලික ප්‍රවේශයකි. මහා පරිමාණයේ ව්‍යාපාර සතු සම්පත් හා ඒවායේ ක්‍රියාත්මක ප්‍රදේශයෙහි විශාලත්වය නිසා සාම කටයුතුවලට මැදිහත් වීම සඳහා ඉතාමත් සුදුසු සමූහය හැටියට විශාල පරිමාණයේ සමාගම් හඳුනාගන්නා ලදී. සාමය ගොඩ නැගීමේ හා ගැටුම් වැළැක්වීමේ ආරම්භක පියවරවලදී ව්‍යාපාරික ප්‍රජාව මෙහෙයවිය යුත්තේ කවුරුන් විසින්ද යන්න ගැන විවිධ මත ප්‍රකාශ විය. කොළඹ ආශ්‍රිත ඇතැම් නියෝජිතයන් පැවසූ පරිදි, ඔවුන් තමන් අගයන, එකට කටයුතු කරන අයවලුන් විසින් තෝරාගත් නියෝජිතයන් විය යුතුය. මේ අතර වෙළඳ සංගම් ඒ සඳහා සුදුසු වේදිකාවක් යයි තවත් අය කියා සිටියෝය. ආර්ථිකය වෙත විශාල දායකත්වයක් සැපයෙනුයේ සේවා සහ කර්මාන්ත බඳු ප්‍රධාන අංශ විසින් බැවින් සාම ක්‍රියාවලිය හා සම්බන්ධිත ප්‍රධාන ක්‍රියාකාරීන්ට බලපෑම් කළහැකි තත්වයක ඔවුන් සිටින නිසාද එම අංශ විසින් සාම ප්‍රයත්නයේ ප්‍රධානත්වය දැරිය යුතුයයි සෙසු අය පැවසූහ. ජාත්‍යන්තර අත්දැකීමෙන් ප්‍රයෝජනයට ගත හැකි බහු ජාතික සමාගම්ද ප්‍රධාන භූමිකාවක් සඳහා සුදුසු වෙයයි සඳහන් විය. සාමය ගොඩනැගීමේ කටයුතු වැඩිදියුණු කරනු සඳහා එතරම් කැපී නොපෙනෙන අය වඩාත් ඵලදායක වේ යයි සෙස්සෝ යෝජනා කළහ. අවංකකම, සාමය පිළිබඳ විශ්වාසය හා ප්‍රබල නායකත්වය සහිත ඕනෑම සමාගමකට සාම කටයුතුවල නියැලීමේ පුළුවන්කමක් තිබේයයි කිහිප දෙනෙක් කීවෝය. දීපව්‍යාප්ත ප්‍රතිඵල ලබා ගත හැක්කේ ඒ ඒ ප්‍රදේශවල ප්‍රබල තත්වයේ පසුවන විවිධ කර්මාන්ත එක්සත් වූවොත් පමණකි.

සාමය සඳහා මැදිහත්වීම්වලට අවශ්‍ය කරන කාලය හා පරිශ්‍රමය ගැන සලකන විට ආර්ථික කටයුතු මෙහෙයවිය හැක්කේ ප්‍රමාණවත් මිනිස් හා ප්‍රාග්ධන සම්පත් සහිත සමාගම්වලට පමණකිය යනු දකුණුදිග ආශ්‍රිත සමාගම් නියෝජිතයන්ගේ හැඟීම විය. වැරදි අවබෝධය නිවැරදි කළ හැක්කේ පුළුල් ජාලයක් සහිත ව්‍යාපාරවලට පමණකියි ඔවුහු සඳහන් කළෝය. නැගෙනහිරදිග ආශ්‍රිත නියෝජිතයන් විසින් විශාල පරාසයකට වැටෙන විභව නායකයන් හඳුනා ගන්නා ලද නමුත්, බහුතරය වූයේ විශාල සේවා යෝජකයන්, ජාතික සංගම් හා මාධ්‍ය ආයතනයි.

# 3 සාමය ගොඩනැගීම සඳහා වූ ව්‍යාපාරමය ආරම්භක පියවර

ගැටුම් පිලිබඳ කටයුතු හා සම්බන්ධිතව තිබේ යයි ව්‍යාපාරිකයන් විසින් හඳුනා ගන්නා ලද ප්‍රමුඛතා, අවදානම් හා අවස්ථා ගැන සාකච්ඡා කිරීමෙන් පසු, සාමය ගොඩ නැගීම සඳහා ව්‍යාපාර අංශය විසින් දරන ලද ආරම්භක පියවර දෙකක් මේ වාර්තාව ඉදිරිපත් කරයි. පළමුවැන්න "ශ්‍රී ලංකාව පළමුව" නමැති කොළඹ ව්‍යාපාර මගින් ඉදිරිපත් කරන ලද සාමය සඳහා වූ පියවරකි. දෙවැන්න ප්‍රාදේශීය වෙළඳ සංගම් හා සාමය සඳහා ව්‍යාපාර සන්ධානය යන සංවිධානවල සහභාගීත්වය සහිත දිපව්‍යාප්ත විශ්වාසය ගොඩ නැගීමේ ප්‍රයත්නයකි. දේශපාලන මට්ටමේදී බලපෑම් කිරීම පිණිස විශාල පරිමාණයේ ව්‍යාපාර විසින් හා කොළඹ පාදක කොටගත් සාම ක්‍රියාවලීන් වෙත බලපාන ප්‍රාදේශීය ස්වරය ප්‍රබල කිරීම සඳහා ජන වර්ග හරහා අවධානය යොමු කරන ප්‍රාදේශීය මට්ටමේ කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යවසායයන් විසින් අනුගමනය කරන ලද විවිධ ප්‍රවේශයන් මොනවාදැයි මේ උදාහරණ යුවලෙන් පෙනේ.

## 3.1 ශ්‍රී ලංකාව - පළමුව

දශක තුනක් ඉක්මවන කාලයක් පුරා පවතින ගැටුමක් සහිත වුවද බොහෝ කලෙක සිට ශ්‍රී ලංකාව පෙනී ගොස් ඇත්තේ අඛණ්ඩ ආර්ථික වර්ධනයක් සහිත රටක් ලෙසිනි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, සාමය ගොඩ නැගීමේ ආරම්භක කටයුතුවලට සහය වන ලෙස විශාල පරිමාණයේ ව්‍යාපාරයන්ට බල කළ අඛණ්ඩ පීඩනයක් කවදාවත් නොවීය. වර්ෂ 2001 දී කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපලට එල්ල කළ බෝම්බ ප්‍රහාරය සහ ඒ වසරේදීම පැන නැගුණ බරපතල බල ශක්ති අර්බුදය නිසා ප්‍රචණ්ඩත්වය හරහා මහා පරිමාණයේ සංවිධානවලට සිදුවිය හැකි හානිය පෙනෙන්නට විය. මේ සිද්ධීන් යුවලේ ඒකාබද්ධ බලපෑම නිසා, දළ දේශීය නිෂ්පාදනය ඍණ අතට හැරුණේය. යුද්ධය පැවති වසර මුළුල්ලේම මෙසේ සිදුවූ පළමුවැනි අවස්ථාව මෙයයි.

ගැටුමේ ආර්ථික පිරිවැය ගැන වඩාත් පැහැදිලිව පෙනෙන්නට වූ කල කිසිවක් කිරීම සඳහා ව්‍යාපාර වෙත එල්ල වූ බලපෑම්ද ශක්තිමත් විය. පළමු වරට සාමය පිණිස බලපෑම් කිරීම් සඳහා කොළඹ ව්‍යාපාරික ප්‍රජාවේ සාමාජිකයෝ සංධාන ඉදි කරන්නට ගත්හ. මෙයින් ඉතා හොඳින් කැපී පෙනුණේ පළමුව ශ්‍රී ලංකා (ප. ශ්‍රී) සංවිධානයයි. මෙය ගොඩ නගන ලද්දේ ඇඟලුම් තේ, සංචාරක සේවා හා භාණ්ඩ ප්‍රවාහන අංශවල නියැලි වෙළඳ සංගම් සමූහයක් විසිනි. වහාම සාකච්ඡා අරඹා ගැටුම සඳහා සාමකාමී විසඳුමක් පිණිස ඉල්ලා සිටින යෝජනාවකට සහයවීම උදෙසා පුරවැසියන් ක්‍රියාත්මක කිරීම සඳහා පවත්වන ලද ප්‍රථම, සංවිධානාත්මක, ඉහළ මට්ටමේ ව්‍යාපාරය එයයි. ශ්‍රී ලංකාවේ විශාල පරිමාණයේ ව්‍යාපාර සියල්ලම වාගේ තිබෙන්නේ කොළඹ ප්‍රදේශයෙහිය. ඒවා ප්‍රධාන වශයෙන්ම අපනයන ප්‍රවණතාවෙන් යුතුය.

කොළඹ වෙළඳ සංගමය රටේ තිබෙන විශාලතම සමාගම් 500 නියෝජනය කරයි. දළ දේශීය නිෂ්පාදනයෙන් 40% ක් පමණ ලැබෙනුයේ ඒවා මගිනි. ශ්‍රී ලංකාව පළමුව ව්‍යාපාරය 2001 අවසාන භාගයේදී පැන නැගුණේ කොළඹ වෙළඳ සංගමයේ සාමාජිකයන් තුළිනි. රාජ්‍ය මට්ටමේදී කොළඹ වෙළඳ සංගමයට එක්තරා බලයක් තිබූ අතර එය සිටියේ සංවර්ධන කටයුතු සඳහා දායකයන්ගෙන් මුදල් ඉල්ලීමට සුදුසු තත්වයකය.

ශ්‍රී ලංකාව පළමුව යන ව්‍යාපාරයේ අවධාරණය යොමු වී තිබුණේ යුද්ධයේ ආර්ථික පිරිවැය සහ "සාම ලාභාංශයේ" සමාජ හා ආර්ථික ප්‍රතිලාභ ගැන මහජනතාව දැනුවත් කිරීමය. මෙම ව්‍යාපාරය මගින් සාමයට පක්ෂපාතී මහජන රැස්වීම් හා පෙළපාලි ගණනාවක් සංවිධානය කරනු ලැබීය. සාමයට තුඩදෙන අන්දමේ පියවර ගන්නා ලෙස ව්‍යාපාර අංශයෙන්

ඉල්ලා සිටි මාධ්‍ය ප්‍රචාරයකින්ද ඊට සහාය සැලසුනේය. එහෙත්, ගැටුමට විසඳුම් වශයෙන් දේශපාලන විසඳුම් කිසිවක් ඉදිරිපත් නොකරන ලදී. එහි ප්‍රධාන කාර්යය වූයේ ප්‍රතිමල්ල පාර්ශ්වයන්ට සාකච්ඡා මේසය වෙත පැමිණෙන ලෙස බල කිරීමය. මෙම වැඩ සටහන ක්‍රියාත්මක වූ  කාලසීමාව වැදගත් ලෙස සිතිය යුත්තේ එය 2001 දෙසැම්බර් මැතිවරණ කාලයටම සමගාමී වූ බැවිනි. සාමයට ලැදි ඡන්ද අපේක්ෂකයන්ට සිය කැමැත්ත ප්‍රකාශ කිරීම පිණිස ඡන්දදායකයන් පෙළඹවීම සඳහා ශ්‍රී ලංකාව පළමුව ව්‍යාපාරය විසින් පෝස්ටර් හා පුවත්පත් දැන්වීම් රාශියක් පළ කරනු ලැබීය. මෙකී ව්‍යාපාර මගින් මෙහෙයවුණු පෙළඹවීම සාමයට ලැදි රජයක් බලයට පත් වීමට ආධාර විය.

2002 සටන් විරාම ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් පසු ශ්‍රී ලංකා පළමුව ව්‍යාපාරයේ ප්‍රචාරක කටයුතු නතර වූ අතර සාම ක්‍රියාවලිය දේශපාලනඥයන් අතම රුඳෙන්නට ඉඩ හරින ලදී. ගතවූ වසර කීපය තුළදී ආර්ථිකයට එක්තරා අන්දමේ ස්ථාවරත්වයක් ගෙන දුන් යුද්ධයත් නැති- සාමයත් නැතිතත්වය යටතේ අඛණ්ඩ වැඩ පිළිවෙළක අවශ්‍යතාවක් නැතැයි කොළඹ ආශ්‍රිත ව්‍යාපාර ප්‍රජාවට හැඟී ගොස් තිබේ. දේශපාලන මට්ටමේදී බලපෑම් දක්වන කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම සඳහා ප්‍රධාන ව්‍යාපාරික පිරිසක් යළි ක්‍රියාත්මක කරවීමේ අටියෙන් ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන් මුණ ගැසීම පිණිස ඉන්ටර්නැෂනල් ඇලර්ට් සංවිධානය විසින් දකුණු අප්‍රිකානු ව්‍යාපාරික හාරයේ ප්‍රධානියා මෙරටට ගෙන්වන ලදී. මෙම පැමිණීමත් සමගම, දකුණු අප්‍රිකානු සාම ක්‍රියාවලිය සඳහා බෙහෙවින් සාධක වූ පුද්ගලයන් මුණ ගැසීම පිණිස ශ්‍රී ලංකාව පළමු සංවිධානය මගින් ආපසු සංචාරයක් පැවැත්වීමේ අදහස ජනිත විය. මේ අරමුණ ඇතිව ශ්‍රී ලංකාව  පළමු සංවිධානය හා තවත් ව්‍යාපාරිකයන් 10ක කණ්ඩායම සමග ඒකාබද්ධ විශ්ලේෂණ මාලාවක් පැවැත්වීමට ඉන්ටර්නැෂනල් ඇලර්ට් සංවිධානය පහසුකම් සැලසීය. සහභාගී වූවන් විසින් ප්‍රධාන අභියෝග දෙකක් හඳුනා ගන්නා ලදී: තමන්ට සාම ක්‍රියාවලියට සහාය විය හැකි අන්දම ගැන වඩාත් හොඳ අවබෝධයක් ලබා ගැනීම සහ සාමය සඳහා ඒකාබද්ධ සහායක් දැක්වීමේ අවශ්‍යතාව ප්‍රබල ආධාරක හා උපදේශක භූමිකාවක් රඟපෑමට සමත් වේයයි සිතන ලද දේශපාලන ක්‍රියාකාරීන් හා පුවත්පත් කලාවේදීයෝද 2004 මැයි මස පැවැත්වුන දකුණු අප්‍රිකාවට ගිය නියෝජිත පිරිසට අයත් වූහ. පිළිවෙළින් රජය හා  අප්‍රිකානු ජාතික සංගමය වෙනුවෙන් සාකච්ඡා සඳහා පෙනී සිටි රොල්ෆ් මේයර් සහ සිරිල් රමපෝසා සහ සාම ක්‍රියාවලියේ ප්‍රධාන ස්ථානය ඉසිලූ දේශපාලන ව්‍යවස්ථාමය සංවාදය පහසු කරවූ තියුන්ස් එලෝෆ් හා කොලින් කෝල්මන් යන උපදේශක ව්‍යාපාරික ව්‍යාපාරයේ නායකයෝද ඊට අයත් වූහ. මේ රුස්වීම් මාලාව නිසා දකුණු අප්‍රිකාවේ ගැටුම් නිරාකරණ අත්දැකුම ගැන තව දුරටත් ගවේශනය කිරීමට හා ශ්‍රී ලාංකික සන්දර්භය යටතේ අදහස් සංවර්ධනයටද තව දුරටත් ඉඩ සැලසුණේය.

දකුණු අප්‍රිකාවේ සාම ක්‍රියාවලිය වෙත ව්‍යාපාර නායකයන් ධනාත්මක ප්‍රතිචාරයක් දැක්වූයේ කෙසේද ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන ප්‍රතිපත්ති හා වැඩ සටහන් සඳහා අංශමය සහායක් පෙන්වීමට ඔවුන් දිරිගැන්වුණේ කෙසේද යන්න පිළිබඳ නැවුම් විස්තරයක් මේ චාරිකාව නිසා නියෝජිතයන්ට ලැබුණේය. එමෙන්ම කලින් අවදානම් ලෙස සැලකුණු ප්‍රශ්නවලට මුහුණ දීම සඳහා අවශ්‍ය විශ්වාසය එමගින් ලැබුණ අතර ඔවුන් අතර විශ්වාසයක්ද ජනිත විය. සහභාගි වූ එක් අයකු පැවසූ අන්දමට "(දකුණු අප්‍රිකාවේදී) වැදගත් පාඩම් ඉගෙන ගන්නට ලැබුනේය. ප්‍රදේශ ගැන සැලකිලිමත් වීමේ වැදගත්කම කොළඹ සිටි විශාල ව්‍යාපාරිකයෝ වටහා ගත්හ. සමාව දී ඉදිරියට යෑම අමතක කිරීම අවශ්‍ය නැහැ. මෙය ශ්‍රී ලංකාවට විශාල වැදගත් පණිවුඩයක්" ආපසු පැමිණීමෙන් පසු (ව්‍යාපාර නියෝජිත) සමූහය එක්සත්ව සිටියි. සතිපතාම වාගේ රුස්වෙයි. ඔවුන්ගේ ප්‍රධාන අරමුණ වී තිබෙන්නේ සාම ක්‍රියාවලියේදී ඇතුළත් වීම ප්‍රවර්ධනයටය. ශක්තිමත් සාම ක්‍රියාවලියක් සඳහා පුළුල් දේශපාලන සහයේ අවශ්‍යතාව දකුණු අප්‍රිකාවෙන් ඔවුහු ඉගෙන ගත්හ.

දේශපාලන පක්ෂවල අවශ්‍යතා සහ තත්වයන් ගැන වඩා යහපත් අවබෝධයන් ලබා ගැනීම පිණිස සමූහය විසින් වෙන් වෙන්ව දේශපාලන පක්ෂ මුණගැසී තිබේ. විධිමත් සාම ක්‍රියාවලිය පිළිබඳව එක් පක්ෂ තුළ පවත්නා වෙනස්කම් නිරාකරණයකර ගැනීම පිණිස පහසුකම් සැපයුම්කරුවකු ලෙස කටයුතු කිරීමට දැන් එය අදහස් කරයි. ශ්‍රී ලංකාවේ විවිධ

දේශපාලන සංවිධාන සමග සාකච්ඡා ගණනාවක් පැවැත්වීමටද අප්‍රිකානු සංචාරය හේතු වී තිබේ. ව්‍යාපාර නායකයන් විසින් කොටි සංවිධානය යටතේ තිබෙන වන්නි ප්‍රදේශයට ගිය ගමණක්ද ඊට අයත්ය.

කෙසේ වුවද දේශපාලනමය දරදඬුතාව නිසා දෙපාර්ශ්වය වෙතින්ම නියත ප්‍රතිචාරයක් ලැබී නැත. දේශපාලන විසඳුම්වලට සාර්ථක විය හැක්කේ පවත්නා ගැටුමට විකල්ප සෙවීමේ උනන්දුවක් හෝ ඊට පොළඹවන පීඩනයක් තිබේ නම් පමණකියි යන්න එයින් ප්‍රදර්ශනය මත වෙන්නට ඇත. ශ්‍රී ලංකාවේ දෙපාර්ශ්වයම ක්‍රියාවලිය යළි පණ ගැන්වීම සඳහා නව ආරම්භක පියවරවල් දියත් නොකළ හැකි තරමට ඔවුන්ගේම අභ්‍යන්තර ප්‍රශ්නවල ගිලී සිටියෝය.

## 3.2 සාමය ගොඩනැගීම සඳහාවූ ව්‍යාපාරමය මැදිහත්වීම්

ඉන්ටර්නැෂනල් ඇලර්ට් හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ ආධාර සහිතව 2002 නොවැම්බර් මස මෙම සංවිධානය පිහිටුවන ලදී. මේ වූකලී ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රාදේශීය හා ජන වාර්ගික ව්‍යාපාර මැනැවින් නියෝජනය කරන ප්‍රාදේශීය වෙළඳ සංගම් 17ක ව්‍යාපාරික නියෝජිතයන් ඇතුළත් ක්‍රියාකාරී සමූහයකි. සහාය වීම, ජන වාර්ගික හේතු නොසලකා අන්තර් ව්‍යාපාරික සබඳතා ඉදි කිරීම සහ සාම ක්‍රියාවලිය සඳහා ප්‍රාදේශීය නියෝජනය අරමුණ වේ. එය පැන නැගුණේ ඒ ඒ සංගමය සමග පැවැත්වුණු අර්ධ සාකච්ඡාවලින්, සුදුසු පුද්ගලයන් හඳුනා ගැනීමෙන් හා සහභාගි වන අය අතර විශ්වාසය ගොඩ නැගීමෙන් පසුවය. යුද්ධ සමයේදී දකුණ සමග අපේ කිසිම ව්‍යාපාරික හෝ පුද්ගලික සබඳතා නොතිබුණේය. පළමුවැනි රැස්වීම ගැන ආවර්ජනා කළ එක් උතුරේ සාමාජිකයෙක් පැවසීය. උතුරේ අය එක් පැත්තකින්ද දකුණේඅය අනිත් පැත්තෙන්ද වාඩි වූහ. අපට ටිකක් සැක හිතුණා. තේ බොන අවස්ථාවේදී එතරම් මිත්‍රකමක් තිබුනේ නැහැ. අපි කෑම ගත්තේ වෙනම. ඒ දෙදින තුළදී අපට දකුණේ අය රාශියක් මුණ ගැසුණා. නමුත් සුළු කලකට පසුව අපි මිත්‍ර වුණා එක අපිට හරිම අත්දැකීමක්. පළමුවරට දකුණේ අය සමග හැසිරෙන්න වුණාම මූලික පූර්ව නිගමන සෙමින් සෙමින් යටපත් කරගෙන පොදු සබඳතා ඇතිකර ගත් අන්දම තවත් අයෙක් විස්තර කළේ මෙසේය "එකිනෙකාගේ අත්දැකීම් තේරුම් ගන්න කාලයක් උවමනා කළා. මේ අය ත්‍රස්තවාදියෝ කියා අපට හැඟුණා මෙතරම් විනාශයක් කළ මේ මිනිසුන් ගැන කෝපයක් ඇති වුණා ............. ඒ වුනත් එකට වාඩිවෙලා කතාබස් කරන්ට පුළුවන් බව අපට වැටහුණා අපිට පොදු ප්‍රශ්න තිබෙන වග තත්පර ගණනකදී අපට වැටහුණා".

තමන් ක්‍රියා කරන ප්‍රජාවන් තුළ මේ සංවිධානයේ සාමාජිකයන් සතුව ඇත්තේ සෑහෙන තරම් බලපෑම් ශක්තියකි. දේශපාලනඥයන්, නිලධාරීන්, ජාත්‍යන්තර සංවිධාන හා සෙසු තීරණ ගන්නන් වෙත සමීපවීමට ඔවුන්ට පුළුවන. එබැවින් ඔවුහු සමාජයේ පතුලේ මෙන්ම මුදුනේද සබඳතා ඇත්තෝ වෙති. ගැටුම් සහිත පාර්ශ්වයන් සමගද ඔවුන්ගේ තිරස් සබඳතා ඇත්තේය.

ඉන්ටර්නැෂනල් ඇලර්ට් හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන මගින් පහසුකම් සපයන ලද නොකඩවා පවත්වන ද්වි මාසික රැස්වීම් සහ රට පුරා තිබෙන එකිනෙකාගේ සංගම් වෙත යෑම් ඊම් ආදිය නිසා ශක්තිමත් පදනමක් ඉදිවී  තිබේ. එය දැනටමත් වැදගත් ජයග්‍රහණයක් වී ඇත්තේය. අන්තර් සාංගමික හවුල් ව්‍යාපෘති හා තාක්ෂණවේද හුවමාරු වැඩ සටහන් ආදිය සඳහා නොකඩවා අදහස් ඉදිරිපත් වීම ගැන සැලකිය යුත්තේ කොළඹින් බාධාවක් නොමැතිව උතුරු දකුණු ව්‍යාපාර අතර නව සබඳතා ඉදිවෙමින් පවත්නා සැටි පෙන්වන දර්ශකයක් ලෙසිනි.

සාමය සඳහා ව්‍යාපාර සන්ධානය රටපුරා විවිධ ස්ථාන 12 ක රැස්වීම් පවත්වා තිබේ. එමෙන්ම පුද්ගලික අංශයේ අභිලාෂයන් හා සාමය ගොඩ නැගීම එක්තැන් කරවන ව්‍යාපෘති මාලාවක්ද දියත් කර ඇත්තේය.

- රටේ සෙසු පෙදෙස්වල තිබෙන සංගම් හා යාපනයේ වාණිජ සංගමය අතර ව්‍යාපාර හුවමාරු චාරිකා මෙම කටයුතු මගින් අන්තර් කලාපීය ආර්ථික කටයුතු සහ ප්‍රජාමය හා අන්තර් පෞද්ගලික අවබෝධය වැඩිදියුණු කිරීම අපේක්ෂිතය.
- සාමය සඳහා ව්‍යාපාර සන්ධානය විසින් සිය සාමාජිකයන්ට සලස්වා තිබෙන සහයෝගය හා මිත්‍රත්වය පැතිරවීමේ අටියෙන් සැලසුම් කරන ලද සාම චාරිකා, දිවයිනේ සෙසු පෙදෙස්වලට ව්‍යාපාරික හා සාම චාරිකා, යෑමට අදහස් කරන ප්‍රාදේශීය සභාවල සාමාජිකයන් සඳහා සම්බන්ධීකරණය සලසන්නකු ලෙස සන්ධානය කටයුතු කරයි. ආයෝජනය සඳහා උචිත අංශමය හවුල්කරුවන් සැපයුම්කරුවන් හෝ බෙදාහරින්නන් සොයා ගැනීම වැනි ව්‍යාපාරමය අංශයන් නිතරම මේ චාරිකාවලට ඇතුළත් වේ.
- සන්නිවේදන හා ඉදිරිපත් කිරීම් කුශලතා, සාමය ගොඩ නැගීම හා සංස්ථානික සමාජයීය වගකීම වැනි විෂයයන් කේන්ද්‍ර කරගත් පුහුණු වැඩ මුළු.
- ශ්‍රී ලංකා වාණිජ සංගමය හා ශ්‍රී ලංකාවේ වාණිජ හා කර්මාන්ත සංගම් සංවිධානය සමග එකතුව 2004 දී සාමය සඳහා ව්‍යාපාර සන්ධානය විසින් බෙදා හරින ලද ඩිරෙක්ටරිය (directory) නිපැයුම් සම්බන්ධීකරණය.
- අදාළ ප්‍රදේශ යුවලේ පවත්නා ආර්ථික හා සමාජ සංවර්ධන ප්‍රශ්න හඳුනා ගැනීම පිණිස උතුරේ හා නැගෙනහිර පවත්නා ප්‍රාදේශීය සංවාදයේ සම්බන්ධීකරණ ආයතනය ලෙස කටයුතු කිරීම.
- "සාම පාලමක්" - එනම් සාමයට අනුබල දීම සඳහා අන්තර් කලාපීය වාණිජ හා ආයෝජන "පොලක්" පැවැත්වීම සංස්කෘතික අංග හා ආහාරපාන, සාහිත්‍ය ආදිය බෙදා හදා ගැනීමද ඇතුළත්.
- සුනාමි ව්‍යසනය වෙත දැක්වුණු ප්‍රතිචාරයක් වශයෙන් සන්ධානයේ සාමාජික සංගම් විසින් දේශීය ජනතාව මුණ ගැසීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධරයන්ට සහය වීම හා ඔවුන්ගේ අවශ්‍යතාවන් යළි ඉදිකිරීම් හා සැලසුම් බාර අය වෙත දැනුම් දීම ආදී කටයුතු කර තිබේ.

විශේෂයෙන්ම ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනයන් පෙළඹවීම උදෙසා වඩාත් ශබ්ද නැගීමටද ව්‍යාපාරික ප්‍රජාවේ සාමාජිකයෝ තීරණය කළහ. සංවිධානය විසින් මේ සම්බන්ධයෙන් තරමක ප්‍රගතියක් ලබා තිබේ. නිදසුනක් වශයෙන්, ව්‍යාපාර හා යළි ඉදිකිරීම්වලට සහාය වීම සඳහා අඩු පොලී අය කරන, ඇප නොඉල්ලන කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යවසායක බැංකුවක් අරඹන ලෙස මේ කණ්ඩායම රජයට සාර්ථක ලෙස කරුණු දක්වා තිබේ. දැන් ගාල්ල අම්පාර හා යාපනය යන තැන්වල මෙම බැංකු ශාඛා විවෘත වී තිබේ. තවත් අවස්ථාවකදී යාපනයේ වෙරළ ඔස්සේ අම්පාර ධීවර ඔඩයක් විවෘත කරන ලෙස සාම ලේකම් කාර්යාලය පොළඹවා ගැනීමට ඔවුහු සමත්වූහ. එමෙන්ම යාපනයට යන ඒ 9 මාර්ගයද දිවා භාගයේ පමණක් නොව දවසේ 24 පැය පුරාම විවෘතව තැබීමටද පොළඹවා ගනු ලැබීය. කොටිපාලන ප්‍රදේශය හරහා දිවෙන මේ මාර්ගය වැදගත් සැපයුම් මාර්ගයකි. එමෙන්ම උතුර හා රටේ සෙසු පෙදෙස් සමග පවත්නා එකම ගොඩබිම් සබඳතාවද වෙයි. ව්‍යසනය සිදුවූ වහාම අදාළ ප්‍රදේශවල සහන හා පුනරුත්ථාපන කටයුතු සම්බන්ධීකරණය සඳහා රජය විසින් පිහිටුවන ලද දිස්ත්‍රික් මට්ටමේ කාර්ය බලකායේ කටයුතුවලට ක්‍රියාත්මක ලෙස සහභාගී වීම සඳහා සන්ධානයේ ප්‍රාදේශීය සංගම් නියෝජිතවරුන්ටද ආරාධනා කරන ලෙස (කොළඹ පාදක කොටගත් හවුල් ජාලය පළමුව ශ්‍රී ලංකාව ව්‍යාපාරය මගින්) රජය කැමති කරවා ගනු ලැබීය.

සාමය සඳහා ව්‍යාපාර සන්ධානය විසින් ජයගත යුතු අභියෝග ගණනාවක් වෙයි. හුදෙක් ව්‍යාපාර පැවැත්වීමට තදින් බරවීම ඉන් එකකි. සාමය ගොඩ නැගීම සඳහා අන්තර් ප්‍රාදේශීය ව්‍යාපාර සබඳතා ප්‍රයෝජනවත් වේ. එහෙත් කාලය හා මුදල්මය බාධක ගැන සිතන විට, එහි සාමාජිකයන්ට පෙනෙන්නට ඉඩ ඇති පරිදි, සාමය සඳහා ව්‍යාපාර පවත්වාගෙන යෑම සඳහා එය ප්‍රමාණවත් සාධාරණ හේතුවක් නොවන්නට ඉඩ තිබේ. තරගය හා අක්‍රියාකාරිත්වය රිංගා ගැනීම වැළැක්වීම සඳහා සංගම් හෝ රාජ්‍ය නොවන

සංවිධාන වැනි සෙසු සංවිධානවලින් එය වෙනස් වන පරිදි එහි බල අධිකාරිය සංශෝධනය කර ගැනීමටද සංවිධානය පරිස්සම්විය යුතුය. ආර්ථික අවස්ථා නිසා දකුණුකරයේ වරප්‍රසාද ලත් සමාගම් බිහිවුවා විනා එය අනික් අතට සිදු නොවීය යනුවෙන් උතුරුකරය තුළ පෘථුල වශයෙන් පවත්නා සංකල්පය ගැන සන්ධානය සංවේදීව සිටීම සියල්ලටම වඩා වැදගත් කරුණක් වේ. උතුර යනු " පිට අය සඳහා තිබෙන වෙළඳපලකි" යනුවෙන් උතුරුකරය තමන් ගැනම සිතන අන්දම ක්ෂණික අවශ්‍යතාවක් ලෙස සලකා නිරාකරණය කළ යුත්තකි. සාමය සඳහා ව්‍යාපාර සන්ධාන විසින් හෝ එය හරහා හෝ සැලසුම් කර තිබෙන කිසියම් හවුල් ව්‍යාපාරයක් වේ නම්, එය විසින් ප්‍රාදේශීය ජනතාව අතර පවත්නා එබඳු සංකල්ප අහෝසි කිරීමට උත්සාහ ගත යුතු වේ. මේ සඳහා වඩාත් ක්‍රියාශීලී මාධ්‍යමය ක්‍රමෝපායක් අනුගමනය කිරීමට සාමය සඳහා ව්‍යාපාර සන්ධානයට අවශ්‍ය වන්නට ඉඩ තිබේ. යාපනය හා මඩකලපුව අතර ව්‍යාපාරික සබඳතාවලදී මඩකලපුව පිළිබඳව යාපනය සතුට ඇතැයි සැලකෙන ඊට සමාන ආධිපත්‍යය පිළිබඳ බියද නිරාකරණය කරගත යුතු වේ.

මේ දක්වා තරමක් ලිහිල් පිළිවෙළක් සේ පැවති තත්වයන් දැන් සන්ධානය විසින් ආයතනගත කරමින් තිබේ. සාමය සඳහා ව්‍යාපාර සන්ධානය නෛතික ආයතනයක් ලෙස ලියා පදිංචි කිරීම සහ ව්‍යාපෘති ආශ්‍රිත මූල්‍ය සම්පාදන සඳහා අයදුම් කිරීමද ඊට ඇතුළත් වෙයි. මේ අනුව සාමය ගොඩ නැගීමේ නියත කටයුතුවල නියැලීමට ඉඩ සැලසේ කොළඹින් බැහැර තිබෙන සිවිල් සමාජයීය සංවිධාන දුර්වල බව සලකන විට මෙය අසාමාන්‍ය ලෙස දැනුවත්, පැහැදිලි ප්‍රාදේශීය මුල් සහිත සමූහයකි. එහි ශක්තිය ඇත්තේ සුවිශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට වඩා ජාල සහ සබඳතා ගොඩනැගීමේ හැකියාවන් තුළය. ප්‍රාදේශීය සිවිල් සමාජය තුළ එහි සාමාජිකයන්ට හිමිව තිබෙන උසස් ස්ථානය නිසා විභව සාම මැදිහත් වීම් ගැන තව දුරටත් සොයා බැලීමේ අවස්ථාවක්ද සැලසේ.

# 4. නිගමන

2001 දී කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපල වෙත එල්ල වූ ප්‍රහාරයෙන් පසු හටගත් ආර්ථික පසු බෑමේ සිට සංස්ථානික සමාජයීය වගකීම් හා සෙසු සාම මැදිහත්වීම් අරබයා ව්‍යාපාරිකයන් අතර වඩ වඩා සංවාද සිදුවන්නට විය. මෙහි ප්‍රතිඵලයන් වශයෙන් පැන නැගුණු විවාදය නිසා තරමක මූලික ජයග්‍රහණ පැන නැගුණේය. සංස්ථානික සමාජයීය වගකීම පිළිබඳ වඩාත් පුළුල් කැපවීම, සාමය ගොඩ නැගීම, ගැටුමට අදාළව දේපල ගැන පුළුල් මහජනතාව සමග තම විපිලිසරයන් බෙදා හදා ගැනීම සම්බන්ධයෙන් ව්‍යාපාරය සතු අයිතිය හා වගකීම. මේ අතින් බලන විට, ශ්‍රී ලංකාව පළමුව සාමය සඳහා ව්‍යාපාර සන්ධානය සහ ගැටුම නිරාකරණයට මැදිහත් වීම සඳහා විවිධ පුද්ගලයන් විසින් දරන ලද උත්සාහයන් ආදී සියල්ල ප්‍රශංසා කටයුතු වේ. එසේ වුවද මෙම අධ්‍යයනය හා ආශ්‍රිත සම්මුඛ සාකච්ඡාවලින් පෙනී යන පරිදි ව්‍යාපාරිකයන්ට දිගින් දිගටම අභියෝග ගණනාවකට මුහුණ දෙන්නට සිදුවී ඇත්තේය. සාමය ගොඩ නැගීමේ කටයුතුවල යෙදීම සඳහා ව්‍යාපාර සතු හැකියාව, දේශපාලන පරිසරය හා සංස්කෘතිය යනුවෙන් මෙම අභියෝග පුළුල් වශයෙන් වර්ග කරන්නට පුළුවන.

## 4.1 ව්‍යාපාරමය හැකියාවන්

### 4.1.1 ව්‍යාපාරික සමාජ වගකීම හා සාමය ගොඩනැගීමට අදාළ සමාජමය වශයෙන් දැනුවත් ප්‍රවේශයන් දියුණු කිරීම

සමාජ අයුක්තීන් පැවතීම යනු තමන්ගේ මැදිහත්වීම අවශ්‍ය කරන ව්‍යුහමය ප්‍රශ්නයක් ලෙස ශ්‍රී ලාංකික ව්‍යාපාර විසින් නොසැලකේ. ඔවුන් මේ තත්වයට පිවිසෙන්නේ දානපති පිළිවෙළිනි. ප්‍රජාවන්ට වඩා පුද්ගලයන්ට ආධාර වීමෙනි. නැතහොත් ව්‍යුහයන්ට වඩා ප්‍රජාවන්ට ආධාර වීමෙනි. මේ කටයුතු අවශේෂ ස්ථානවල සිදු කෙරෙන, පුළුල් පරාසයකට අයත් විභව සාම මැදිහත් වීම් ඌන පූරණය කරයි. එහෙත් ඔවුන් එය කරන්නේ කඩින් කඩය. අක්‍රමවත් ලෙසය. මේ අරුතින් සලකන විට, ව්‍යාපාරමය සාම මැදිහත් වීම පැන නගින්නේ ගැටුම් ආශ්‍රිත ප්‍රශ්න පිළිබඳ ක්‍රමානුකූල අවබෝධයක් හෝ ගැටුම් පැන නැගීමට ඇති විභව ඉඩකඩ ජය ගැනීමේ ක්‍රමෝපායමය ප්‍රයත්නයන් හෝ තුළින් නොවේ. වෙනස්කම් කිරීම හා අයුක්තිය වැනි ව්‍යුහමය හේතූන් ගැටුමට පොළඹවන ප්‍රාථමික සාධක බව ව්‍යාපාරවලින් ඉතා විශාල කොටසකට පෙනෙන්නට තිබෙන හෙයින් එම තත්වය තරමක් පුදුම සහගතය. මේ කරුණ සිහියේ තබා ගෙන පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කෙරේ.

විවිධ අංශ සහිත සමාජයක පවත්නා වෙනස් ලෙස සැලකීම අයුක්තිය හා බල ජවයේ ව්‍යුහමය ස්වභාවය ගැන සංස්ථානික අංශයට තොරතුරු අධ්‍යාපනය සැලසීම. එබඳු අවබෝධය වගා දිගා කිරීම සඳහා උගතුන්, වෘත්තිකයන් හා ව්‍යාපාර අංශය අතර වැඩි වැඩියෙන් සබඳතා ඇති කිරීම. පුද්ගලයන් හා තෝරාගත් ප්‍රජාවන් ගම්මාන වෙනුවට සමාජ හා දේශපාලන ආයතන හා ඒවායින් සැපයෙන සේවා ගුණාත්මක වශයෙන් වෙනස් කිරීමට තුඩ දෙන අන්දමින් එම ආයතනවලට ක්‍රමෝපායමය හා පවත්වා ගත හැකි අයුරින් ආධාර කිරීමට ව්‍යාපාරයන් දිරිමත් කිරීම මෙය සපුරාලීම සඳහා සංස්ථානික සමාජයීය වගකීම පිළිබඳ නවතාවෙන් යුත් පුළුල් අදහස් ව්‍යාපාරවලට සපයන්නඃ ආශා කරන අන්දමේ සමාජයීය ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ඉතාමත් සුදුසු ආයතන තෝරා ගැනීමට ව්‍යාපාරවලට ආධාර වීම, මෙබඳු මැදිහත් වීම් ක්‍රියාත්මක කරනු පිණිස කාර්මික මාර්ගෝපදේශ සැපයීම.

ගැටුමට අදාළ ප්‍රශ්න හා ප්‍රාදේශීය මට්ටමේදී ගැටුම් මතුවීමට ඇති විභවතාව සම්බන්ධයෙන් තොරතුරු මූලාශ්‍ර ලෙස කටයුතු කිරීම සඳහා ප්‍රාදේශීය ව්‍යාපාර සතු විභව භූමිකාව ගැන ඒවායේ දැනුවත්කම ශක්තිමත් කරන්න.

### 4.1.2 ව්‍යාපාරික අංශයේ සාමූහික ක්‍රියාකාරීත්වය

ව්‍යාපාරික ප්‍රජාවගේ සිත් තැවුලට හේතුවන සමාජ ප්‍රශ්න පිළිබඳ සංස්කෘතිය හා සාමූහික ක්‍රමෝපාය කටයුතු පෙළඹවීම්වලට අදාළ ප්‍රවීණතාව අප්‍රමාණවත් අයුරින් ක්‍රියාත්මක වන

බව මේ අධ්‍යයනයෙන් අනාවරණය වේ. විවිධාකාර හා සාපේක්ෂ වශයෙන් ලාබාල ව්‍යාපාර අංශය තුළ ප්‍රතිපත්ති වෙනස් කිරීම සඳහා පෙළඹවීම සම්බන්ධ පුරුද්දක් නැතිවග හෝ වඩාත් ඵලදායක ලෙස පෙළඹවීම්වල නිරත වීමට අවශ්‍ය මිළ මුදල් හා යාන්ත්‍රණ රහිත බව ඉහත කරුණු තුළින් ඉඟිවේයයි සිතිය හැකිය. බෙදීම් අබිබවා එක්සත්කම ඉදි කිරීම හා පොදු පදනම් සොයා ගැනීම යන මේවා සඳහා ව්‍යාපාරයේ තරඟකාරී ස්වභාවය තුළින් දායක වනුයේද අහිතකර බලපෑමකි. මෙහි අනිවාර්ය ප්‍රතිඵලය වනුයේ දුබල, හුදෙකලා ව්‍යාපාරික සමූහ බිහිවීමයි.

ව්‍යාපාර මගින් ගැටුම් නිරාකරණය තුළ අවදානම්ද ගැබ් වී තිබේ. යෝජිත ෆෙඩරල් ක්‍රමය, අන්තර්පාලනයක් ගැන කොටි සංවිධානය සමග සාකච්ඡා කිරීම හා දූෂණය වැනි මතභේද සහිත ප්‍රශ්න පිළිබඳව සමාන අදහස් දරන එක්සත් ව්‍යාපාරික ප්‍රජාවන් ශ්‍රී ලංකාව තුළ කිසිදාක පැන නොනැගීමට ඉඩ තිබේ. එසේ වුවද ඒකමතික තීරණයක් අපේක්ෂා නොකර, විවිධ දුෂ්කරතා හා ඒවායේ යුක්තායුක්ත භාවය පිළිබඳව ව්‍යාපාරික ප්‍රජාව තුළ පොදු අවබෝධයක් ඇති කිරීම ඉතා වැදගත් වේ. දුෂ්කර ප්‍රශ්න මුණ ගැසෙන විට විවිධ මත පිළිගනිමින්, ගැටුම් නිරාකරණය සඳහා ව්‍යාපාරික ප්‍රජාවන්ට එක්වන්ව කටයුතු කළ හැකිවන අන්දමේ යාන්ත්‍රණයන් ඉදි කිරීම  මීට අයත් වේ.

- විශේෂයෙන්ම කොළඹ විශාල පරිමාණයේ ව්‍යාපාර අතර පොදු සමාජ ප්‍රශ්න හඳුනා ගැනීම හා ඒවා නිරාකරණය කිරීම සඳහා ක්‍රමවත් සැලසුම් සංවර්ධනය සඳහා ව්‍යාපාරික සම්මන්ත්‍රණ හා ජාලයන් ඇති කිරීමට දිරිදීම, මෙහිදී සංවර්ධන හා මිනිස් ශුභ සාධන ව්‍යාපෘති සැලසුම් ක්‍රමවේදයන් ප්‍රයෝජනවත් වන්නට ඉඩ තිබේ.
- තමන්ගේ මැදිහත් වීම් විමර්ශනය කොට ඒවායේ ප්‍රතිඵල අගැයීම සඳහා වඩා යහපත් බලපෑම් අගැයුම් හැකියාවන් ගොඩ නැගීමට ව්‍යාපාර දිරිමත් කිරීම.
- ඒකාබද්ධ කටයුතු හා පොදු දර්ශන සංවර්ධනය කර ගැනීම පිණිස ව්‍යාපාරික ජාලාවලින් ඔබ්බට ගොස් සෙසු සමාජයීය වශයෙන් දැනුවත් සමූහ සමග සම්බන්ධ වීමට ව්‍යාපාරවලට සහාය වීම, වෙනස් අදහස් උදහස් බලවත්කම් ආදියට මුණ දී සාකච්ඡා කිරීමේ හැකියාව ගොඩනගා ගැනීම සහ තනිවීමේ හෝ වැරදි ලෙස වටහා ගනු ලැබීමේ අනතුර අඩු කර ගැනීමද මීට අයත් වේ.
- තමන්ගේ කාර්යය ගැන මැනවින් දන්නා උනන්දුවක් දක්වන, ව්‍යාපාරිකයන්ගේ ප්‍රශ්න ගැනම වෙහෙසෙන වෘත්තීය සමූහ සමග වඩාත් යහපත් සබඳතා ගොඩනගා ගැනීමට අනුබල දීම.
- උදා:- විශ්වවිද්‍යාල පර්යේෂණ ආයතන, අධ්‍යාපන ආයතන, මානව හිමිකම් කොමිසම ආදිය. මේවා දේශපාලන වශයෙන් මධ්‍යස්ථ සමූහ නොවන්නට පුළුවන. එහෙත් පොදු ප්‍රශ්න මත කටයුතු කිරීමෙන් ඒවාට සහාය වීමට හෝ අනිත් අතට සහාය ලබා ගැනීමට ව්‍යාපාර අංශයට පුළුවන.
- සාමූහික සංස්ථානික කටයුතුවලට අදාළ මාර්ගෝපදේශ ගොඩ නැගීම. සාර්ථක ප්‍රයත්නයන් හෝ වැදගත් කටයුතු ලේඛනගත කිරීම ඊට නිදසුනකි.

### 4.1.3 තම සමාගම තුළ සැඟවී ඇති සාමය සඳහා දායකවිය හැකි හැකියාව හඳුනාගැනීම

වෘත්තීය සංවර්ධනය සහ අර්බුදවලට සහාය වීම ආශ්‍රිත කටයුතුවලදී ව්‍යාපාර ගණනාවක් විසින්, තම කාර්ය මණ්ඩලයට අදාළව සංස්ථානික සමාජයීය වගකීම ක්‍රියාත්මක කරන නමුදු තම කාර්ය මණ්ඩලය සමාජයීය වශයෙන් විවිධාකාර වුවත් භූගෝලීය වශයෙන් පැතිරී සිටියත් තම සමාගම තුළ සාමකාමී සංස්කෘතියක් ගොඩ නැගීම සඳහා පවත්නා ඉඩකඩ හඳුනා ගෙන තිබෙන සමාගම් ගණන ඉතා කුඩා බව පෙනේ. ජනගහණයෙන් සැලකිය යුතු කොටසක් වෙත සමීපවීමේ හැකියාව සේවායෝජකයන් හැටියට තමන් සතුව තිබීමේ වාසිය ව්‍යාපාරවලින් උපයෝගී කරගනු  නොලැබේ. කාර්යාලය හෝ සේවා ස්ථාන තුළ ප්‍රවර්ධනය කරනු ලබන සංස්කෘතිය තුළින් බහු සංස්කෘතික සමාජයක් සඳහා ඇප

කැපවීම පිළිබිඹු වෙනම්, සෑහෙන තරම් කාලයක් සේවා ස්ථානය තුළ ගත කරන අයටද එය බලපානු ඇත.

සමාගම් තුළ සාමය ගොඩ නැගීම තහවුරු කරනු සඳහා පහත සඳහන් කටයුතු නිර්දේශ කෙරේ.

- හැකිතාක් දුරට අන්තර් සමූහ සමාජ- සංස්කෘතික කටයුතු සහ හුවමාරුවලට දිරි දීම. නිදසුන: උත්සව දවස්, කර්මාන්ත ශාලා සැකසුම, නේවාසික පහසුකම් හා කැන්ටිමෙන් සැපයෙන ආහාර පාන යනාදිය ජනවාර්ගික, ආගාමික හා සමාජ වෙනස්කම් මත වෙන් කිරිමට නොව විවිධත්වය තුළින් සතුටු වීමේ අවස්ථාවක් කරගැනීම.

- කාර්යාලයීය චර්යාව සහ ආකල්ප පැහැදිලි කරදෙන චර්යා පද්ධතියක් ගොඩ නැගීම. සාමය ගොඩ නැගීමට අදාළ පොදු අවම ප්‍රමිති මාලාවක් සමාගම් සමූහයක් විසින් පනවනු ලැබේ නම් එය නිසා ප්‍රබල ප්‍රතිඵල ජනිත වන්නට ඉඩ තිබේ. බොහෝ විට මෙබඳු චර්යා පද්ධති මගින් කෙරෙන්නේ නොකළ යුතු දේවල් ගැන දැන්වීමය.(උදා: ලිංගික කවටකම්) එහෙත් ඒවා මගින් සමාජයීය වශයෙන් ඵලදායි චර්යාවන් වෙත මිනිසුන් යොමු කරවීමටද පුළුවන. බලතල පිළිබඳව දැනුවත්ව සිටීම හා සෙසු සංස්කෘති හා ප්‍රජාවන් ගැන උනන්දුවක් දැක්වීම එවැනි පියවර වේ.

- සමාජයීය වශයෙන් වඩාත් දැනුමැති සේවක බඳවා ගැනීම් ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම වාර්ගික නියෝජනය වඩාත් හොඳින් තහවුරු වනසුලු ප්‍රවේශයක් අනුගමනය කිරීමට ව්‍යාපාරයන් අදිමදි කරනු විය හැක. එහෙත්, ශ්‍රී ලංකාව තුළ උසස් තත්වයේ අධ්‍යාපනය වෙත පිවිසෙන ප්‍රවේශයන් තුළ එතරම් සාධාරණත්වයක් නොමැති නිසා ඉතාමත් සුදුසු අපේක්ෂකයා තෝරා ගනු ලැබෙන පරිදි උචිත අගැයීම් හා (සාමාන්‍යයෙන් තිබෙන ලකුණු අනුව තේරීමට පරිබාහිරව පුද්ගලික ක්‍රියාශූරත්වය මැන බැලීම වැනි) අවශේෂ විධි භාවිතා කිරීමට ඉඩ තිබේ.

- මහජන හා ගනුදෙනු කාර සබඳතා වඩාත් හොඳින් භාවිතයට ගැනීම. විවිධ වර්ග සිටින සමාජයක් පිළිබඳ මහජන දැනුවත්කම ගොඩ නැගීම සඳහා ආධාරවන ක්‍රම මෙසේය: භාෂා තුනෙන්ම වෙළඳ ප්‍රචාරණය කිරීම තුළින් ශ්‍රී ලංකාවේ විවිධත්වය පිළිබිඹු කිරීම: මාධ්‍ය ප්‍රචාරණයේදී විරාගත පිළිවෙළේ ග්‍රාමීය වාර්ගික හෝ ආගමික සමූහ නිරූපණයෙන් වැළකී සිටීම, වාර්ගික සෑම කණ්ඩායම් හෝ භූගෝලීය වශයෙන් දූරස්ථ ප්‍රජාවන්ගේ ජීවන යථාර්ථයන් පිළිබඳ සංවේදීතාව තහවුරු කිරීම.

### 4.1.4 සාමය පිළිබඳ කතාවලින් ඔබ්බට යෑම

සාමය ගොඩ නැගීමට කැපවීම සඳහා ව්‍යාපාර වෙතින් සාමයට පක්ෂපාතී වීමට වැඩි දෙයක් අපේක්ෂා කෙරේ. දේශපාලන හා සමාජයීය වශයෙන් ක්‍රියාශීලීව සිටීමට නොව "සිහි ඇතිව" සිටීමට ඒවා බොහෝ ව්‍යාපාර අදිමදි කරන බව පෙනේ. සංස්ථානික සමාජයීය වගකීම් වැඩ සටහන් අරමුණු වශයෙන් ව්‍යුහමය නොවිය යුතු අතර, ඒවා "දානශීලී" පමණක් විය යුතුයයි සමහරු කියා සිටිති. ශ්‍රී ලංකාව වැනි තදින් හා ප්‍රචන්ඩ ලෙසින් "දේශපාලනකරණය" වී සිටින රටක පමණක් නොව ඕනෑම සමාජයක් තුළ දේශපාලන බලයට හිමිව තිබෙන තැන ගැන සලකනවිට කිසියම් අවදානමක් රහිතව මෙය කළ හැක්කේ කෙසේදැයි සිතා ගැනීම අපහසුය. ඉලක්ක ගත සමූහයන් හෝ පුද්ගලයකු වෙනුවෙන් කෙරෙන දායකත්වයක් හෝ මැදිහත්වීමක් වේ නම් ඉන් අදහස් වන්නේ සෙසු අය අත්හැර තිබෙන බවයි. මෙය වරදවා විවරණය වීමට පුළුවන. එහෙත් විශාල වෙනසක් අවශ්‍ය වේ නම්, එය මුහුණ පෑ යුතු අවදානමක් වේ.

මෙම සන්දර්භය යටතේ පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කෙරේ.

- සියලුම සංස්ථානික සමාජ වගකීම් කටයුතුවල දේශපාලන අංශ පවත්නා බව සංස්ථානික අංශයට දැන්වීම.

- උතුරේ හා නැගෙනහිරදිග ගැටුම් සහිත ප්‍රදේශවලට ව්‍යාපාර ආපසු ගෙන ඒම පිණිස පවත්නා අවස්ථා සොයා ගැනීම ආරක්ෂක අවදානම් ගැන සලකන විට පළමුවෙන්ම මෙය සපුරාගත හැක්කේ පවත්නා ප්‍රාදේශීය ව්‍යාපාරවලට සහාය සැපයීම ඇසුරෙනි.

- කෘෂිකාර්මික හා ධීවර අංශයේ සංවර්ධනය සඳහා අඩු අවධානමක් සහිත තාක්ෂණවේදය හා යටිතල පහසුකම් සංවර්ධනය හා මේ ව්‍යාපාර සඳහා වඩා යහපත් මූල්‍ය සැපයුම් අවස්ථා සැපයීම වැනි කටයුතු මීට අයත් වේ.
- සාපේක්ෂ වශයෙන් වඩා හොඳින් ආරක්ෂිත ව්‍යාපාරවලට පක්ෂවලට සම්බන්ධයක් නැතිව, එහෙත් සැමටම සමාජ සාධාරණත්වය ඉටු කිරීමේ අවශ්‍යතාව උදෙසා මාර්ග සොයාගත හැකි ගැටුම් සහිත ප්‍රදේශවල කටයුතු කිරීමේලා ව්‍යාපාරවලට මුහුණදීමට සිදුවන පවත්නා අන්තරාවන් හඳුනා ගැනීම.
- විශේෂඥහැකියාවන් සංවර්ධනය කිරීම. ප්‍රාදේශීය ජනතාවද උසස් වීමේ අවස්ථාවලින් ප්‍රතිලාභ ලැබෙන ගණකාධිකාරී ආයතන වැනි ප්‍රාදේශීය විශේෂඥහැකියා සංවර්ධනය

## 4.2 දේශපාලන පරිසරය හා සංස්කෘතිය

### 4.2.1 දේශපාලන අස්ථාවරභාවය ඉලක්කකර ගැනීම

මෑත වසර තුළදී ශ්‍රී ලංකාවේ පැවති දේශපාලන අස්ථාවරභාවය එහි ගැටුම අබිබවා ගිය අංගයක් වී තිබේ. මේ තත්වය බොහොමයක් ව්‍යාපාරවල හා මහජනයාගේ පිළිකුලට ලක්වී ඇතත්, දේශපාලන අස්ථාවරත්වයට දායක වන සාධක නිරාකරණය කරන්නේ කෙසේදැයි වටහා ගැනීමට උනන්දු වන්නේ ඉතා සුළු පිරිසක් බව පෙනීයයි. තමන්ගේම ව්‍යාපාරවල ව්‍යාපෘතිය වෙත එය සෘජු ලෙස බලපාන විට පවා, දිර්ඝකාලීන සැලසුම් න්‍යාය පත්‍රයක් ඉල්ලා සිටීමට හෝ පුද්ගලික අංශය ගැන මහජනයා තුළ පවත්නා අහිතකර අවබෝධය අහෝසි කරන ඉතාම යහපත් අන්දම තීරණය කරනු සඳහා සංවාදයක් ඉල්ලා සිටීමට හෝ ප්‍රමාණවත් තරම් අධිෂ්ඨාන ශක්තියක් පුද්ගලික අංශය තුළ තිබෙන සැටියක් පෙනෙන්නට නැත.

අදාළ නිර්දේශ මෙසේය:

- කපටි ව්‍යාපාරික කටයුතු ගැන මහජනයාගේ සිත් තුළ පවත්නා බිය සැක දුරු කරන්න. සංස්ථානික වගකීම් සහිත පාලනයට අදාළ ප්‍රශ්න ගැන මහජනයාට අධ්‍යාපනය ලබා දීමට, වඩාත් විනිවිදභාවයෙන් යුත් මිල නියම කිරීම් යාන්ත්‍රණ ඉදිරි කිරීමට හා සංස්ථානික අංශය හා දේශපාලන න්‍යාය පත්‍ර අතර දුර ප්‍රමාණය වැඩි කිරීමට ව්‍යාපාරවලට පුළුවන.
- තම තමන්ගේ ප්‍රතිපත්ති තුළ පුද්ගලික අංශයෙන් අපේක්ෂිත අරමුණ හා භූමිකාව ගැන දේශපාලන පක්ෂ සියල්ලම සමග සංවාදයක් ඇරඹීම. ව්‍යාපාර වර්ධනය හා ජාතික සංවර්ධනය සඳහා විධිමත් හා එහාමෙහා නොපැද්දෙන ප්‍රතිපත්තියක් ඉල්ලා සිටීම.
- ගැටුම නිසා පැන නගින ආර්ථික හානි සහ වර්ධන සීමා පිළිබඳව මහජනයාට අධ්‍යාපනයක් ලබා දීම, සමාජ යහපතට අදාළව එහි වැදගත්කම ආතතිය වඩාත් උග්‍ර ලෙස පවත්නා, නීතියට හා සාමයට බාධා කිරීම් වඩාත් දරුණු ප්‍රදේශවල මේ කටයුතු වඩාත් දුෂ්කර බව පිළිගැනීම

### 4.2.2 සියල්ලම දේශපාලනීකරණය කිරීම

ශ්‍රී ලංකාවේ කටයුතු හා ප්‍රශ්න වැඩි වැඩියෙන් දේශපාලනකරණයට භාජන වෙමින් පවත්නේයයි ව්‍යාපාරවලින් පිළිගැනේ. සාධාරණත්වය හා යුක්තිය වෙනුවෙන්ද අන් මත නොඉවසන, අන්තවාදී බලවේගවලට එරෙහිවද කටයුතු කිරීම සඳහා පවතින ඉඩකඩ එයින් සීමාවී යයි. මේ ප්‍රශ්නය තමන් වෙත කෙලින්ම බලපාන විට පවා එයට මැදිහත් වීමට ව්‍යාපාර අකමැති බව පෙනේ. මෙම ප්‍රශ්නවලට කෙලින්ම මුහුණ නොපාමින් ඒවාට හේතු සාධකවන දේවල් නිරාකරණය කිරීමට පුළුවන් විය හැකිය.

දැනට පවත්නා "දේශපාලනකරණ" නැඹියාව බිඳ දැමීම පිණිස පහත සඳහන් පියවර ආධාර වන්නට ඉඩ තිබේ.

- පුවත්පත් කලාවේදීන් සඳහා සුදුසු අභ්‍යාස ආයතනයක් ගොඩ නැගීමට සහාය වීම ආචාරධර්මීය පුවත්පත් කලාව හඳුනා ගැනීම/දිරිදීම.
- උද්වේගකර නොවන, විෂය බද්ධ සමතුලිත වාර්තා ප්‍රමිතීන් අනුගමනය කිරීම සඳහා මාධ්‍යයන්ට බල කිරීම පිණිස ව්‍යාපාරික බලපෑම් භාවිතය.
- වගකීම් සහිත මනාපාලනය ගැන මහජනයාට අධ්‍යාපනයක් ලබාදීම.
- කපටි දේශපාලනඥයන්ගේ කෙටිකාලීන න්‍යාය පත්‍ර මගහැරීමට සමත්, දේශපාලන වශයෙන් වඩාත් පරිණත මහජනයාට අධ්‍යාපනය සැලසීම සඳහා මහජන තොරතුරු සැපයුම් ද්‍රව්‍ය සංවර්ධනය.

### 4.2.3 ප්‍රචණ්ඩත්වයේ පැතිකඩ

දැඩි අවදානමක් සහිත ප්‍රදේශවල තිබෙන ව්‍යාපාරවල කාර්ය මණ්ඩලය සහ දේපලවල ආරක්ෂාව වෙත එල්ල වන තර්ජන ඇතැයි ව්‍යාපාර ඉතා වැඩි කොටසක් විසින් පිළිගැනේ. ගැටුම් පවත්නා පෙදෙස්වල කටයුතු කරන ව්‍යාපාර සම්බන්ධයෙන් මේ තර්ජනය තවත් දැඩි වෙයි. කුමක් නිසාදයත්, දේශපාලන වශයෙන් ක්‍රියාත්මක හෝ සංවර්ධන/සාම කටයුතුවල යෙදෙන්නන් වෙතින් වඩාත් දරුණු ප්‍රතිඵල එන්නට ඉඩ ඇති නිසාත් එවැනි කටයුතුවල යෙදෙන ව්‍යාපාරයන් ආරක්ෂා කරගැනීම සඳහා නිර්නාමිකව හෝ සාමූහික ප්‍රයත්නයක් මගින් හෝ කිසියම් පිළිවෙළක් සකස් කර ගැනීම ඉතා වැදගත් වේ. වෘත්තීය හා සංස්ථානික අංශයේ අය විසින් ඒකාබද්ධව පවත්වාගෙන යන ව්‍යාපාර හා සාම පදනමක් පිහිටුවීම එක් අදහසකි. මෙය උතුරු හා නැගෙනහිර පෙදෙස්වල භාවිතා කළ හැකිය. මේ සඳහා අවශ්‍ය කරන කෙටිකාලීන සරල කටයුතුවල නියැලීමට ඇතැම් ව්‍යාපාර සතුටු වුවත් සෙසු අය අකමැති වීමට ඉඩ ඇත්තේය.

අවසාන වශයෙන්, විවිධ හේතු ගණනාවක් නිසා, තමන්ගේ කටයුතුවල සීමා ඇතුළත සමාජ වගකීම පිළිබඳ ඔවුන්ගේ ප්‍රඥප්තිය පිළිගෙන එය ක්‍රියාත්මක කිරීම ගැන ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන් දැඩි උනන්දුවක් දක්වන බව මෙම අධ්‍යයනයෙන් පෙනේ. ව්‍යාපාරික ව්‍යාප්තිය සඳහා වඩාත් විශාල අවස්ථා නිර්මාණය ගැටුම නිසා සිදුවී ඇති ආර්ථික පාඩු පියවා ගැනීම, ව්‍යාපාරය සතු සමාජයීය දානපති භූමිකාව පිළිබඳ විශ්වාසය හා මහජන සබඳතාවලදී සංස්ථානික සමාජයීය වගකීම උපකරණයක් ලෙස භාවිතා කිරීමේ සංකල්පය ආදිය ඒවාට ඇතුළත් විය. බොහෝ දෙනෙක් දැනටමත් සාමය ගොඩ නැගීමට හා ගැටුම් වළක්වා ලීමට දායක වීමේ අරමුණු සහිත කටයුතුවල යෙදී සිටිති. ප්‍රධාන ව්‍යාපාරමය කටයුතු, සමාජයීය ආයෝජන හා ප්‍රතිපත්ති සංවාදය ඇතුළත් මේවා ඉතා විවිධය.

# ආශ්‍රිත ලිපි ලේඛන

Arunatilake, N., Jayasuriya, S. and Kelegama, S. (2000) 'The Economic Cost of the War in Sri Lanka' (Colombo, Sri Lanka: Institute of Policy Studies).

Central Bank of Sri Lanka (2005) *Annual Report 2004* (Colombo, Sri Lanka: Central Bank of Sri Lanka).

Central Bank of Sri Lanka (1998) 'Economic Progress of Independent Sri Lanka' (Colombo, Sri Lanka: Central Bank of Sri Lanka).

Department of Census and Statistics (2004) *Bulletin of Labour Force Statistics*, 3rd and 4th Quarter 2004 (Colombo, Sri Lanka: Department of Census and Statistics).

Department of Census and Statistics (2004) Census of Industries (Colombo, Sri Lanka: Department of Census and Statistics).

Department of Census and Statistics (2003) Sri Lanka Statistical Data Sheet (Colombo, Sri Lanka: Department of Census and Statistics).

Federation of Chambers of Commerce and Industries of Sri Lanka (FCCI) (2005) *Regional Business Directory* (Colombo, Sri Lanka: FCCI).

Ferdinands, T. et al (2004) 'The Sri Lankan Peace Process at Crossroads: Lessons, Opportunities and Ideas for Principled Negotiations and Conflict Transformation (Colombo, Sri Lanka: Berghof Foundation).

Galappatti, A. and Salih, M. (2003) 'Integrating Poverty Reduction and Psycho-social Support Interventions in Conflict Zones', in *Poverty Research in Sri Lanka: Towards New Empirical Insights. Proceedings of the Third Annual Symposium on Poverty Research* (Colombo, Sri Lanka: CEPA/IMCAP/SLAAS).

Government of Sri Lanka (GoSL) (2003) 'Regaining Sri Lanka: Vision and Strategy for Accelerated Development' (Colombo, Sri Lanka: GoSL).

Gunaratne, R. (2003) 'Sri Lanka: Feeding the Tamil Tigers', in Ballentine, K. and Sherman, J. (eds.), *The Political Economy of Armed Conflict: Beyond Greed and Grievance* (New York, US: Lynne Rienner).

Gunatilleka, G. (2001) 'Cost of War: Economic, Social and Human Cost of the War in Sri Lanka' (Colombo, Sri Lanka: Marga Institute).

Hettige, S.T., Mayer, M. and Salih, M. (2004) 'School-to-Work Transition of Youth in Sri Lanka', Employment Strategy Paper (Geneva, Switzerland: International Labour Organisation).

Hopkins, M. and Crowe, R. (2004) 'Corporate Social Responsibility: Is there a Business Case?' (London, UK: Association of Chartered Certified Accountants).

International Alert (2005) 'Peace Through Profit: Sri Lankan Perspectives on Corporate Social Responsibility' (Colombo, Sri Lanka: International Alert).

Institute for Policy Studies (IPS) (2003) 'Sri Lanka: State of the Economy' (Colombo, Sri Lanka: IPS).

Jayasuriya, L. (2000) *Welfarism and Politics in Sri Lanka: Experiences of a Third World Welfare State* (Perth, Australia: University of Western Australia).

Kievelitz, U. and Schell-Faucon, S. (2005) 'Conflict-Sensitive Humanitarian Action in the Event of Rapid Onset Emergencies in Conflict-prone or -affected Areas: The Case of the Tsunami Disaster and Aid Responses in Sri Lanka and Indonesia', unpublished concept note prepared by GTZ on behalf of BMZ for DAC-CPDC.

Killick, N., Srikantha, V. S. and Gündüz, C. (2005) 'The Role of Local Business in Peacebuilding' (Berlin, Germany: Berghof Research Center for Constructive Conflict Management).

Lakshman, W.D. (2002) 'A Holistic View on Youth Unemployment in Sri Lanka', in Hettige, S.T. and Mayer, M. (eds.) 'Sri Lankan Youth: Challenges and Responses (Colombo, Sri Lanka: Friedrich Ebert Stiftung).

Loveman, M. (1998) 'High-Risk Collective Action: Defending Human Rights in Chile, Uruguay and Argentina', in *American Journal of Sociology*, Vol 104, No. 2.

Mayer, M. (2004) 'Re-interpreting Ethnic Tensions in Sri Lanka: The Impact of Social Discrimination on Youth and Violent Conflict', in Hussein, A. (ed.) 'Race: Identity, Caste and Conflict in the South Asian Continent' (Colombo, Sri Lanka: International Centre for Ethnic Studies).

Mayer, M. (2002) 'Violent Youth Conflicts in Sri Lanka: Comparative Results from Jaffna and Hambantota' in Hettige, S.T. and Mayer, M. (eds.) *Sri Lankan Youth: Challenges and Responses* (Colombo, Sri Lanka: Friedrich Ebert Stiftung).

Mayer, M., Rajasingham-Senanayake, D. and Thangarajah, Y. (eds.) (2002) *Local Capacities for Peace: Rethinking Conflict and Development in Sri Lanka* (New Delhi, India: Macmillan).

Perera, S. (1999) 'Stories of Survivors: Socio-Political Contexts of Female-headed Households in Post-terror Southern Sri Lank' Vol. 1 (Colombo, Sri Lanka: Women's Education and Research Centre).

Samarasinghe, G. and Galappatti, A. (1999) Unpublished Report on the PSE Survey and the Exploratory Phase of the War-trauma and Psycho-social Support Programme, International War-Trauma and Humanitarian Intervention Trust, Sri Lanka.

Sarvananthan, M. (ed.) (2005) 'Economic Reforms in Sri Lanka: Post-1977 Period' (Colombo, Sri Lanka: International Centre for Ethnic Studies).

Steele, P. (2005) 'Phoenix from the Ashes? Economic Policy Challenges and Opportunities for Post-Tsunami Sri Lanka' (Colombo, Sri Lanka: Institute of Policy Studies).

Thangarajah, Y. (2003) 'Ethnicization of the Devolution Debate and the Militarisation of Civil Society in Northeastern Sri Lanka' in Mayer, M., Rajasingham-Senanayake, D. and Thangarajah, Y. (eds.) *Building Local Capacities for Peace: Rethinking Conflict and Development in Sri Lanka* (New Delhi, India: Macmillan).

World Bank (2002) 'Sri Lanka Poverty Assessment' (Colombo, Sri Lanka: Poverty Reduction and Economic Management Sector Unit, South Asia).

# අවසාන සටහන්

ව්‍යාපෘතිය හා අවසාන ලේඛනය සම්පූර්ණ කිරීම සඳහා තමන්ට සපයන ලද දායකත්වය ගැන කර්තෘවරු පහත සඳහ අයට ස්තුතිවන්ත වෙති.

ජැනිස් හැකල් රණසිංහ: මේ ව්‍යාපෘතිය සම්බන්ධීකරණය, පරිපාලන අධීක්ෂණය එහි මූල්‍යමය හා ලේකම් සේවා කළමනාකරණය සහ ඇගේ සියලු කටයුතු උද්‍යෝගයෙන් යුතුව ඉටු කිරීම. ඇගේ සහාය සහ කැපවීම රහිතව මෙම පර්යේෂණය නොකළ හැකිව තිබුණේය. රොෂෙල් හැකල් රණසිංහ: බොහොමයන් සම්මුඛ සංවාද මෙහෙයවා වාර්තාගත කිරීම, සාගර චන්ද්‍රසේකර: ප්‍රමාණාත්මක සමීක්ෂණ කණ්ඩයාමට මග පෙන්වීම හා සම්බන්ධීකරණය සහ ප්‍රමාණාත්මක දත්ත ඇතුළු කිරීම හා විශ්ලේෂණය ඉන්ටර්නැෂනල් ඇලර්ට්: ශ්‍රී ලංකාවේ ව්‍යාපාර හා සාමය සඳහා මැදිහත් වීම ගැන පර්යේෂණ පැවැත්වීමේ අවස්ථාවක් සැපයීම සඳහා

අවසාන වශයෙන්, මෙම අධ්‍යයනයට හවුල් වූ සමාගම් පිළිබඳව කර්තෘවරු සිය අගැයීම ප්‍රකාශකර සිටිති. මෙහිදී තමන්ගේ වැඩ කටයුතුවලින් මෑත්ව පර්යේෂණ කණ්ඩායම සමග සිය අත්දැකීම් හා අදහස් උදහස් බෙදාහදා ගැනීම පිණිස කාලය මිඩංගු කළ එම සමාගම්වල ප්‍රධාන නිලධාරීන් ගැන මෙහිදී විශේෂයෙන් සඳහන් කෙරේ. සහභාගී වූ සියලු දෙනාම සපුරා ගැනීමට ආශා කළ සාම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යෑම සඳහා අදාළ සියලු පාර්ශ්වයන්ගේ ඒකාබද්ධ ප්‍රයත්නයක් ගොඩ නගා ගැනීම සඳහා මේ වාර්තාවේ සොයා ගැනීම් හා නිර්දේශ දායක වේයයි අපි බලාපොරොත්තු වෙමු.

1 International Alert (2005): 'Peace Through Profit: Sri Lankan Perspectives on Corporate Social Responsibility' (Colombo, Sri Lanka: International Alert); Killick, N., Srikantha, V. S. and Gündüz, C. (2005) *The Role of Local Business in Peacebuilding* (Berlin, Germany: Berghof Research Center for Constructive Conflict Management).

2 Central Bank of Sri Lanka (2005) *Annual Report 2004*. (Colombo, Sri Lanka: Central Bank of Sri Lanka).

3 Jayasuriya, L. (2000): *Welfarism and Politics in Sri Lanka: Experiences of a Third World Welfare State* (Perth, Australia: University of Western Australia).

4 Perera, S. (1999) 'Stories of Survivors: Socio-Political Contexts of Female-headed Households in Post-Terror Southern Sri Lanka', Vol. 1 (Colombo, Sri Lanka: Women's Education and Research Centre).

5 Mayer, M. (2002) 'Violent Youth Conflicts in Sri Lanka: Comparative Results from Jaffna and Hambantota' in Hettige, S.T. and Mayer, M. (eds.) *Sri Lankan Youth: Challenges and Responses* (Colombo, Sri Lanka: Friedrich Ebert Stiftung).

6 Thangarajah, Y. (2003) 'Ethnicization of the Devolution Debate and the Militarisation of Civil Society in Northeastern Sri Lanka' in Mayer, M., Rajasingham-Senanayake, D., and Thangarajah, Y. (eds.) *Building Local Capacities for Peace: Rethinking Conflict and Development in Sri Lanka* (New Delhi, India: Macmillan).

7 Samarasinghe, G. and Galappatti, A. (1999) Unpublished Report on the PSE Survey and the Exploratory Phase of the War-trauma and Psychosocial Support Programme of the International War-Trauma and

Humanitarian Intervention Trust (IWTHI), Sri Lanka; and Galappatti, A. and Salih, M. (2003) 'Integrating Poverty Reduction and Psycho-social Support Interventions in Conflict Zones', in *Poverty Research in Sri Lanka: Towards New Empirical Insights. Proceedings of the Third Annual Symposium on Poverty Research* (Colombo, Sri Lanka: CEPA/IMCAP/SLAAS)

8 Loveman, M. (1998) 'High-Risk Collective Action: Defending Human Rights in Chile, Uruguay and Argentina', in *American Journal of Sociology*, Vol. 104, No. 2.

9 Arunatilake, N., Jayasuriya, S. and Kelegama, S. (2000) *The Economic Cost of the War in Sri Lanka*. (Colombo, Sri Lanka: Institute of Policy Studies); and Gunatilleka, G. (2001): *Cost of War: Economic, Social and Human Cost of the War in Sri Lanka*. (Colombo, Sri Lanka: Marga Institute).

10 Sarvananthan, M. (ed.) (2005) *Economic Reforms in Sri Lanka:Post-1977 Period* (Colombo, Sri Lanka: International Centre for Ethnic Studies).

11 Kievelitz, U. and Schell-Faucon, S. (2005): 'Conflict-Sensitive Humanitarian Action in the Event of Rapid Onset Emergencies in Conflict-prone or -affected Areas: The Case of the Tsunami Disaster and Aid Responses in Sri Lanka and Indonesia', unpublished Concept Note prepared by GTZ on behalf of BMZ for DAC-CPDC.

12 Steele, P. (2005) 'Phoenix from the Ashes? Economic Policy Challenges and Opportunities for Post-Tsunami Sri Lanka', Institute of Policy Studies (IPS) Working Paper No. 7 (Colombo, Sri Lanka: IPS).

13 Kievelitz and Schell-Faucon, op. cit; Steele, op. cit.

14 Sarvananthan, op. cit.

15 Central Bank of Sri Lanka, op. cit.

16 Ibid.

17 Ibid.

18 Ibid.

19 Department of Census and Statistics (2004) *Annual Report 2004* (Colombo, Sri Lanka: Department of Census and Statistics).

20 Ibid.

21 GoSL Lanka (2003) 'Regaining Sri Lanka: Vision and Strategy for Accelerated Development' (Colombo, Sri Lanka: GoSL).

22 Lakshman, W.D. (2002) 'A Holistic View on Youth Unemployment in Sri Lanka', in Hettige and Mayer, op. cit.

23 Central Bank of Sri Lanka, op. cit.

24 Mayer, M. (2004) 'Re-interpreting Ethnic Tensions in Sri Lanka: The Impact of Social Discrimination on Youth and Violent Conflict', in Hussein, A. (ed.) *Race: Identity, Caste and Conflict in the South Asian Continent* (Colombo, Sri Lanka: International Centre for Ethnic Studies).

25 Sarvananthan, op.cit.

26 Arunatilake, Jayasuriya and Kelegama, op. cit.

27 Gunaratne, R. (2003) 'Sri Lanka: Feeding the Tamil Tigers', in Ballentine, K. and Sherman, J. (eds.) *The Political Economy of Armed Conflict: Beyond Greed and Grievance* (New York, US: Lynne Rienner).

[28] International Alert (2005) *Peace through Profit: Sri Lankan Perspectives on Corporate Social Responsibility* (London, UK: International Alert)

[29] *Lanka Monthly Digest*, December 2004.

[30] International Alert (2005), op. cit.

[31] *Claude Perer, President of the Chartered Institute for Management Accountants (CIMA), cited in Lanka Monthly Digest, December 2004.*